ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දසවැනි පාර්ලිමේන්තුවේ

පළමුවැනි සභාවාරය

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 487**

# රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

# සිව්වැනි වාර්තාව

(2023.11.01 සිට 2024.01.26 දක්වා සිදු කරන ලද විමර්ශන)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී
ගරු කබීර් හෂීම් මහතා විසින්
2026 මාර්තු මස 06 වැනි දින ඉදිරිපත් කරන ලදී.

*2026 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.*

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) හි පහත පරිදි දක්වා ඇත:-

***"පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර ආමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට අරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය."***

## නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය
## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය
*(වාර්තාවේ සඳහන් කාලසීමාව තුළ)*

1. ගරු ලසන්ත අලගියවන්න මහතා, පා.ම. (කාරක සභාවේ සභාපති)
2. ගරු නිමල් ලන්සා මහතා, පා.ම.
3. ගරු ප්‍රසන්න රණවීර මහතා, පා.ම.
4. ගරු කේ. කාදර් මස්තාන් මහතා, පා.ම.
5. ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා, පා.ම.
6. ගරු ඩයනා ගමගේ මහත්මිය, පා.ම.
7. ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
8. ගරු එස්. බී. දිසානායක මහතා, පා.ම.
9. ගරු තිස්ස අත්තනායක මහතා, පා.ම.
10. ගරු වජිර අබේවර්ධන මහතා, පා.ම.
11. ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා, පා.ම.
12. ගරු කබීර් හෂීම් මහතා, පා.ම.
13. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.
14. ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා, පා.ම.
15. ගරු විමලවීර දිසානායක මහතා, පා.ම.
16. ගරු නිරෝෂන් පෙරේරා මහතා, පා.ම.
17. ගරු ජේ. සී. අලවතුවල මහතා, පා.ම.
18. ගරු වඩිවේල් සුරේෂ් මහතා, පා.ම.
19. ගරු අශෝක් අබේසිංහ මහතා, පා.ම.
20. ගරු බුද්ධික පතිරණ මහතා, පා.ම.
21. ගරු ජයන්ත කැටගොඩ මහතා, පා.ම.
22. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම. (2023.04.25 දින සිට)
    ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම. (2023.04.24 දින දක්වා)
23. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
24. ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා, පා.ම.
25. ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා, පා.ම.
26. ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය, පා.ම. (2023.03.07 දින සිට)
27. ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා, පා.ම.
28. ගරු ඩී. වීරසිංහ මහතා, පා.ම.
29. ගරු වීරසුමන වීරසිංහ මහතා, පා.ම. (2023.04.25 දින සිට)
    ගරු හේෂා විතානගේ මහතා, පා.ම. (2023.04.24 දින දක්වා)
30. ගරු මංජුලා දිසානායක මහත්මිය, පා.ම. (2023.03.07 දින සිට)
31. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය, පා.ම.

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය

1. ගරු කබීර් හෂීම් මහතා, පා.ම. (කාරක සභාවේ සභාපති)
2. ගරු ඇන්ටන් ජයකොඩි මහතා, පා.ම.
3. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා, පා.ම.
4. ගරු සුගත් තිලකරත්න මහතා, පා.ම.
5. ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා, පා.ම.
6. ගරු නලින් හේවගේ මහතා, පා.ම.
7. ගරු අරවින්ද සෙනරත් මහතා, පා.ම.
8. ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා, පා.ම.,
9. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
10. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
11. ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම.
12. ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
13. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
14. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම.
15. ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා, පා.ම.
16. ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය, පා.ම.
17. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම.
18. ගරු කේ. ඉලංකුමාරන් මහතා, පා.ම.
19. ගරු ඔෂානි උමංගා මහත්මිය, පා.ම.
20. ගරු අජන්ත ගම්මැදගේ මහතා, පා.ම.
21. ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම.
22. ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
23. ගරු ටී.කේ. ජයසුන්දර මහතා, පා.ම.
24. ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා, පා.ම.
25. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා, පා.ම.
26. ගරු ලාල් ප්‍රේමනාත් මහතා, පා.ම.
27. ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
28. ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම.
29. ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම.
30. ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා, පා.ම.

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය</u>**

- සනත් විජේගුණවර්ධන මහතා - කාරක සභා ලේකම්/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
- ඩී. සී. එස්. රූපසිංහ මිය - ප්‍රධාන නිලධාරී
- ආර්.ඒ.ඩී.එන්. ගියෝවනී මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී
- ජේ.ටී.එල්.පී. සමීර මයා - සහකාර ප්‍රධාන නිලධාරී
- ජී.ඩී.ජේ.එච්. අයේෂ්මන්ති මෙය - පාර්ලිමේන්තු නිලධාරී
- ජී.එම්. කල්ලෑගොඩ මිය - පාර්ලිමේන්තු නිලධාරී
- එම්. එල්. ඒ. ඩී. එම්. කුමාරි මෙය - පාර්ලිමේන්තු නිලධාරී

**<u>කාරක සභා වාර්තා</u>**

**www.parliament.lk** යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා බා ගත කර ගැනීමට හැක.

Select language → Business of Parliament → Committees
→ Committee Reports → Select Legislature (10th Parliament)
→ Select Session (1st Session) → Select Committee Type
→ (Comittees for Special Purposes) → Select Committee
→ (Committee on Public Accounts) → Search

# පටුන

පිටු අංකය

**අ.** සභාපතිවරයාගේ සටහන ........ 7

ආ. සංක්ෂිප්ත වාර්තාව ........ 8

ඇ. විශේෂිත නිරීක්ෂණ ........ 11

ඈ. විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු ,නිරීක්ෂණ, නිර්දේශ / නියෝග ........ 12

ඉ. සූචිය ........ 174

## සභාපතිවරයාගේ සටහන

නව වැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2023.11.01 දින සිට 2024.01.26 දින දක්වා සිදු කරන ලද විමර්ශන ඇතුළත් කාරක සභාවේ සිව්වැනි වාර්තාව මෙලෙස ඉදිරිපත් කරමි. විගණනය නමින් හැඳින්වෙන පශ්චාත් ක්‍රියාවලියේදී හඳුනාගත් දුර්වලතාවලට විසඳුම් ලබා දෙන අතරම, අකාර්යක්ෂමතාවයන් සක්‍රියව වැලැක්වීම වඩාත් ප්‍රතිඵලදායක වන බැවින් අනාගතයේදී අතීත අඩුපාඩු වළක්වා ගැනීමට ආයතනවලට මඟ පෙන්වීම කෙරෙහි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වැඩි අවධානයක් යොමු කරන බව මෙහිලා සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, මේවන විට, රාජ්‍ය ආයතන පාර්ලිමේන්තුවට කැඳවා විමර්ශනය කිරීමට සමගාමීව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය ඔස්සේ සියලු රාජ්‍ය ආයතන වාර්ෂිකව ඇගයීමේ ක්‍රියාවලියද සාර්ථකව සිදු කරගෙන යන බව සඳහන් කරමි. මෙමගින් කාරක සභා විමර්ශනයන් වඩා යාවත්කාලීනව සිදු කිරීමට හැකිවන අතර ආයතනවල පවතින දුර්වලතා හා අඩුපාඩු හඳුනාගෙන කාලීන වශයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ මගින් ඒවා නිවැරදි කරගැනීමට මගපෙන්වීමටත් අවස්ථාව සැලසෙන බව මාගේ අදහසයි.

ආයතන විමර්ශනය කිරීමේදී හඳුනාගත් අඩුපාඩු හා වැරදි නිවැරදි කර ගැනීමටත්, පවතින ධනාත්මක ගති ලක්ෂණ සහ ප්‍රවණතා වැඩි දියුණු කිරීමටත්, කාරක සභා රැස්වීම් මෙහෙයවීමේදී රාජ්‍ය නිලධාරීන්ගේ ගෞරවය ආරක්ෂා කිරීමටත් අවශ්‍ය බව මා විසින් කාරක සභාවල කටයුතු කිරීමෙන් ලද දීර්ඝ අත්දැකීම් ඒත්තු ගන්වයි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාර්ථකත්වය යන්නෙන් අදහස් වන්නේ ඊට දායක වන සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයේ ප්‍රතිඵලයයි. එබැවින්, මෙම කාරක සභාවේ සියලු සභික මන්ත්‍රීවරුන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය නිසියාකාරව ක්‍රියාත්මක කරවීම පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය සඳහා මා හට ලබාදෙන සහාය මම කෘතඥතා පූර්වකව අගය කරමි.

තවද, විවිධ අභියෝග මධ්‍යයේ වුවද කාරක සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට ලබාදෙන සහයෝගය වෙනුවෙන් විගණකාධිපති ඇතුලු කාර්ය මණ්ඩලයට ද, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ටද පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඇතුලු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ සියලුම නිලධාරීන්ට ද කාරක සභාව සිය ස්තුතිය හා ප්‍රසාදය පිරිනමනු ලබන බව මෙහි ලා සඳහන් කරනු කැමැත්තෙමි.

**කබීර් හෂීම්**
සභාපති
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

## සංක්ෂිප්ත වාර්තාව

නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභා වාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතනවලට අදාළව සාකච්ඡා කරන ලද කරුණු, ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් විසින් කරන ලද පැහැදිලිකිරීම්, කාරක සභාව විසින් ලබාදෙන ලද නියෝග හා නිර්දේශ මෙම වාර්තාවේ අඩංගු වේ.

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2023.11.01 දින සිට 2024.01.26 දින දක්වා විමර්ශනය කරන ලද ආයතන හා /අදාළ විගණකාධිපති වාර්තාවන්හි කාල සීමාවන්.**

| | **ආයතනය** | **සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව / පූර්ව කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය / වර්තමාන කාර්යසාධනය** | **විමර්ශනය කරන ලද දිනය** |
|---|---|---|---|
| 01 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 2023.08.11 දින පැවැත්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ වර්තමාන කාර්ය සාධනය | 2023 නොවැම්බර් 08 |
| 02 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 2019, 2020 සහ 2021, මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය | 2023 නොවැම්බර් 15 |
| 03 | ශ්‍රී ලංකා රේගුව | 2019, 2020 හා 2021 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව | 2023 නොවැම්බර් 17 |
| 04 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 2022 මුදල් වර්ෂය සඳහා වූ විගණන වාර්තාව සහ "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමේ කාර්ය සාධනය ඇගයීම" පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2023 නොවැම්බර් 21 |
| 05 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 2022 මුදල් වර්ෂය සඳහා වූ විගණන වාර්තාව සහ "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමේ කාර්ය සාධනය ඇගයීම" පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 2023 නොවැම්බර් 27 |
| 06 | ආරක්ෂක අමාත්‍යාංශය | 2020, 2021, 2022 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා | 2023 නොවැම්බර් 28 |

| | **ආයතනය** | **සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව / පූර්ව කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය / වර්තමාන කාර්යසාධනය** | **විමර්ශනය කරන ලද දිනය** |
|---|---|---|---|
| | | වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව | |
| 07 | රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව | 2022 වර්ෂය සඳහා අතිරික්ත, සීමා ඉක්මවීම්, බලය නොලත් කාරක පාඩු හා 2021 වර්ෂය සඳහා වූ විගණන වාර්තාව | 2023 දෙසැම්බර් 05 |
| 08 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 2023.04.25, 2023.05.26 සහ 2023.08.09 දිනයන්හි පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාව පිළිබඳ සමාලෝචනය | 2024 ජනවාරි 10 |
| 09 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 2019, 2020 සහ 2021 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව | 2024 ජනවාරි 11 |
| 10 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 2021, 2022 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව | 2024 ජනවාරි 23 |
| 11 | මුදල් අමාත්‍යාංශය | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට අදාළ 2021 සහ 2022, මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා, එම අමාත්‍යාංශයේ වත්මන් කාර්ය සාධනය සහ ශ්‍රී ලංකා රේගුවේ 2023 නොවැම්බර් 17 දින පැවති රැස්වීමේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 නොවැම්බර් 15 දින පැවති රැස්වීමේ හා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2023 ඔක්තෝබර් 05 දින පැවති රැස්වීමේ වර්තමාන තත්වය | 2024 ජනවාරි 24 |
| 12 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 2021 හා 2022 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව | 2024 ජනවාරි 24 |

## කාරක සභාව විසින් පවත්වන ලද විශේෂ විමර්ශන

| | විශේෂ විමර්ශන | විමර්ශනය කරන ලද දිනය |
|---|---|---|
| 01 | රාජ්‍ය ආයතනයන්හි මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ ක්‍රියාවලියෙහි වර්තමාන තත්වය සහ ඒ සම්බන්ධව පවතින ගැටළු පරීක්ෂා කිරීම | 2023 නොවැම්බර් 07 |
| 02 | ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (NEMIS) වර්තමාන කාර්යසාධනය, ගැටළු සහ වැඩිදියුණු කිරීම් පිළිබඳ නැවත පරීක්ෂා කිරීම | 2023 නොවැම්බර් 08 |

## විශේෂිත නිරීක්ෂණ

විමර්ශිත කාල පරිච්ඡේදය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතනවලට අදාළව පහත සඳහන් පොදු ගැටලු නිරීක්ෂණය කරන ලදී.

- **අභ්‍යන්තර විගණන ඒකක නොපැවතීම හා විගණන හා කළමනාකරණ කමිටු නියමිත පරිදි නොපැවැත්වීම.**
- **කාර්ය මණ්ඩල පුරප්පාඩු.**
- **පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නිර්දේශ සඳහා නියමිත කාල පර්ච්ඡේදය තුළ පිළිතුරු නොසැපයීම.**
- **රජයට අයවිය යුතු ආදායම් නියමිත දිනට අයකර ගැනීමේ ප්‍රමාදය.**
- **රජයේ මුදල් අවභාවිතය.**
- **ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොපැවතීම.**

## විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු, නිරීක්ෂණ සහ නිර්දේශ

<table>
<tr><td></td><td>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</td><td>- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ</td></tr>
<tr><td colspan="3">රාජ්‍ය ආයතනයන්හි මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ ක්‍රියාවලියෙහි වර්තමාන තත්වය සහ ඒ සම්බන්ධව පවතින ගැටළු පරීක්ෂා කිරීම<br><br>විමර්ශනය කරන ලද දිනය - 2023 නොවැම්බර් 07</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br>❖ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>❖ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව<br>❖ කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>01</td><td>රජයේ මූල්‍ය වාර්තාකරණ කිරීමේ ක්‍රමවේදය පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පරිගණක දෘෂ්‍ය ඉදිරිපත් කිරීමක් (Computer presentation) සිදු කරන ලදී.<br><br>ඒ අනුව,<br><br>මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සහ මූල්‍ය තත්ත්වය ප්‍රකාශය අතර සෘජු සම්බන්ධතාවක් නොතිබීම, රජයේ ණය ගැනීම් හරහා ගොඩනගන ලද වත්කම් රජයේ ගිණුමේ (Island Account) පිළිබිඹු නොවීම හා ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ ශේෂය පිළිබඳව සලකා බලන ලදී.<br><br>විගණනයට ඉදිරිපත් කරන ලද නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන ලද</td><td></td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | සංශෝධන ද මෙහි දී ඉදිරිපත් කරන ලදී.<br><br>විශේෂයෙන්ම ප්‍රදානයන් ලබා දීමේ දී පුනරාවර්තන සහ ප්‍රාග්ධන ලෙස වර්ගීකරණය කිරීම සඳහා සහ රාජ්‍ය දේපල විකිණීමෙන් ලැබෙන අදායම ගිණුම් ගත කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කර 2024 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශ සඳහා යොදා ගැනීමට අපේක්ෂිතය.<br><br>රාජ්‍ය ව්‍යවසාය සඳහා ලබා දෙන ප්‍රාග්ධනය ප්‍රදානයක් / ආධාරයක් / පැවරීමක් ලෙස 2024 වර්ෂයේ සිට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කරනු ලැබේ. | |
| 02 | රජය විසින් ලබා ගන්නා ණය වලින් උපයන ලද වත්කම්, පුහුණු වීම් සඳහා යොදාගත් මුදල, උපදේශකත්වය සඳහා යොදාගත් මුදල් යොදා ගන්නා ආකාරය පිළිබඳ පැහැදිලි විග්‍රහයක් නොතිබීම දුර්වලතාවයක් ලෙස සඳහන් කළ කාරක සභාව 2023.09.13 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නියෝග ප්‍රකාරව රජයේ මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කමිටු පත්කර ගනිමින් අදාළ කාර්යයට | වත්කම් හඳුනා නොගැනීමේ ගැටළුව සමඟම ජනරජ ගිණුමේ (Island Account) වත්කම් නිරූපණය නොවීම, ගිණුම් තැබීමේ ගැටළු පැවතීම, සහ 2022 ජනරජ ගිණුම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් මේ වන විට වාර්තාව ඉදිරිපත් කර ඇති නමුත් එම ගිණුමේ හඳුනාගත් ගැටළු අවම කරමින් නිවැරදි කිරීමට වැඩපිළිවෙළක් සකස් කරමින් සිටින බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. තවද, ජනරජ ගිණුම තුළ ලබා ගන්නා ණය ප්‍රදාන (Grant) ලෙස නොව Equity ලෙස නිරූපණය කිරීම වැදගත් බවත් කාරක සභාව හමුවේ සාකච්ඡා විය. වත්කම් ගණනයේ දී විදේශීය ණය ආධාර/ප්‍රදාන ආශ්‍රිත වත්කම් වටිනාකම් කෙරෙහි විනිමය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | අවතීර්ණ වීම පිළිබඳව සිය ප්‍රසාදය පළ කළේය. | අනුපාතිකයේ බලපෑමක් ඇති බව මෙහි දී සඳහන් විය.<br><br>මේ වන විට රැස්වීම් වාර ගණනාවක් මේ සම්බන්ධයෙන් පවත්වා ඇති බවත්, එහි දී ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් පිළිබඳව අවධානය යොමු කළ බවත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි / ග.නි ප්‍රකාශ කළේය. ඒ අනුව රජය විසින් ලබා ගන්නා ණය වෙන් වන්නේ කුමන කරුණක් සඳහා ද යන්න හඳුනාගෙන ඒ සම්බන්ධව ජනරජ ගිණුම පරිශීලකයන් වෙත disclosure Note එකකින් පෙන්වා දීමට තීරණය කර ඇති බවත් මේ සඳහා යොදා ගනු ලබන ප්‍රතිපත්තිය Capital Grant / Equity Transfer ද යන්න පිළිබඳ තීරණය කිරීම සඳහා සාකච්ඡා කරමින් සිටින බවත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි / ග.නි වැඩිදුරටත් ප්‍රකාශ කළේය. එසේම 2024 වර්ෂයේ ජනරජ ගිණුම සකස් කිරීමේ දී සම්පූර්ණ වශයෙන් නිවැරදි ක්‍රමවේදයකට සකස් කිරීමට බලාපොරොත්තු වන බවත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි / ග.නි වැඩිදුරටත් සඳහන් කළේය.<br><br>තවද ඉදිරි වර්ෂවලදී රජයේ ගිණුම්ගත කිරීම් වලදී නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කිරීම සඳහා වර්තමානයේ සකස් කරනු ලබන ප්‍රතිපත්තිවලට නෛතික බලගැන්වීමක් අවශ්‍ය බව කාරක සභාව අවධාරණය කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| **ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**<br>***(2023.08.11 දින පැවැත්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ වර්තමාන කාර්ය සාධනය)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2023 නොවැම්බර් 08** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය<br>❖ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් කරුණු නිවැරදි නොවන බවට 2023.08.11 දින පැවැත්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරි විසින් කරන ලද ප්‍රකාශය</u>** | ගණන්දීමේ නිලධාරිගේ මෙම ප්‍රකාශයෙන් පසු අදාළ ජල ව්‍යාපෘති 174 නැවත පරීක්ෂා කිරීම සඳහා තම නිලධාරීන් යොමුකර තොරතුරු ලබා ගත් බවත්, එම පරීක්ෂාවෙන් ද තම වාර්තාවේ සඳහන් තොරතුරු නිවැරදි බව තහවුරු වූ බවත් විගණකාධිපතිවරයා ප්‍රකාශ කළේය. පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් ප්‍රදේශීය ලේකම්වරුන් මාර්ගයෙන් ලබා ගත් තොරතුරු පදනම් කර ගනිමින් සකස් කළ වාර්තාවෙන් ද මෙම ජල ව්‍යාපෘති වලින් දැනට ජලය සපයනු ලබන්නේ ව්‍යාපෘති 8 කින් පමණක් බව තහවුරු වී ඇතැයි විගණකාධිපතිවරයා වැඩි දුරටත් සඳහන් කළේය.<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා දී ඇති බලතල ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් කිසිවෙකුටත් අභියෝගයට ලක් කළ නොහැකි බවත්, පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු සිදු කරනු ලබන්නේ විගණකාධිපති වාර්තා පදනම් කරගෙන බවත්, අදාළ ගණන් දීමේ නිලධාරි විසින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | පාර්ලිමේන්තුව නොමග යැවීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත් විගණකාධිපතිවරයා ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>ගණන්දීමේ නිලධාරිගේ ප්‍රකාශය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර 2023 නොවැම්බර් මස 30 වැනි දිනට පෙර එහි වාර්තාව කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) වෙත කාරක සභාව නිර්දේශ කළේය. එම වාර්තාව අධ්‍යයනය කිරීමෙන් පසු මේ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කරන බව කාරක සභාව සඳහන් කළේය.<br><br>***ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක FIN/2014.02.14 හා 16/01/01 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.*** |
| 02 | **<u>දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමට අදාළ පනත් කෙටුම්පත සකස් නොකිරීම</u>** | 2014 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර වසර 10 කට ආසන්න කාලයක් ගතවී ඇතත්, මෙම දෙපාර්තමේන්තුවට අදාළව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අසමත් වී ඇති බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී. දෙපාර්තමේන්තුවට අදාළ නීති සකස් කර ගැනීමකින් තොරව ප්‍රජා මූල සංවිධාන පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු කිරීම අපහසු බව කාරක සභාවේ අදහස විය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | <u>නිර්දේශ</u><br>පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම, නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කිරීමේ සිට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා දින වකවානු ඇතුළත් වාර්තාවක් 2023.12.08 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) / ගණන්දීමේ නිලධාරි (ග.නි.) වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>***ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක FIN/01/01/16 හා 2023.12.06 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.***<br><br>**ඒ අනුව පනත් කෙටුම්පත,**<br><br>**• නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සති 02 ක් තුළ;**<br>**• කැබිනට් අනුමැතිය ලබා ගැනීම සති 4 ක් තුළ;**<br>**• කැබිනට් අනුමැතියෙන් පසු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සති 2ක් තුළ සිදුකිරීමට බලාපොරොත්තු වන බව සඳහන් කර ඇත.** |
| 03 | 2023 ජූනි 30 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ ප්‍රජා මූල සමිති සංඛ්‍යාව 5383 ක් වූ නමුත් 2023 ඔක්තෝබර් 31 දිනට එම | 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති මුළු ප්‍රජා මූල සංවිධාන සංඛ්‍යාව 5383 ක් වුවත්, ඇතැම් සංවිධාන ප්‍රතිපාදන නොලැබීම, ජල මූලාශ්‍ර පිළිබඳ ගැටළු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | සංඛ්‍යාව 4232 ක් ලෙස අඩු වී තිබෙන බව නිරීක්ෂණය කළ කාරක සභාව එසේ අඩුවීමට හේතු විමසා සිටියේය. | ඇතුළු විවිධ හේතූන් මත ජල ව්‍යාපෘති ආරම්භ කර නොමැති බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන්දීමේ නිලධාරි (ග.නි.) ප්‍රකාශ කළේය. මේ වන විට ලියාපදිංචි සක්‍රීය ප්‍රජා මූල සංවිධාන 3900 කට ආසන්න ප්‍රමාණයක් සහ අක්‍රිය ප්‍රජා මූල සංවිධාන 305 කට ආසන්න ප්‍රමාණයක් පවතින බව ප්‍ර.ග.නි. / ග.නි. සඳහන් කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>දැනට අක්‍රියව පවතින, ජල ව්‍යාපෘති ආරම්භ කර නොමැති ලියාපදිංචි සංවිධාන විසින් සිය ලියාපදිංචි සහතිකය අයථා ලෙස උපයෝගී කර ගනිමින් විවිධ අක්‍රමිකතාවල යෙදුණහොත් එහි වගකීම ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට දැරීමට සිදුවන බව කාරක සභාව පෙන්වා දුන්නේය. එම නිසා එවැනි සංවිධාන හඳුනාගෙන ඒවායේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය. |
| 04 | දිස්ත්‍රික්ක කීපයක නිලධාරීන් සූම් (zoom) තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කරගනිමින් ඒ ඒ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක ප්‍රජා මූල සංවිධාන පිළිබඳව සහ ජල ව්‍යාපෘතිවල පවත්නා ගැටළු පිළිබඳව කාරක සභාව විසින් තොරතුරු විමසීමක් කරන ලදී. | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ප්‍රජා මූල ජල ව්‍යාපෘති 589 ක් අතුරින් ව්‍යාපෘති 404 ක් සක්‍රීය තත්ත්වයේ පවතින බව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාන භාර නිලධාරි සඳහන් කර සිටියේය. අක්‍රීය ව්‍යාපෘති 185 න් වැඩි ප්‍රමාණයක් ජල ව්‍යාපෘති අපේක්ෂාවෙන් ලියාපදිංචි කර, ප්‍රතිපාදන නොලැබීම හෝ වෙනත් හේතූන් මත ජල ව්‍යාපෘති ආරම්භ නොකළ සංවිධාන බව ද ඔහු සඳහන් කළේය.<br><br>මොණරාගල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 160 ක් ද ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 149 ක් ද |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ලියාපදිංචි වී තිබෙන අතර ඒවායින් පිළිවෙළින් 145 ක් සහ 117 ක් සක්‍රීය තත්ත්වයේ පවතින බවත් මෙහිදී අනාවරණය විය. ගම්පහ දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රජා මූල සංවිධාන ජල සම්පාදන මණ්ඩලය සමග සම්බන්ධවීම නිසා සංවිධානවල අඩුවීමක් සිදුවී තිබෙන බවද ග.නි. විසින් සඳහන් කරන ලදී.<br><br>රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවයෙන් 70%ක් පමණ ප්‍රජා ජල ව්‍යාපෘති 503 ක් තුළින් සපුරා ගන්නා බව රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාන භාර නිලධාරි සූම් (zoom) තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වෙමින් ප්‍රකාශ කළේය.<br><br>රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රජා ජල සැපයුම් ක්‍රියාවලියෙහි ප්‍රගතිය පිළිබඳව සිය ප්‍රසාදය පළ කළ කාරක සභාව, රජය විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් ව්‍යාපෘති අඛණ්ඩ අධීක්ෂණයකට ලක් කළ යුතු බවත්, එසේ අධීක්ෂණය සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සැකසිය යුතු බවත් කාරක සභාව විසින් අවධාරණය කරන ලදී. |
| 05 | <u>**ප්‍රජා මූල සංකල්පය ආරක්ෂා කිරීම.**</u> | ප්‍රජා මූල ජල ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පැවති ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවලට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල සැපයුම ලබා දීමට කටයුතු කිරීම නිසා එම ප්‍රදේශවල ප්‍රජා ජල ව්‍යාපෘති වැසී යාමේ තත්ත්වයක් උද්ගත වී ඇති බව කාරක සභාව සඳහන් කළේය. ප්‍රජා මූල සංකල්පය ඉතා හොඳ සංකල්පයක් බැවින් එය ආරක්ෂා වන ආකාරයට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හා ජල සම්පාදන හා ජලාවපහන මණ්ඩලය අතර නිසි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සම්බන්ධීකරණයක් ඇතිව ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය කටයුතු කළ යුතු බව ද කාරක සභාව සඳහන් කළේය.<br><br>ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශ යම් කලක දී ජල සම්පාදන මණ්ඩලය මගින් ආවරණය කළ විට එම ප්‍රජා ජල ව්‍යාපෘති ජල සම්පාදන මණ්ඩලය යටතට පැවරීමක් සිදුවන බව ප්‍ර.ග.නි. මෙහිදී ප්‍රකාශ කළේය. එහිදී විශේෂයෙන් ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ ප්‍රජාවට ජලය සැපයීමට භාවිත කළ නල පද්ධතියම ජල සම්පාදන මණ්ඩලය විසින් යොදා ගනු ලබන බව ද මෙහිදී සඳහන් විය. අවම වශයෙන් වසර 10 ක කාලයක් ඇතුළත දී ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ජල සැපයුම ලබා දීමට නොහැකි ප්‍රදේශවල පමණක් ප්‍රජා ජල ව්‍යාපෘති ආරම්භ කිරීමට ජල සම්පාදන මණ්ඩලය සමග එකඟතාවයකට පැමිණ ඇති බව ද ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මිලියන ගණනක මූල්‍ය සහ භෞතික වත්කම් වලින් සමන්විත ප්‍රජා මූල සංවිධාන ආරක්ෂා කර ගැනීම සඳහා නිසි නියාමනයක් අවශ්‍ය බව පෙන්වා දුන් කාරක සභාව, ඒ සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන දැනට කෙටුම්පත් කර ඇති ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තු පනත් කෙටුම්පතෙහි ඇතුළත් විය යුතු බව අවධාරණය කළේය. |
| 06 | 2023.08.11 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා | මේ පිළිබඳව නැවතත් පරීක්ෂා කර බලා මෙම කටයුතු වලට සම්බන්ධ වූ නිලධාරීන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | රැස්වීමේදී ලබා දුන් නිර්දේශය ප්‍රකාරව ඉදිරිපත් කර ඇති "ඉටු නොකළ වැඩ හා ලංසු ලේඛන නියමයන්ට පටහැනිව සිදු කළ කාර්යයන් වෙනුවෙන් රු.මිලියන 14.4 ක් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් වූ කමිටු වාර්තාව" මගින් මුදල් රෙගුලාසි විධිවිධාන වලට පටහැනිව කටයුතු කර ඇති නිලධාරීන් කවුරුන්දැයි අනාවරණය කර නොමැති බවත්, ඔවුන් සම්බන්ධයෙන් ගත යුතු විනය පියවර පිළිබඳ කිසිදු නිර්දේශයක් ඉදිරිපත් කර නොමැති බවත් කාරක සභාව පෙන්වා දුන්නේය. | කවුරුන්ද? එම නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන විනය ක්‍රියාමාර්ග මොනවාද? යන කරුණු ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත (2023.12.08 දිනට පෙර) කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය. |
| 07 | <u>**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණකවරයකු නොමැති වීම**</u> | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර තිබුණු අභ්‍යන්තර විගණක තනතුර සඳහා දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම නිලධාරියකු බඳවා ගෙන නොමැති බවත්, ඒ හේතුවෙන් මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු නිසි පරිදි සිදු නොවන බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. <br><br> තවද, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් අභ්‍යන්තර විගණක තනතුරෙහි රාජකාරි ආවරණය කිරීම සඳහා පත් කරන ලද නිලධාරියකු ගණන්දීමේ නිලධාරිගේ අභිමතය පරිදි ගණකාධිකාරී තනතුර සඳහා පත් කර තිබූ බවද මෙහිදී අනාවරණය විය. <br><br> <u>**නිර්දේශ**</u> <br> මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡාවට භාජනය වූ අතර, ප්‍රධාන අභ්‍යන්තර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | විගණකට, ගණකාධිකාරී ලෙස පත්වීම් ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතින් විමසීමක් කරන ලෙසත්, ඒ පිළිබඳව වාර්තාවක් කාරක සභාවට යොමු කරන ලෙසත් කාරක සභාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) වෙත නිර්දේශ කළේය. |
| 08 | <u>**ප්‍රජා ජල ව්‍යාපෘතිවල ජල තත්ත්ව පරීක්ෂණ සිදු කිරීම**</u> | ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) යටතේ ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ජංගම පරීක්ෂණ කට්ටල (MOBILE TEST KITS) 17 ක් ලබා දී තිබෙන බව ද මෙහිදී අනාවරණය විය. එම පරීක්ෂණ කට්ටල මේ වනවිට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව භාරයේ පවතින බවත්, එක් පරීක්ෂණ කට්ටලයක වටිනාකම රු. මිලියන 10 ක් පමණ වන බවත් කාරක සභාව විසින් අනාවරණය කර ගන්නා ලදී.<br><br><u>**නිර්දේශ**</u><br>මෙම ව්‍යාපෘතිය යටතේ සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් ලබා දුන් උපකරණ මොනවාද? ඒවායේ වියදම කොපමණද? එම උපකරණ වල වර්තමාන තත්ත්වය හා ඒවායේ භාරකාරත්වය දරන්නේ කවුරුන් විසින්ද? යන කරුණු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් 2023 නොවැම්බර් මස 24 වැනි දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) වෙත කාරක සභාව නිර්දේශ කළේය. |

<table>
<tr><th></th><th>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</th><th>- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ</th></tr>
<tr><td></td><td></td><td>ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක FIN/01/01/16 හා 2023.11.24 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.</td></tr>
<tr><td>09</td><td><u>දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල සමග රැස්වීම් පැවැත්වීම</u></td><td>ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් කාර්යාල සමග මසකට වරක්වත් රැස්වීම් පැවැත්විය යුතු බව සඳහන් කළ කාරක සභාව, දිස්ත්‍රික් කාර්යාල විසින් ප්‍රාදේශීය කාර්යාල ද ඊට සම්බන්ධ කර ගන්නා ලෙස උපදෙස් ලබා දුන්නේය.</td></tr>
<tr><td colspan="3">ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (NEMIS) වර්තමාන කාර්යසාධනය, ගැටළු සහ වැඩිදියුණු කිරීම් පිළිබඳ නැවත පරීක්ෂා කිරීම<br><br>විමර්ශනය කරන ලද දිනය - 2023 නොවැම්බර් 08</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ අධ්‍යාපන අමාත්‍යාංශය<br>❖ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)<br>❖ මොරටුව විශ්වවිද්‍යාලය</td></tr>
<tr><td>01</td><td><u>ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (NEMIS) වර්තමාන තත්ත්වය</u><br>ඩිජිටල් තොරතුරු පද්ධතියක් භාවිතය මගින් පාසල්වල පරිපාලන කටයුතු සඳහා විශාල සහායක් ලබාගත හැකි බව පෙන්වා දුන් කාරක සභාව, ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ කටයුතු සඳහා ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS)</td><td>2023.07.07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමෙන් පසු අවස්ථා කිහිපයකදී මොරටුව විශ්වවිද්‍යාලය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග මෙම දත්ත පද්ධතිය සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලද බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>මෙම දත්ත පද්ධතියේ වර්තමාන තත්ත්වය පැහැදිලි කළ මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු, මෙම දත්ත පද්ධතිය, දත්ත සමුදාය (database), දත්ත කළමනාකරණ පද්ධතිය (dbms), යෙදුම් පද්ධතිය</td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රගතිය පිළිබඳ කරුණු විමසා සිටියේය. | (application system) සහ නිලධාරීන්ට අන්තර්ජාලය හරහා දත්ත පද්ධතිය සමග සම්බන්ධ වීමේ පහසුකම ලබාදෙන වෙබ් සර්වර් පද්ධතිය (web server system) යන කොටස් හතරකින් සමන්විත බවත්, මූලික වශයෙන් සංවර්ධනය කිරීමට එකඟ වූ මොඩියුල නවයට අමතරව භාවිතයේදී මතු වූ අවශ්‍යතා අනුව තවත් මොඩියුල 09 ක් සකස් කරන ලද බවත් ප්‍රකාශ කළහ. 2017 වර්ෂයේදී NEMIS දත්ත පද්ධතිය භාවිතය සඳහා මුදා හරින අවස්ථාව වන විට දත්ත සමුදාය (database) සකස් කිරීමට භාවිත කළ SQL Server 2017 Enterprise Edition මෘදුකාංගය සඳහා මේ වන විට ආරක්ෂක යාවත්කාලීන කිරීම් (Security updates) නිකුත් කිරීම සිදු නොකරන බැවින් වර්තමාන අවශ්‍යතාවයක් වන පොදු ප්‍රවේශයන් (Public access) සහිත පද්ධතියක් සඳහා එය භාවිත කිරීම සුදුසු නොවන බවද ඔවුහු ප්‍රකාශ කළහ.<br><br>ඉදිරියේදී චීන ආධාර යටතේ Huawei ආයතනයෙන් දත්ත පද්ධතිය සඳහා මෘදුකාංග වේදිකාවක් (platform) ලබා දීමට නියමිත බව මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළ අතර, මොරටුව විශ්වවිද්‍යාලයේ Huawei පර්යේෂණාගාරය සමග සම්බන්ධ වී දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා එහි අවශ්‍යතා හඳුනා ගෙන යෝජනා සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව ද සඳහන් විය. පද්ධතියේ දත්ත යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවයද පවතින බව මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු පෙන්වා දුන් අතර, |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි නව මෘදුකාංග වේදිකාවේ දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ සැලසුම් යාවත්කාලීන කිරීම් සහ තාක්ෂණික වැඩිදියුණු කිරීම් ඇතුළත් දීර්ඝ කාලීන සැලැස්මක් සමග මෙම නව මෘදුකාංග වේදිකාව වෙත යා යුතු බවද ප්‍රකාශ කළහ. |
| 02 | <u>**NEMIS දත්ත පද්ධතියට දත්ත ඇතුළත් කිරීම හා යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළු**</u><br>NEMIS දත්ත පද්ධතියේ මොඩියුල නවයෙන් මේ වන විට භාවිත කරනු ලබන්නේ general reporting මොඩියුලය පමණක් බවත්, කලාප කාර්යාල මගින් දත්ත ඇතුළත් කිරීමේ දෝෂ හේතුවෙන් Not specified නම් දත්ත කාණ්ඩයක් පෙන්වනු ලබන බවත් විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදී.<br>NEMIS පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පළාත් මට්ටමෙන් දත්ත පද්ධති සකස් කර තිබෙන බවත්, එම නිසා කලාප කාර්යාලවලට දත්ත ඇතුළත් කිරීම කිහිප වරක් කිරීමට සිදුව ඇති බවත් කාරක සභාවේදී අනාවරණය විය. | NEMIS දත්ත පද්ධතිය සඳහා ගුරුවරුන්ගේ දත්ත ඇතුළත් කිරීම කලාප අධ්‍යාපන කාර්යාලවල ගුරුවරුන්ගේ පෞද්ගලික ලිපිගොනු භාරව සිටින නිලධාරීන් විසින් සිදු කරනු ලබන බවත්, ගුරුවරුන් 220,000 කගේ පමණ යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියේ දැනට පවතින බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළ අතර, එම තොරතුරු ගුරුවරුන්ගේ විෂයයන් හා දිස්ත්‍රික්ක අනුව පද්ධතිය හරහා ලබා ගත හැකි බවද සඳහන් කළේය. මෑතකදී විදුහල්පති උසස්වීම් ලද ගුරුවරුන් මෙම පද්ධතියෙන් ඉවත් කර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට කලාප කාර්යාල හරහා සිදු කෙරෙමින් පවතින බවද ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. අදාළ උපාංග හා ජාල සබඳතාවල අඩුපාඩු හේතුවෙන් කලාප කාර්යාල මගින් දත්ත ඇතුළත් කිරීමේ ප්‍රමාද හා දෝෂ පවතින බවද ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ආරම්භයේදී මෙම පද්ධතියට ගුරුවරුන්ගේ තොරතුරු තමන් විසින්ම ඇතුළත් කිරීමේ (self service) පහසුකම ලබා දී තිබුණු නමුත් එහිදී ප්‍රායෝගිකව මතු වූ ගැටළු හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දුන් උපදෙස් පරිදි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | එම පහසුකම ඉවත් කර කලාප කාර්යාල මගින් පමණක් දත්ත ඇතුළත් කළ හැකි පරිදි පද්ධතිය සකස් කළ බව මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු ප්‍රකාශ කළහ. මෙම පද්ධතියේ එක් එක් මොඩියුලවල ක්‍රියාකාරී තත්ත්වය පිළිබඳව කාරක සභාව විමසා සිටි අතර මොඩියුල ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බව මහාචාර්යවරු ප්‍රකාශ කළහ. තවද, දැනට තිබෙන දෘඩාංගවල ධාරිතාව සහ මතකය මෘදුකාංග යාවත්කාලීන කිරීම් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් Huawei ආයතනයේ ආධාර යටතේ දැනට පවතින පද්ධතියේ දෘඩාංග සංරචක යාවත්කාලීන කිරීම (Hardware update) සිදු කිරීමට අපේක්ෂා කරන බවත් ඔවුහු ප්‍රකාශ කළහ. NEMIS පද්ධතිය ක්‍රියාත්මක කර දීර්ඝ කාලයක් ගත වී තිබුණ ද මෙතෙක් එය සම්පූර්ණ දත්ත පද්ධතියක් වශයෙන් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම පිළිබඳව කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය.<br><br>NEMIS පද්ධතිය සඳහා අපේක්ෂිත දෘඩාංග යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කෙරෙන තෙක් කලාප කාර්යාල මගින් සම්පූර්ණ කර නොමැති දත්ත ඇතුළත් කරවා ගැනීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳව කාරක සභාව විමසූ අතර, පොදු ප්‍රවේශ (Public access) පහසුකම ලබා නොදී අමාත්‍යාංශයේ නිලධාරීන් මගින් එය සිදු කිරීමට හැකි බව නිගමනය කළ හැකි බව මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරු ප්‍රකාශ කළහ.<br><br>NEMIS පද්ධතියේ දත්ත යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා කලාප |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | අධ්‍යාපන කාර්යාල සියයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සමග සූම් (zoom) තාක්ෂණය ඔස්සේ රැස්වීම් වාර 4 ක් පවත්වා 2023 ඔක්තෝබර් 15 දිනට සම්පූර්ණ කළ යුතු ඉලක්ක ලබා දුන් බවද ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. කෙසේ නමුත් මෙතෙක් එම කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර නොමැති කලාප කාර්යාල පවතින බවත්, වසරකට සිව්වරක් සංගණන වාර්තාවක් මගින් යාවත්කාලීන කර නොමැති දත්ත පිළිබඳ තොරතුරු ලබාගෙන ඒවා යාවත්කාලීන කරන ලෙස කලාප කාර්යාල වෙත දන්වා යවන බවත් ප්‍ර.ග.නි./ ග.නි. තවදුරටත් සඳහන් කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>නිසි පරිදි දත්ත යාවත්කාලීන නොකිරීම හේතුවෙන් දත්ත පද්ධතියේ දැක්වෙන ගුරුවරුන් සංඛ්‍යාව සහ වැටුප් ගෙවනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අතර පරස්පරතාවයක් පවතින බව ද කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු 2024 මාර්තු වන විට අවසන් කරන ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදී. |
| 03 | **<u>ප්‍රතිපත්තිමය හා පරිපාලන තීන්දු ගැනීමේදී NEMIS දත්ත පද්ධතිය උපයෝගී කරගැනීම.</u>**<br>දැනට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය හා පරිපාලන තීන්දු ගැනීමේදී මෙම දත්ත පද්ධතිය උපයෝගී කරගන්නා | ගුරුවරුන්ගේ විශ්‍රාම යාමට නියමිත දිනය, එක් විෂයකට/ මාධ්‍යයකට සිටින ගුරුවරුන් සංඛ්‍යාව, එක් එක් ගුරු ශ්‍රේණියේ සිටින ගුරුවරුන් සංඛ්‍යාව වැනි තොරතුරු මෙම දත්ත පද්ධතිය මගින් ලබා ගත හැකි බවත්, අමාත්‍යාංශයේ අයවැය සකස් කිරීමේදී අවශ්‍ය වන වැටුප් සම්බන්ධ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | ආකාරය පිළිබඳව කාරක සභාව විසින් විමසා සිටින ලදී. | දත්ත මෙමගින් ලබා ගත නොහැකි බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 04 | **<u>NEMIS පද්ධතිය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් වන ඉදිරි වැඩපිළිවෙල</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>NEMIS පද්ධතිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩපිළිවෙළ පිළිබඳව පළාත් අධ්‍යාපන ලේකම්වරුන් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් දැනුවත් කර ඔවුන් වෙතද දත්ත පද්ධතිය සඳහා ප්‍රවේශයන් ලබාදීම සුදුසු බවටත්, දත්ත පද්ධතියේ කාර්යයන් පිළිබඳ වගකීම අතිරේක ලේකම්වරයෙකු යටතට පත් කර සියලුම කලාප කාර්යාල හා පළාත් කාර්යාල සූම් (zoom) තාක්ෂණය හරහා රැස්කර එහි ප්‍රගතිය නිරතුරුව සමාලෝචනය කළ යුතු බවටත් කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත උපදෙස් ලබා දුන්නේය.<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය, මොරටුව විශ්වවිද්‍යාලය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) යන ආයතන නියෝජනය කරන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ක්‍රියාත්මක කෙරෙන NEMIS දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙලේ ප්‍රගතිය දෙසතියකට වරක් කාරක සභාව වෙත වාර්තා කළ යුතු බවට කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් දුන්නේය.<br><br>දැනට පවතින NEMIS දත්ත පද්ධතියේ මොඩියුල සහ තාක්ෂණ අවශ්‍යතා (Technical requirements), දෘඩාංග අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ කාර්යය පිළිබඳ දින වකවානු සමග සියලු තොරතුරු සහ එම |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | පද්ධතියේ දැනට පවතින අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ගතවන කාල රාමුව යනාදී තොරතුරු ඇතුළත් මූලික වාර්තාවක් සති 03 ක් තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>දත්ත පද්ධතියේ යාවත්කාලීන කිරීමේ කටයුතු සඳහා සියලු පළාත් අධ්‍යක්ෂවරුන් සහ කලාප අධ්‍යක්ෂවරුන් සම්බන්ධ කර ගත යුතු බවත්, මාසයකට දෙවරක්වත් රැස්වීම් කැඳවා එහි ප්‍රගතිය පරීක්ෂා කළ යුතු බවත් කාරක සභාව ප්‍රකාශ කළේය.<br><br>**අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ED/14/DMISD/21/08 හා 2024.02.08 දිනැති ලිපියෙන් අදාළ මෙහෙයුම් කමිටුව විසින් පද්ධතිය පිළිබඳව සැකසූ වාර්තාවක් සහ මෙම තොරතුරු පද්ධතියේ ආරම්භය, වර්තමාන තත්ත්වය සම්බන්ධ ගැටළු හා වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, දැනට පවතින අවශ්‍යතාවයන් සඳහා ගැළපෙන යාවත්කාලීන වූ නව පද්ධතියක් සංවර්ධනය කිරීමට අවධානය යොමු කර ඇති බවත් දන්වා ඇත. තවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ED/ 05/ 90/ Audit/ COPA/ 2024 හා 2024.03.04 දිනැති ලිපියෙන් මෙම කාර්යය සම්බන්ධයෙන් 2023.12.22 දින දක්වා පැවති සාකච්ඡා සටහන් ද සමග වර්තමාන තත්ත්වය වාර්තා කර ඇත.** |
| 05 | <u>අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දරුවන් පාසල්වල පළමු වසරට ඇතුළත් කිරීමේදී දුෂ්කර සේවා</u> | පහසුකම් පාදක කරගෙන පාසල් වර්ගීකරණය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2005/01 දරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | **<u>කාලයන් සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදයේ අඩුපාඩු පැවතීම.</u>**<br>පාසල්වල පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේදී දුෂ්කර පාසල්වල සේවය කිරීම යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ලකුණු ලබාදීමේ ක්‍රියාවලියේ අඩුපාඩු පවතින බවත්, දුෂ්කර පාසල් නිර්ණය කිරීම සඳහා පැහැදිලි නිර්ණායක නොමැති බවත් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව සිදු කරනු ලබන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ</u>**<br>ගුරුවරයෙකු පදිංචිව සිටින ප්‍රදේශයේ සිට සේවය කරනු ලබන පාසල වෙත ඇති දුර ද පාසල් වර්ගීකරණය අනුව දුෂ්කර සේවය සඳහා සලකා බැලිය යුතු වන බව කාරක සභාවේ අදහස විය.<br><br>'දුෂ්කර පාසල්' නිර්වචනය යොදා ගන්නා ආකාරය පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය කළ කාරක සභාව යම් තැනැත්තකුගේ ස්ථිර පදිංචිය දුෂ්කර ප්‍රදේශයක වන විට, එම තැනැත්තා සම්බන්ධයෙන් 'දුෂ්කර පාසල්' යන නිර්වචනය කෙසේ විය යුතුද යන්න පිළිබඳව විමසා සිටියේය. පාසල් වර්ගීකරණය සඳහා අදාළ වන චක්‍රලේඛ යාවත්කාලීන කළ යුතු වන බවත්, ඒ සඳහා කමිටුවක් පත් කිරීම සුදුසු බවත් කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.<br><br>ගුරුවරුන් තමන් පදිංචි ප්‍රදේශයෙන් ඉතා දුර බැහැර දුෂ්කර පාසල්වල සේවයේ යෙදවීමෙන් ඇතිවන ප්‍රායෝගික ගැටළු පිළිබඳව ද කාරක සභාව අවධානය යොමු කළ අතර, ගුරුවරුන් බඳවා ගැනීමේදී පළාත් අනුව ලැබෙන නියෝජනයේ අසමානතා පවතින නිසා එවැනි පත් කිරීම් සිදු කෙරෙන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. ඉදිරියේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල් මණ්ඩලවලට (School Boards) ගුරුවරුන් පත්කිරීමට බලතල ලබා දීම, ප්‍රසූත නිවාඩු ලබා සිටින ගුරුවරියන් වෙනුවෙන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | තාවකාලිකව විශ්‍රාමික ගුරුවරුන් පත් කිරීම වැනි විසඳුම් හඳුන්වා දීම මගින් මෙම ගැටළු අවම කර ගැනීමට අපේක්ෂා කරන බවද ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය.<br><br><u>නිර්දේශ</u><br>දුෂ්කර පාසල් නිර්වචනය කිරීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යවරයාද සමග සාකච්ඡා කර 2024 ජනවාරි 31 වන විට කාරක සභාව වෙත වාර්තා කරන ලෙස ප්‍ර.ග.නි/ ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ED/ 05/ 90/ Audit/ COPA/ 2024 හා 2024.03.25 දිනැති ලිපියෙන් "පාසල්වල අධ්‍යයන කාර්යමණ්ඩල බඳවා ගැනීම, ස්ථානගත කිරීම සහ ස්ථාන මාරු විධිමත් කිරීම සඳහා පාසල් වර්ගීකරණය" යන මැයෙන් 2024.01.29 වන දින අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් අංක 01/2024 චක්‍රලේඛය නිකුත් කර ඇති බවත්, පළාත් අධ්‍යාපන නිලධාරීන් විසින් තම පළාතේ සියලුම පාසල් සඳහා එම චක්‍රලේඛයට අදාළව ලකුණු ප්‍රදානය කර, අදාළ ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව දුෂ්කර පාසල් නම් කිරීමට පත් කර ඇති කමිටුව මඟින් ඉදිරි වසර 03 සඳහා පළාත් නවයේම පාසල් ලේඛන සමාලෝචනය කර ඒ ඒ පාසල් වර්ගය සඳහා අවම ලකුණු තීරණය කරනු ඇති බවත්, ඉන් අනතුරුව පාසල් වර්ගීකරණය ප්‍රකාශයට පත් කිරිමට නියමිත බවත් වාර්තා කර ඇත.** |
| 06 | <u>විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවල ලකුණු</u> | විදුහල්පතිවරුන් බඳවා ගැනීමේදී නිලධාරීන්ගේ කාර්යයන් අතර බෙදීමක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | <u>ලබාදීමේ පටිපාටිය සම්බන්ධයෙන් පවතින ගැටළු</u><br>ජාතික පාසල්වලට විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති 2023.03.07 දිනැති අංක EDU-A-MOE-2022-05 දරන විගණන විමසුම පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලදී පෙර අවස්ථාවන්හි දී පාසල්වල සේවය කර ඇති අයදුම්කරුවන්ගේ එම සේවා කාලයන් සඳහා විශේෂ ලකුණු ප්‍රමාණයක් ලබා දිය යුතු වන්නේද යන්න විමසන ලදී. | ඇති වීම වැළැක්වීම සඳහා සියලු නිලධාරීන් වෙත සමාන අවස්ථා ලබා දීම සුදුසු වන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. තවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලදී සෑම අයෙකුටම පොදුවේ ජ්‍යෙෂ්ඨතාවය සලකා ලකුණු ලබා දෙන ලෙසට උපදෙස් ලබාදී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය. එනමුත්, අදාළ කාර්යය පිළිබඳව අත්දැකීම් සහිත නිලධාරීන් පිරිසක් පාසල් වෙත පත්කළ යුතු වන බැවින්, මෙම සම්මුඛ පරීක්ෂණවල ලකුණු ලබා දීමේදී නියෝජ්‍ය විදුහල්පති සහ විදුහල්පති තනතුරුවල සේවය කරන ලද කාලසීමාවන් සඳහා යම් සැලකිල්ලක් දැක්වීම සුදුසු බව විෂය භාර අමාත්‍යවරයා සමගද සාකච්ඡා කර තීරණයක් ගන්නා බවත්, ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>පාසල් හැර වෙනත් දෙපාර්තමේන්තුවලට අනුයුක්තව සේවය කරන නිලධාරීන්ට එම දෙපාර්තමේන්තුවල කාර්යයන්ට විශේෂිත විදේශ පුහුණු අවස්ථා ආදිය ලබා දෙන බැවින් එවැනි නිලධාරීන් වෙත නියෝජ්‍ය හෝ සහකාර විදුහල්පති තනතුරු සඳහා පත් වීම් ලබා දී යම් කාලසීමාවක් රාජකාරියෙහි නිරත වීමෙන් අනතුරුව විදුහල්පති තනතුරට පත් කිරීම සහ පාසල් වර්ගීකරණයට සමානුපාතිකව පත්වීම් ලබාදීම වඩාත් සුදුසු බවත් කාරක සභාවේ අදහස විය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | ජාතික පාසල්වලට විදුහල්පතිවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් පැවති නඩුවේ තීන්දු ප්‍රකාශය ලබා දීමේදී විදුහල්පතිවරුන් බඳවා ගැනීමේදී උපයෝගී කොට ගත් ලකුණු පටිපාටිය පිළිබඳව ප්‍රකාශ කරන ලද කරුණු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ED/ 05/ 90/ Audit/ COPA/ 2024 හා 2024.03.28 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් 2019, 2020, 2021 හා 2023 වර්ෂවල පැවති සම්මුඛ පරීක්ෂණවලදී විදුහල්පතිවරයෙකු ලෙස සේවය කළ කාලයට ලකුණු ලබා දීමක් සිදු කර නොමැති බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම්ගේ අංක ESC/ APP/ SLEAS/ 04/ 64/ 2023 හා 2024.02.15 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇති නව ලකුණු පටිපාටිය අනුව නියෝජ්‍ය විදුහල්පති/ විදුහල්පති තනතුරුවල සේවා පළපුරුද්ද වෙනුවෙන් උපරිම ලකුණු 20 ක් වෙන් කර ඇති බවත් වාර්තා කර ඇති අතර, SC/FR/126/2022 දරන නඩුවේ තීන්දු ප්‍රකාශයේ පිටපතක් ද යොමු කර ඇත.** |
| 07 | <u>**පාසල්වල ජල, විදුලි හා දුරකථන බිල්පත් ගෙවීම**</u><br>පාසල්වල ජල, විදුලි හා දුරකථන බිල්පත් ගෙවීම සිදු කරන | පළාත් පාසල් සහ ජාතික පාසල්වල ජල බිල්පත් රජය විසින් ගෙවීම සිදු නොකරන බවත්, 2022 දී ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | ආකාරය පිළිබඳව කාරක සභාව විසින් කරුණු විමසන ලදී. | ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් එක් සිසුවෙකු දිනකට ජලය ලීටර 20 ක් පරිභෝජනය කිරීම සලකා එක් මසකට දින 20 ක් පාසල පැවැත්වීම යන නිර්ණායක යටතේ ජලය භාවිතය සඳහා වැය වන මුදල රජයෙන් ගෙවීමටත්, එම ප්‍රමාණය ඉක්මවා වැය වන මුදල පාසල් සංවර්ධන සමිති (School Development Societies) මගින් ගෙවීමටත්, එක් ජල සම්බන්ධතාවයක් නොමිලේ ලබා දීමත් යනාදී යෝජනා සඳහා අනුමැතිය ලබා ගත් බව ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.<br><br>පාසල්වල වහලය මත සූර්ය බල පැනල (Solar Panel) ස්ථාපනය කිරීමේ හැකියාව පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළ අතර, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සමග මීට දෙසතියකට පමණ පෙර පැවති රැස්වීමක දී පාසල් 3000ක සූර්ය බල පද්ධති ස්ථාපනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, විදුලිබල මණ්ඩලය හා අදාළ අමාත්‍යාංශය සම්බන්ධ කරමින් මෙහෙයුම් කමිටුවක් පත් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 08 | **<u>2024 වර්ෂයේ පාසල් දින දර්ශනය (පාසල් ලිත) සකස් කිරීම ප්‍රමාද වීම</u>**<br><br>විදුහල්පතිවරුන් හට 2024 වර්ෂයේ පාසල් දින දර්ශනය (පාසල් ලිත) මෙතෙක් සකස් කිරීමට නොහැකි වීම පිළිබඳව | මේ වන විට අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග පැවැත්වීමේ දින වකවානු පිළිබඳව තීරණය කර ඇති බැවින් පාසල් ක්‍රීඩා උත්සව, ත්‍යාග ප්‍රදාන උත්සව ආදිය ඇතුළත් කරමින් පාසල් ලිත සකස් කිරීමේ කටයුතු සිදු කිරීමේ හැකියාව පවතින බවත්, ඊළඟ සතිය වන විට ඒ පිළිබඳව පාසල් දැනුවත් කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | කාරක සභාව අවධානය යොමු කළේය. | මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් මගින් විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි. වෙත උපදෙස් දෙන ලදී. |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**<br>***(2019, 2020 සහ 2021, මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2023 නොවැම්බර් 15** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br>❖ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | | |
| 01 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පසුගිය වසර 5 ක් සහ මෙම වසරේ මේ දක්වා බදු ආදායම් රැස් කිරීම පිළිබඳව දත්ත විග්‍රහ කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිගණක දෘෂ්‍ය ඉදිරිපත් කිරීමක් (Computer presentation) සිදු කරන ලදී.<br><br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන බදු වර්ග, (සෘජු බදු හා වක්‍ර බදු වෙන් වෙන් වශයෙන්) ඇස්තමේන්තුගත ආදායම හා ආදායම් එකතු කිරීම (2018-2023) රාජ්‍ය බදු ආදායමට හා දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය ඔස්සේ එකතු කළ අගය මත බදු එකතුව (2018-2023) ආදායම් | |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | බදු එකතුව (2023), බදු ගෙවන්නන්ගේ වර්ගය අනුව විවිධ බදු වර්ගවල එකතුව, හිඟ බදු ආදායම (2023) මාසික බදු ආදායම් කාර්යසාධනය-2023 සහ එක් එක් බදු වර්ගය මත බදු ආදායම 2018-2023 ආදිය මෙම ඉදිරිපත් කිරීමට ඇතුළත් විය.<br><br>ඒ අනුව,<br><br>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් යටතේ පරිපාලනය වන බදු වර්ග 11 ක් ඇති බව;<br><br>සමස්ත රජයේ බදු ආදායමෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් සඳහා දායකත්වය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන අතර පසුගිය අවුරුදු කිහිපය තුළ බදු ප්‍රතිපත්තියේ වෙනස් කිරීම් සිදු කිරීම මත බදු ආදායම අඩු වී ඇති බව;<br><br>2023.10.31 දින වන විට PAY As You Earn (PAYE) බද්ද ගෙවීම නිසා Individual and partnership බදු ප්‍රමාණය අඩු වී ඇති අතර සමස්ත ඇස්තමේන්තු ගත බදු ආදායම ඉක්මවා බදු රැස්කර නැති බව;<br><br>බදු අය කිරීමේ සීමාව (Threshold) වැඩි වීම සහ බදු අනුපාත අඩු වීම නිසා එකතු කළ අගය මත බද්ද (VAT) 2019 සිට 2022 වර්ෂය දක්වා අඩු වී ඇති බව හා, | |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | 2023 වර්ෂය සඳහා සමස්ත බදු ආදායම් රැස් කිරීමේ ඇස්තමේන්තුව අනුව රුපියල් බිලියන 1667 ක් පමණ වූ ආදායම් ඉලක්කයෙන් 2023 වර්ෂයේ නොවැම්බර් මස වන විට 78.78% ප්‍රගතියක් ලබා ගෙන ඇති බව එමගින් පෙන්වා දෙන ලදි. | |
| 02 | <u>**එකතු කළ අගය මත බදු (VAT) ආදායම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලැබීම.**</u> | බොහෝ වෙළෙඳ ආයතන විසින් පාරිභෝගිකයාගෙන් ලබා ගන්නා VAT මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නිසි පරිදි ලැබෙන බව සහතික විය හැකි ද යන්න පිළිබඳව කාරක සභාවේ දී අවධානයට යොමු විය. <br><br><u>නිර්දේශ</u> <br>එම වෙළෙඳ ආයතන විසින් පාරිභෝගිකයාගෙන් අය කරනු ලබන VAT මුදල් ගණනය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා එම ආයතන විසින් භාවිත කරනු ලබන PoS machine (Point of Sale) හරහා අදාළ දත්ත ලබා ගැනීමට හැකිවන අයුරින් එම යන්ත්‍ර ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සමාගම සමඟ සාකච්ඡා කර සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීමට මැදිහත් වන ලෙස කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත නිර්දේශ කරන ලදි. <br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක MF06/4/IRD/COPA/2023** හා |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | - **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>- **කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | **2024.01.04 දිනැති ලිපිය මගින් POS මැෂින් ලංකාවට ගෙන්වන ආයතන 20 කට ආසන්න ප්‍රමාණයක් පවතින බවත් ඔවුන් සපයන සේවාවන් සමාන නොවන බැවින් එම ආයතන සමඟ වෙනම සාකච්ඡා කර ඔවුන්ගේ ගනුදෙනුකරුවන් VAT සඳහා ලියාපදිංචි අය යන්න සහ VAT බදු සීමාව තුළ සිටී ද යන්න පරීක්ෂා කිරීමට සහ වෙනත් රටවල POS මැෂින් යොදා ගන්නා ආකාරය පිළිබඳ අධ්‍යනය සඳහා යම් කාල සීමාවක් ගත වන බැවින් ඒ සඳහා මාස 3 ක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.** |
| 03 | <u>හිඟ බදු</u> | 2023 ජුනි මස 30 වන දිනට හිඟ බදු හා දඩ මුදල් ප්‍රමාණය රුපියල් 943,003,334,758/- ක් බවත් 2022.12.31 දිනට Legacy පරිගණක පද්ධතිය අනුව එකතු කළ අගය මත හිඟ බදු හා දඩ වටිනාකම වූ රුපියල් 33,265,432,575/- කින් රුපියල් 22,184,676,544/- ක හිඟ බදු හා දඩ මුදල් රජයට අයකර ගැනීමේ හැකියාව අවදානමට ලක් වී ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. |
| 04 | <u>අගරු චෙක්පත්</u> | චෙක්පත් හරහා බදු ගෙවීමේ දී චෙක්පත් අගරු වීම හේතුවෙන් බදු ගෙවීම සඳහා විකල්ප ක්‍රම ලෙස බැංකු අණකර භාවිතයට යොමු වන ලෙස පූර්ව ගිණුම් කාරක සභාවේ දී නිර්දේශ කළ අතර 2023 ජුනි මස 30 දිනට රු. මිලියන 210 කට ආසන්න වටිනාකමකින් යුත් අයවිය යුතු අගරු චෙක්පත් පවතින බව හෙළි විය. එසේම අගරු චෙක්පත් ඉදිරිපත් කරන පුද්ගලයින්ට එරෙහිව ගන්නා නීතිමය |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | පියවර පිළිබඳව කාරක සභාව විසින් විමසන ලදි.<br><br>අගරු චෙක්පත් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ කමිටුවක් පත් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. චෙක්පත් හරහා බදු ගෙවීමේ දී මහජන බැංකුව හා ලංකා බැංකුව හරහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට මුදල් බැර වන බවත් මුල් අවස්ථාවේ දී මහජන බැංකුව පමණක් එලෙස ලැබෙන චෙක්පත් නිශ්කාෂණය වූ පසු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගිණුමට බැර කළ ද, අදාළ නිවැරදි කිරීම්වලින් පසු 2023 අගෝස්තු මස සිට ලංකා බැංකුව විසින් ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගිණුමට මුදල් බැර කරනු ලබන්නේ චෙක්පත් නිශ්කාෂණය වූ පසුව බවත් ප්‍ර.ග.නි / ග.නි ප්‍රකාශ කළේය.<br><br>එසේම, අගරු චෙක්පත් 3 කට වඩා ලබා දෙන බදු ගෙවන්නන්ගේ නම් අසාධු ලේඛනගත කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන බවත් ඒ අනුව, එම බදු ගෙවන්නන් පිළිබඳව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් වන බැවින් එවැනි පුද්ගලයන්ට තවදුරටත් චෙක්පත් මගින් බදු ගෙවීමට ඉඩ ලබා නොදීමට පියවර ගැනීමට හැකියාව ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත චෙක්පත් මගින් බදු ගෙවීමේ දී චෙක්පත් අගරු වීම නිසා ඇතිවන ගැටළුවලට විසඳුම් ලෙස බැංකු ඇපකර යොදා ගැනීමට ඇති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | හැකියාව පිළිබඳව මහබැංකුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු කරන ලෙස කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදි.<br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක MF 06/ 4/ IRD/ COPA/ 2023 හා 2024.01.08 දිනැති ලිපිය මගින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත චෙක්පත් මගින් බදු නොගෙවිය යුතු බවට තීරණය කරන්නේ නම් එය පනතට හඳුන්වාදෙන රෙගුලාසියක් මගින් හෝ පනත සංශෝධනය මගින් කළ යුතු බවට නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණය කර ඇති බව දන්වා ඇත.** |
| | ***ආදායම් පරිපාලන තොරතුරු කළමනාකරණ පද්ධතිය (RAMIS) දත්ත පද්ධතිය*** | RAMIS 2.0 (version) මේ වන විට ක්‍රියාත්මක කර අවසන් කර ඇති බවත් තක්සේරු වර්ෂ 2018-2019 සඳහා ආදායම් බදු වාර්තා ක්‍රියාවලිය මේ හරහා සිදු කළ හැකි බවත් ඉදිරි තක්සේරු වර්ෂ 3 සඳහා පද්ධතියේ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම 2023 දෙසැම්බර් මස අවසන් කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>RAMIS පද්ධතියට ආයතන 06 ක් සම්බන්ධ වී ඇති බවත් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මෙම පද්ධතිය හා සම්බන්ධ වීමේ දී ඇති වූ ඇතැම් තාක්ෂණික බාධාවන් නිසා එම දෙපාර්තමේන්තුවට සම්බන්ධ වීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | නොහැකි වී ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ e-ROC පද්ධතියේ සමාගම් ලියාපදිංචි වීමේ දී ඒවායේ ලිපිනයන් ඇතුළත් කිරීමේ දී එහි ඇති අක්ෂර (Characters) සංඛ්‍යාවේ ගැටළුවක් හේතුවෙන් RAMIS පද්ධතිය හා සම්බන්ධ වීමට නොහැකි බව මෙහිදී ප්‍රකාශ විය. RAMIS පද්ධතියේ ලිපිනය ඇතුළත් කිරීමට අක්ෂර 40 ක සීමාවක් පවතින බව මෙහි දී අනාවරණය විය.<br><br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS 2.0 අක්ෂර සංඛ්‍යාව 60 දක්වා වැඩි කිරීමට කටයුතු කරන බව මෙහි දී ප්‍රකාශ විය.<br><br>සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ පවතින මෙම ගැටළුව හේතුවෙන් RAMIS පද්ධතිය සම්බන්ධයෙන් පත් කළ තාක්ෂණික කමිටුවේ වාර්තාව ලබා දීම ද ප්‍රමාද වී ඇති බව එම කමිටුවේ සභාපතිනිය ප්‍රකාශ කළාය. RAMIS පද්ධතිය හා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සම්බන්ධ කිරීමේදී වෙනස් කිරීම් කළ යුතු පද්ධතිය කුමක් ද යන්න පිළිබඳව කාරක සභාව කළ විමසීමේ දී e-ROC පද්ධතියට අදාළ වෙනස්කම් සිදු කිරීම වඩා පහසු හා යෝග්‍ය බව අදාළ පාර්ශව විසින් පෙන්වා දෙනු ලැබිණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තු පද්ධතිය වෙනස් කළ හොත් එය ආයතන රැසකට බලපා හැකි බැවින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව එයට ගැලපෙන සංශෝධන කළ යුතු බවට මෙහි දී යෝජනා විය. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | විසින් පද්ධතියේ ලිපිනය ඇතුළත් කිරීම සඳහා අතිරේක ක්ෂේත්‍රයක්/ඉඩක් (Additional field) ඇතුළත් කරන ලෙසත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තු විසින් එහි අක්ෂර (Characters) සංඛ්‍යාව 60 දක්වා වැඩි කරන ලෙසත් කාරක සභාව විසින් උපදෙස් ලබා දුන්නේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සමඟ සම්බන්ධවීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් සිය දත්ත පද්ධතියෙහි අවශ්‍ය සංශෝධන සිදු කර අදාළ සම්බන්ධීකරණය සම්පූර්ණ කිරීම සඳහා ගත යුතු පියවරයන් හා ගත වන කාලය සම්බන්ධව දින වකවානු සහ ඒ සඳහා යන වියදම ඇතුළත් වාර්තාවක් 2023.12.31 ට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව සමාගම් රෙජිස්ට්‍රාර් වෙත නිර්දේශ කළේය.<br><br>සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතියට සම්බන්ධ කිරීමට අවශ්‍ය මැදිහත් වීම් කරන ලෙසත් ඒ සම්බන්ධ පූර්ණ වාර්තාවක් 2023.12.01 වන දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙසත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>RAMIS දත්ත පද්ධතිය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | පත් කළ තාක්ෂණික කමිටු 1 හි මෙම දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ අඩංගු වාර්තාව 2023.12.01 දින හෝ ඊට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස එම කමිටුවේ සභාපති වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි.<br><br>එසේම RAMIS දත්ත පද්ධතිය සම්බන්ධ නඩත්තු ගිවිසුම 2024.01.31 දිනෙන් අවසන් වන බවත්, එම පද්ධතියේ නඩත්තු කටයුතු සම්පූර්ණයෙන් ඉටු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතුව සම්පත් නොමැති බවත් මෙහි දී සඳහන් විය.<br><br>කෙසේ නමුත්, මෙම නඩත්තු ගිවිසුම තවදුරටත් දීර්ඝ කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවත් සහ එසේ දීර්ඝ කර ගැනීමට නොහැකි වුවහොත් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරමින් සිටින බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>**i. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අංක ARGC/Miscellaneous/ 2023 හා 2024.01.08 දිනැති ලිපිය මගින් Address line හි අකුරු සංඛ්‍යාව 90 දක්වා වැඩි කිරීමට IRD එකඟ නොවූ බැවින්, ROC Address line අකුරු සංඛ්‍යාව 60 දක්වා අඩු කර ඇත. එසේම ROC Address line තුනක් දක්වා වැඩි කර ඇති බව දන්වා ඇත.**<br>**ii. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක MF06/4/IRD/COPA/2023 හා 2024.01.04 දිනැති ලිපිය මගින් සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ eROC පද්ධතිය** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ **RAMIS** පද්ධතිය තාක්ෂණික වශයෙන් සම්බන්ධ කර ඇති අතර සමාගමක් ලියාපදිංචි කරන විට බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකයක් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හැකියාව ඇත. නමුත් අදාළ පද්ධතිවල ලිපිනය සඳහා ලබා දී ඇති ක්ෂේත්‍රයෙහි පවතින වෙනස්කම් මත **eROC** මගින් එවන ලද දත්ත වලංගු නොකිරීම හා නියම පිරිවිතරයන්ට යටත්ව නොතිබීම හේතුවෙන් සමහර සමාගම සඳහා **TIN** අංකයක් නිකුත් කළ නොහැකි තත්වයන් ඇත. මේ සම්බන්ධයෙන් **2023.08.18** දින පැවති රැස්වීමකදී **eROC** පද්ධතියේ ලිපිනය සඳහා අමතර පේළියක් ඇතුළත් කිරීමට ද **RAMIS** පද්ධතියේ අකුරු **40** සිට **60** දක්වා වැඩි කිරීමට ද කටයුතු කර ඇත. පසුව පරිශීලක පරීක්ෂාවක් සිදු කර මෙය පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.එසේම මෙම ක්‍රමය යටතේ **TIN** අංකයක් නිකුත් කිරීමක් පමණක් කළ හැකි බව දන්වා ඇති අතර මෙය සියලුම සමාගම් ලියාපදිංචි ඉල්ලීම් සඳහා අනිවාර්ය කළ යුතු බව යෝජනා කර ඇත.<br>**iii.** අදාල වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| 06 | <u>කැසිනෝ ව්‍යාපාර සඳහා බදු අය කිරීම</u> | කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යන ආයතන විසින් 2015 අංක 10 දරන මුදල් පනත අනුව එක් වරක් පමණක් ගෙවිය යුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | රුපියල් මිලියන 1000 ක බද්දක් ගෙවියයුතු බවත් ඒ අනුව ලංකාවේ පවතින කැසිනෝ ආයතන 04 ක් විසින් මෙම බදු මුදල් ගෙවීමට ඇති බවත් කාරක සභාවේ දී අනාවරණය විය.<br><br>එම ආයතන විසින් අදාළ බදු මුදල් නොගෙවීම හේතුවෙන් ඔවුන්ට විරුද්ධව අධිකරණයේ නඩු පවරන ලද අතර නඩු තීන්දුව අනුව එම ආයතන විසින් මාස 7 ක් ඇතුළත එකී බදු මුදල් ගෙවිය යුතු වුව ද ආයතන 2 ක් පමණක් එකී තින්දුව පරිදි එම බදු මුදල් ගෙවූ බව සඳහන් විය. එසේම ඉතිරි ආයතන දෙක එම නඩු තීන්දුවට එරෙහිව අභියාචනය කර ඇති බවත් ඒ අතරතුර එම ආයතන විසින් මාසිකව රුපියල් මිලියන 15 බැගින් බදු මුදල් ගෙවමින් සිටින බවත් තවදුරටත් අනාවරණය විය.<br><br>ඊට අමතරව එම ආයතන වාර්ෂික බදු මුදල් (Annual Levy) ගෙවීම ද පැහැර හැර ඇති බැවින් ඊට එරෙහිව ද නඩු කටයුතු ආරම්භ කර ඇති බව ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය. |
| 07 | <u>නව බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම</u> | බදු ආදායම් වැඩි කර ගැනීමට අවශ්‍ය බදු ජාලය වැඩි කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ක්‍රමවේද සහ මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව විසින් විමසන ලදි.<br><br>2023 ජනවාරි මස සිට 2023 ඔක්තෝබර් 31 දක්වා නව ආදායම් බදු ලිපිගොනු 198,253ක් විවෘත කර ඇති බවත් 2024 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ජනවාරි මස සිට වයස අවුරුදු 18 ට වැඩි සෑම පුද්ගලයකුම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. මේ සම්බන්ධයෙන් වැදගත් විය හැකි තොරතුරු ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි බව කාරක සභාව පෙන්වා දුන්නේය.<br><br>විද්‍යුත් මාධ්‍ය ආයතන හරහා දැනුවත් කිරීම් සහ දුරකථන කෙටි පණිවුඩ (SMS) හරහා අදාළ දැනුවත් කිරීම් සිදු කරන බවද ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. බදු අයකර ගැනීම සඳහා පුද්ගලයන් වෙත TIN අංක (Taxpayer Identification Number) නිකුත් කර දත්ත විශ්ලේෂණය කර අදාළ පුද්ගලයන් වෙත බදු බැඳියාවක් ඇත්නම් ස්වේච්ඡාවෙන් ලියාපදිංචියට ඉඩදීමත්, එසේ නොකරන්නේ නම් ලියාපදිංචිය අනිවාර්ය කිරීමත් (Force Registration) සිදු කරන බව ප්‍ර.ග.නි / ග.නි ප්‍රකාශ කළේය. |

**ශ්‍රී ලංකා රේගුව**

***(2019, 2020 හා 2021 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව)***

**විමර්ශනය කරන ලද දිනය - 2023 නොවැම්බර් 17**

**කැඳවන ලද ආයතන -**

- ❖ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
- ❖ ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය
- ❖ ශ්‍රී ලංකා රේගුව
- ❖ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| 01 | **<u>ශ්‍රී ලංකාව තුළ පවතින අවිධිමත් වෙළෙඳාම (informal trading), මුල් අවස්ථාවේදී ආනයනවලින් 10% වුවද වර්තමානයේදී 40% ක් වීම හේතුවෙන් විශාල රේගු බදු ආදායමක් අහිමි වන බව.</u>** | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2525 අංකය යටතේ වසරකට වඩා අඩු කාලයකට තාවකාලික ආනයනකරුවන් ලෙස ලියාපදිංචි වන පුද්ගලයන් සඳහා ලැබෙන බදු සහනය ලබාගන්නා පුද්ගලයන් සංඛ්‍යාව වැඩි වීම මීට හේතුව බව ප්‍ර.ග.නි / ග.නි ප්‍රකාශ කළේය. මෙම බදු අයකර ගැනීමට ශ්‍රී ලංකා රේගුවෙන් අවශ්‍ය පියවර ගත යුතු බව කාරක සභාව යෝජනා කළේය. අවිධිමත් වෙළෙඳාම (informal trading) සඳහා ද බදු අය කර ගැනීම පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා පවත්වා ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. මෙම ගැටළුව විසඳීම සඳහා සියලුම අවිධිමත් ආනයනකරුවන් වෙතින් පළමුව බදු අයකර පසුව වර්ෂ අවසානයේ අව්‍යාජ අවිධිමත් ආනයනකරුවන්ට පමණක් බදු ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු බව කාරක සභාව යෝජනා කළේය. මෙම යෝජනාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද බව ග.නි. ප්‍රකාශ කළේය.<br><br>මෙවැනි රේගු බදු අය කර ගැනීම යථා පරිදි සිදු කිරීම පිළිබඳ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා රේගුවට හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යෝජනා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>එම යෝජනා පිළිබඳව 2023.12.18 දිනට පෙර කාරක සභාවට වාර්තාවක් ලබා දෙන |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | ලෙස කාරක සභාව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි හා ශ්‍රී ලංකා රේගුවේ ගණන් දීමේ නිලධාරි (ග.නි) වෙත නිර්දේශ කළේය.<br><br>**රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ SLC/ESD/01/COPA/2023 හා 2023.12.19 දිනැති ලිපිය මගින් එවා ඇති වාර්තාව අනුව, මෙම අවිධිමත් වෙළෙඳාම මගින් අහිමිව යන බදු ආදායම සුරක්ෂිත කිරීමට අදාළ වන යෝජනා එවා ඇත.** |
| 02 | **<u>ආයෝජන මණ්ඩල බදු සහන යොදාගෙන ආනයනය කරන භාණ්ඩ මගින් සිදු කරන නිෂ්පාදන අපනයනය මගින් පෙරළා ශ්‍රී ලංකාවට වෙළෙඳ වාසියක් අත්වන්නේද යන්න පසුවිපරම් කිරීම.</u>** | ශ්‍රී ලංකා රේගුවේ "ආසිකුඩා" පද්ධතිය මගින් ආයෝජන මණ්ඩල තොරතුරු සටහන් කරන බව ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මේ පිළිබඳව අධ්‍යයනය කර ශ්‍රී ලංකා රේගුවේ ආයෝජන මණ්ඩල පිළිබඳ කටයුතු කරන අංශයෙන් හා ආයෝජන මණ්ඩලයෙන් 2023.12.18 දිනට පෙර කාරක සභාවට වාර්තා ලබා දීමට පියවර ගන්නා ලෙස කාරක සභාව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි, ආයෝජන අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි හා ශ්‍රී ලංකා රේගුවේ ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ SLC/ESD/01/COPA/2023 හා 2023.12.19 දිනැති ලිපිය මගින් එවන ලද වාර්තාව අනුව අපනයන මගින් ලැබෙන ප්‍රේෂණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය වන පද්ධතිය මගින් නිරීක්ෂණය කර අපනයනය මගින්** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **පෙරළා ශ්‍රී ලංකාවට වෙළෙඳ වාසියක් අත් වන්නේද යන්න තීරණය කළ හැකි බව දන්වා ඇත.** |
| 03 | **<u>ශ්‍රී ලංකා රේගුවේ වැඩිදියුණු කරන ලද අභ්‍යන්තර මෘදුකාංගය (ASYCUDA) හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැමිස් (RAMIS) පද්ධතියෙහි සම්බන්ධීකරණය.</u>** | "ආසිකුඩා" (ASYCUDA) පද්ධතිය මගින් ආයතන 14ක් සම්බන්ධීකරණය වන බව ද එමගින් ආයෝජන මණ්ඩල තොරතුරු සටහන් කරන බව ද එම පද්ධතිය මෙම වසර අවසානයේ තවදුරටත් වැඩිදියුණු කරන බව හා ශ්‍රී ලංකා රේගුවේ අදාළ දත්ත ද රැමිස් (RAMIS) පද්ධතිය වෙත යොමු කරන බව ග.නි. ප්‍රකාශ කළේය. තව ද, ස්වයංක්‍රිය අවදානම් කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කිරීම සිදු කරන බව ද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br>ශ්‍රී ලංකා රේගුවේ අභ්‍යන්තරව වැඩිදියුණු කරන ලද ASYCUDA හා බාහිර ආයතන සමග සම්බන්ධිත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතීන් මගින් සැපයෙන තොරතුරු තාක්ෂණ කළමනාකරණ විසඳුම් පිළිබඳ සවිස්තරාත්මක දින වකවානු සහිත වාර්තාවක් 2023.12.18 දිනට පෙර කාරක සභාවට ලබාදෙන ලෙස කාරක සභාව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි හා ශ්‍රී ලංකා රේගුවේ ග.නි වෙත නියෝග කළේය.<br><br>**රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ SLC/ESD/01/COPA/2023 හා 2023.12.19 දිනැති ලිපිය මගින් මේ පිළිබඳ වාර්තාව එවා ඇති වාර්තාවට අනුව,** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | **මෙම පද්ධතියට මේ වන විට බාහිර රාජ්‍ය ආයතන 18ක් සම්බන්ධ වී ඇත.** |
| 04. | **<u>2021 අප්‍රේල් 06 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.</u>**<br>**<u>නියෝග අංක 01</u>**<br>නැගෙනහිර පළාත් ජල සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ජපන් රජය විසින් ලබා දී ඇති ආධාරයක් මත ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය විසින් එම ව්‍යාපෘතියට අවශ්‍ය DI පයිප්ප හා උපාංග ගෙන්වීමේ කාර්යය පැවරූ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඒ සඳහා අවශ්‍ය උපාංග ලබා ගැනීම සඳහා M/S Access International (Pvt) Ltd ආයතනය වෙත ලබා දුන් කොන්ත්‍රාත්තුව ප්‍රකාරව Access ආයතනය විසින් ඇ.ඩො. 5,139,621/- ක් ලෙස ගුදම් ගත කර තිබූ භාණ්ඩ, ගුදමෙන් නිදහස් කර ගැනීමේ දී දේශීයව සැකසූ ඉන්වොයිස් භාවිත කර ඇ.ඩො. 6,350,364/- ක් ලෙස වටිනාකම දක්වා, ව්‍යාජ තොරතුරු සහිත ආනයන සටහන්කර ඉදිරිපත් කර ඇ.ඩො. 1,210,743/- ක වටිනාකමක් M/S Access ආයතනය වෙත වැඩිපුර ලබා ගැනීමට අවස්ථාව සලසා තිබීම. | මේ සම්බන්ධයෙන් 2021 ජූලි 24 දින රේගු අධ්‍යක්ෂ ජනරාල් පත් කළ කමිටුවේ නිර්දේශ වසර 2කට පමණ පසු 2023 ජූනි 01 දින ලබා දී තිබුණද සිද්ධියට සම්බන්ධ කිසිදු නිලධාරියෙකුට දඬුවම් නිර්දේශ කර නොතිබුණි.<br><br>**<u>කමිටු නිර්දේශ</u>**<br><br>I. දීර්ඝ කාලයක් පුරා පරිචයක් ලෙස ක්‍රියාත්මක කළ වැරදි ක්‍රමවේදයන් සඳහා එක් නිලධාරි කණ්ඩායමකට පමණක් විනයානුකූලව කටයුතු කිරීම සමානයන්ට අසමාන ආකාරයකින් සැලකීමක් බව.<br><br>II. සිද්ධියට සම්බන්ධ නිලධාරීන් විශ්‍රාම ගොස් ඇති බැවින් විනය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන බව.<br><br>III. භාණ්ඩ ගුදම්ගත කිරීම/ ගුදමෙන් ඉවත් කිරීමට අදාළ උපදෙස් සහිත දෙපාර්තමේන්තු නියෝගයක් නිකුත් කිරීම.<br><br>IV. රේගු නිලධාරීන්ට ගුදම්ගත කිරීම පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා දීම.<br><br>V. ව්‍යාපෘතියෙන් රජයට යම් පාඩුවක් සිදුව ඇත්ද යන්න පිළිබඳ සොයා බැලීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා එහි රේඛීය අමාත්‍යාංශයට දන්වා යැවීම.<br><br>භාණ්ඩ ගුදම්ගත කිරීමේදී භාණ්ඩවල සඳහන් නියම වටිනාකමට වැඩි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | තවද, පළමු අවස්ථාවේ ගුදමට භාණ්ඩ භාරගැනීමේ දී ගෙවිය යුතු බදු ගණනය රු.263,301,203/-ක් වුවද, දෙවැනි අවස්ථාවේ දී බදු ගණනය රු.325,800,859/- ක් ලෙස පෙන්වා තිබූ බැවින්, ශ්‍රී ලංකා රජය විසින් රු.62,499,656 /-ක මුදලක් වැඩිපුර ගෙවා තිබීම.<br><br>රජය විසින් ලබා ගත් ණය මගින් සිදුකරනු ලබන මේ ආකාරයේ ව්‍යාපෘති වලදී රජය ලබා ගත්තා වූ ණය මුදල හා පොළි මුදල පියවීමට සිදුවන බැවින් ඉදිරියේ දී මෙවැනි තත්වයන් ඇති නොවන පරිදි කටයුතු කරන ලෙස ග.නි. වෙත 2021 අප්‍රේල් 06 දින පැවති රැස්වීමේදී කාරක සභාව නිර්දේශ කර තිබුණි. | වටිනාකමක් ගුදමෙන් නිදහස් කර ගැනීමේදී ප්‍රකාශ කිරීම මගින් ශ්‍රී ලංකා රේගුවට වැඩි බදු ප්‍රමාණයක් ගෙවා ඇති බව ද ඒ හේතුවෙන් M/S Access International (Pvt) Ltd ආයතනය විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් වැඩි මුදල් ප්‍රමාණයක් ලබා ගෙන ඇති බව ද ශ්‍රී ලංකා රේගුවේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මේ සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක. ESD/04/2021/06 හා 2021.07.24, 2022.04.27 හා 2022.07.08 දිනැති ලිපි මගින් පත් කළ මූලික විමර්ශන කමිටුවේ නිර්දේශ ඇතුළත් 2023.06.01 දිනැති වාර්තාව පරිශීලනය කර එමගින් ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දී ඇති නිර්දේශ අංක 04 පිළිබඳව (Access International (Pvt) Ltd සමග එළඹි ගිවිසුම අනුව සහ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් සපයන JICA (Japan International Cooperation Agency) ආයතනය සමග එළඹි ගිවිසුම් ප්‍රකාරව යම් අක්‍රමිකතාවයක් සිදුවී ඇතිද සහ එමගින් රජයට පාඩුවක් සිදුවී ඇතිද යන්න සොයා බැලීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස) 2023.12.18 දිනට පෙර කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 06 දෙනෙකුගෙන් සමන්විත** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **කමිටුවක් පත්කර ඒ අනුව සකස් කරන ලද කමිටු වාර්තාව ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක FIN/01/01/06 හා 2021.12.12 දිනැති ආවරණ ලිපිය මගින් එවා ඇත.** |
| 05 | <u>**නියෝග අංක 02**</u><br>නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය සඳහා අවශ්‍ය වන ගල් අඟුරු සැපයීම සිදු කිරීමට, රාජ්‍ය සමාගමක් වන Lanka Coal Company (Pvt) Ltd ආයතනය විසින් 2016 වර්ෂයේදී ගල් අඟුරු ආනයනය කළ අවස්ථා 66 කදී එකී ගල් අඟුරුවල මි.ර.ගැ. (CIF) වටිනාකම පිළිබඳ නිවැරදි තොරතුරු අනාවරණය නොකිරීම පදනම් කරගෙන අඩුවෙන් අය කරගෙන තිබූ රු.මිලියන 187කට ආසන්න වැට් (VAT) බද්ද නැවත අයකර ගැනීම සඳහා සිදු කළ රේගු විමර්ශනය අනුව අඩුවෙන් ගණනය කළ වැට් බද්ද අතිරේක බද්දක් ලෙස අයකර නොගෙන රු.මිලියන 205 ක දණ්ඩණයක් පනවා ඉන් 70% ක් නිලධාරීන්ගේ ත්‍යාග හා සුභසාධනය වෙනුවෙන් වෙන්කිරීම හේතුවෙන් රජයට බදු ආදායම රු.මිලියන 125.5ක් අහිමි වීම. | බොහෝ අවස්ථාවලදී පශ්චාත් රේගු විමර්ශන මගින් රජයට අහිමි වූ බදු අයකර ගැනීම වෙනුවට දණ්ඩන පනවා ඉන් විශාල මුදල් ප්‍රමාණයක් ත්‍යාග අරමුදලට බැර කර ගැනීම සිදු වන බැවින් රජයට විශාල මුදලක් අහිමි වන බව මෙහිදී අනාවරණය විය. එවැනි අවස්ථාවලදී ආරම්භක අවස්ථාවේදීම නිසි පරිදි නිවැරදි බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් ද මුදල් අයකර ගත යුතු බව කාරක සභාව යෝජනා කළේය. කෙසේ වුවද, ප්‍රායෝගිකව රේගු භාණ්ඩ නිදහස් කිරීමේදී බැලූ බැල්මට වංචා/අක්‍රමිකතා අනාවරණය නොවන බැවින් සියලුම භාණ්ඩ පශ්චාත් විගණනයට යටත් වන බවට පූර්ව කොන්දේසියක් සටහන් කර භාණ්ඩ නිදහස් කරන බව ද පසුව සිදු කරන විමර්ශන වලින් වැරදි අනාවරණය කර ගැනීම සඳහා ඇතැම් අවස්ථාවන්හිදී විශාල කාලයක් ගතවන බව ද මෙහිදී ග.නි. ප්‍රකාශ කළේය.<br><br>තවද, වර්තමානයේදී දණ්ඩන මුදලින් 30% ක් රජයට ලබා දීමට, 50% ක් නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට හා 20% ක් නිලධාරීන්ගේ සුබසාධනයට ද වෙන් කිරීමට සිදු වන බව ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | පූර්ව ගිණුම් කාරක සභාවේ නිර්දේශ මත ඉහත ගැටළුව පිළිබඳව විමර්ශනය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් පත් කළ කමිටුවට එහි විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර අදාළ වාර්තාව ඉදිරි මාස 2ක තුළ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස 2021.04.06 දින පැවති රැස්වීමේදී ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කර තිබිණි. | |
| 06 | <u>**නියෝග අංක 03**</u><br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2011 වර්ෂයේ දී ආනයනය කර තිබූ රු.මිලියන 11,498ක් වටිනා දොඹකර යන්ත්‍ර 36 කට අදාළ රේගු සටහන්කර ඉදිරිපත් නොකිරීම පදනම් කරගෙන රේගු විමර්ශනයක් ආරම්භ කර රු.මිලියන 1,580ක් වරාය අධිකාරියට දණ්ඩන ලෙස පනවා ඉන් 50%ක් එනම් රු.මිලියන 790ක් ත්‍යාග ලෙස ලබා ගැනීම සඳහා උත්සාහ කර තිබීම.<br><br>උක්ත කරුණ සම්බන්ධව නීතිපතිතුමාගේ මතය විමසීමට 2021.04.06 දිනැති පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් තීරණය කර තිබුණි. පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වල දී ලබා දුන් අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගත්තා වූ ක්‍රියාමාර්ග සහ | 2011 වර්ෂයේ ගෙනෙන ලද මෙම දොඹකර පිළිබඳ වරාය අධිකාරිය විසින් 2016 වර්ෂය වන තෙක් ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කර නොමැති බව ග.නි ප්‍රකාශ කළේය. කෙසේවුවද, ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේද සාමාජිකයෙකු වන බැවින් මෙය පරිපාලන ගැටළුවක් බව කාරක සභාව අවධාරණය කළේය. තවද, වරාය අධිකාරිය වැනි රජයේ ආයතන වලින් මෙලෙස දණ්ඩන අය කරගන්නා ආකාරය යුක්ති සහගත නොවන බැවින් අනාගතයේදී රාජ්‍ය ආයතන දණ්ඩනයට ලක් කිරීමේදී එම දණ්ඩන මුදල මහා භාණ්ඩාගාරයට ලැබෙන ලෙස නීති සංශෝධනය කිරීම පිළිබඳව සලකා බැලිය යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | ඒවායෙහි වර්තමාන තත්වයන් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කිරීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කර තිබුණි.<br><br>2021.07.24 දින රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තිදෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කර තිබූ අතර වසර 2 ට අධික කාලයක් ගතව තිබුණද, මේ සම්බන්ධ අවසාන වාර්තාවක් නිකුත් කර නොතිබුණි. | |
| 07 | **<u>රේගු ආඥා පනත සංශෝධනය</u>** | තෝරා ගත් වගන්ති සංශෝධනට ලක් කිරීමට නියමිත බව ග.නි. ප්‍රකාශ කළේය. මෙම සංශෝධන 2024 වර්ෂයේ ජනවාරි වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මෙම සංශෝධන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට, නීතිපති දෙපාර්තමේන්තුවට, අමාත්‍ය මණ්ඩලයට හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා දින වකවානු ඇතුළත් වාර්තාවක් 2023.11.27 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි හා ශ්‍රී ලංකා රේගුවේ ග.නි වෙත නියෝග කළේය.<br><br>**රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ SLC/ESD/01/COPA/2023 හා 2023.12.19 දිනැති ලිපිය මගින් රේගු ආඥා පනතේ 47 හා 57 සමග 2006 අංක** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **01 දරන රජයේ ආදායම් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය පිළිබඳ වර්තමාන තත්වය ඇතුළත් වාර්තාව එවා ඇත.** |
| 08 | 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2432 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරි දීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.1,839,078,959 ක් ද රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,086,992,639 ක් ද වශයෙන් එකතුව රු.2,926.071,598 ක් ගෙවා තිබූ අතර එකී වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ සාක්ෂිය වන සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ඇඟිලි සලකුණු වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැති බව. | විශේෂ හේතූන් මත ශ්‍රී ලංකා රේගුවේ කාර්යයන්වල ස්වභාවය අනුව ඇඟිලි සලකුණු යන්ත්‍රවලින් බැහැරවීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අනුමැතිය ලබා ගැනීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී උපදෙස් ලැබුණු නමුත් මෙම අනුමැතිය ලබාදීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද බව ග.නි. ප්‍රකාශ කළේය. එබැවින්, 2024 ජනවාරි 01 දින සිට සියලුම නිලධාරීන් සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමට ශ්‍රී ලංකා රේගුවේ විධායකය විසින් තීරණය කරන ලද බව හෙතෙම ප්‍රකාශ කළේය. කෙසේවුවද, මෙහි ප්‍රායෝගික ගැටලු පවතින බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>**නිර්දේශ**</u><br>ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කිරීමේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව එම යන්ත්‍ර ඉතා ඉක්මනින් ස්ථාපිත කර භාවිතය ඇරඹිය යුතු බවත් මෙය රාජකාරිමය කටයුතු වලට අනුව ප්‍රායෝගිකව සිදු කිරීම අපහසු අවස්ථාවලදී පමණක් ඒ පිළිබඳ පැමිණීමේ සටහනක් යෙදීමට කටයුතු කරන ලෙසත් නිර්දේශ කළේය.<br><br>**රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ SLC/ESD/01/COPA/2023 හා 2023.12.19 දිනැති ලිපිය මගින් 2024** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **ජනවාරි 01 දා සිට මෙම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කරන බව ශ්‍රී ලංකා රේගුව සඳහන් කර ඇත.** |
| 09 | ආනයනය හා අපනයනය කරන බහාලුම්වලට අදාළව රේගු වැරදි හඳුනා ගැනීම වෙනුවෙන් ඇ.ඩො. 21,590,000 ක් වටිනා පරිලෝකන යන්ත්‍ර (Scanners) 4ක් ශ්‍රී ලංකා රජය පූර්ණ වැය බර දරමින් 2021 වර්ෂයේ දී ස්ථාපිත කර රේගුවට පවරා දී තිබුණි. මෙහිදී විදේශ විනිමය අර්බුද සැලකිල්ලට නොගෙන ඇ.ඩො. 21,590,000 ක් දින 180 කින් ගෙවා නිම කර ස්කෑන් යන්ත්‍ර මිලදී ගැනීමට තීරණය කර තිබුණි.<br><br>රේගු නිෂ්කාශන ක්‍රියාවලිය සඳහා පූර්ණ එක්ස්රේ පරිලෝකනයක් මෙම යන්ත්‍ර මිලදී ගැනීම තුළින් අපේක්ෂා කර තිබුණ ද එය ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රකාශිත භාණ්ඩ අයිතමයන් අතර සඟවා ඇති අයිතමයන් හඳුනා ගැනීම, ව්‍යාජ භාණ්ඩ ප්‍රකාශ කිරීම් සංඛ්‍යාව අඩු කිරීම, තහනම් හා නීති විරෝධී භාණ්ඩ ආනයනය අවම කිරීම යන අපේක්ෂිත සැලසුම්වලට ළඟාවීමට නොහැකි වීම. | මෙම ස්කෑන් යන්ත්‍ර ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් පෞද්ගලික සමාගමකට පවරා ඇති බව ද ගිවිසුම් ප්‍රකාරව ස්කෑන් කරන බහාලුම් සඳහා එම බහාලුම් අයත් ආයතන විසින් ඉහත පෞද්ගලික සමාගමට එක් බහාලුමක් වෙනුවෙන් ඩොලර් 10 බැගින් ගෙවිය යුතු බව ද ග.නි ප්‍රකාශ කළේය. පසුගිය වර්ෂවල අපේක්ෂිත බහාලුම් ප්‍රමාණය නොපැමිණීම හේතුවෙන් අදාළ පෞද්ගලික සමාගමට ගෙවීම් සිදු කිරීම අපහසු වූ බැවින් එම යන්ත්‍ර ගිවිසුම් කාලයෙන් වසර 5කට පසු (මුල් ගිවිසුම වසර 8 කට) ඇ.ඩො. මිලියන 21 කට රජයට මිලදී ගැනීමට හා ගිවිසුම අනුව රඳවා ගත් මුදල කොටස් වශයෙන් ආපසු ගෙවීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් පත් කළ විශේෂ කමිටුවක් මගින් තීරණය වී ඇති බව ද හෙතෙම ප්‍රකාශ කළේය. මෙහි ක්‍රියාත්මකභාවයේ තාක්ෂණික ගැටළු ඇති බව ද හෙතෙම ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මෙම ස්කෑන් යන්ත්‍රවල තාක්ෂණික ගැටළු විසඳීම පිළිබඳ යෝජනා සිදු කර මෙම ස්කෑන් යන්ත්‍ර කාර්යක්ෂමව භාවිතා කිරීමට කටයුතු කරන ආකාරය පිළිබඳව දින වකවානු සහිත වාර්තාවක් 2023.12.18 දිනට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව මුදල්, ආර්ථික ස්ථායීකරණ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි හා ශ්‍රී ලංකා රේගුවේ ග.නි වෙත වෙත නිර්දේශ කළේය.<br><br>**රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SLC/ESD/01/COPA/2023 හා 2023.12.19 දිනැති ලිපිය මගින් ස්කෑන් යන්ත්‍ර භාවිතයේදී නිරීක්ෂණය වූ ගැටළු හා එම ගැටළු නිරාකරණයට අදාළ යෝජනා ඇතුළත් වාර්තාව එවා ඇත.** |
| 10 | විමර්ශනයන්ගෙන් පසුව රේගු භාරයට ගන්නා ලද, රාජසන්තක කරන ලද සහ වෙනත් නියාමන ආයතන විසින් රේගුවට බාර දෙන ලද වාහන සහ බහාලුම් රාශියක් රේගුවේ විවිධ ස්ථානවල රඳවා තිබුණු අතර 2023 ඔක්තෝබර් 31 දිනට ස්ථාන 14 ක රථවාහන 668 ක් ද, බහාලුම් 736 ක් ද පැවතුණි. ඒ අතුරින් වෙන්දේසි හෝ අපහරණය කරන තෙක් රේගු අධීක්ෂණයේ රඳවා ගැනීම සඳහා පෞද්ගලික ආයතනයකින් කුලියට ගත් අංගනයේ (SALT YARD) රථවාහන 419 ක් ද, බහාලුම් 92ක් ද ගාල් කර තිබුණු අතර ඉන් වාහන 261ක් සහ බහාලුම් 86ක් වසර 05කට වඩා අධික කාලයක සිට එම භූමියේ රඳවා තිබුණි. ඉන් වාහන 133 ට අදාළ විමර්ශන ගොනු අස්ථානගතව පැවතුණි. | වරාය අධිකාරියේ ශ්‍රී ලංකා රේගුවට වෙන් කරන ලද ගුදම ඉවත් කර ගැනීම නිසා මෙම අංගනය කුලියට ගැනීමට සිදු වූ බව ද ඒ අවස්ථාවේදී වාහන හුවමාරු කිරීමේදී මෙම වාහන 133 ට අදාළ විමර්ශන ගොනු අස්ථානගත වීම සිදු වූ බව ද ග.නි ප්‍රකාශ කළේය. එම වාහනවලට තාවකාලික ගොනු විවෘත කර වෙන්දේසි කිරීමට තීරණය කර ඇති බව ද වාහන 66කට රස පරීක්ෂක වාර්තා කැඳවා ඇති බව ද හෙතෙම ප්‍රකාශ කළේය. වාහන 90ක් TIP නියෝගය මත රඳවා ගෙන ඇති බව ද වාහන 150 ක පරීක්ෂණ පවතින බවද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>මේ අතුරින් ධාවනයට යොමු කළ නොහැකි වාහන තාක්ෂණ විෂය පවතින පාසැල් වලට අධ්‍යයන කාර්යයන් සඳහා ලබාදීමට කටයුතු කිරීමේ හැකියාව සොයා බලන ලෙස කාරක සභාව යෝජනා කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | 2015 සිට 2020 කාල පරිච්ඡේදය දක්වා පමණක් රේගුව අදාළ එම පෞද්ගලික සමාගම සමග විධිමත් ගිවිසුමකට එළඹ තිබුණු අතර ඉන්පසුව 2023 ජනවාරි දක්වා අවස්ථා 05කදී කාලය දීර්ඝ කරමින් භූමිය ප්‍රයෝජනයට ගෙන තිබුණි. 2015 වර්ෂයේ සිට 2023 ජනවාරි දක්වා අදාළ පෞද්ගලික ආයතනයට ගෙවූ මුළු කුලී මුදල් එකතුව රු. 77,485,548 ක් වූ අතර 2023 පෙබරවාරි මාසයේ සිට නැවතත් මාසිකව රු. 4,650,000 කුලී මුදලකට එම ආයතනය සමග රේගුව ගිවිසුම්ගතව තිබුණු බව. | |
| 11 | 2000 වර්ෂයේ දී අත්අඩංගුවට ගන්නා ලද දුම්වැටි තොගයකට අදාළ විමර්ශනයකින් පසුව ඒවා ප්‍රති නැවිගත කරන ලෙස දැනුම් දී තිබියදී ඊට පටහැනිව වෙන්දේසි කර රු. මිලියන 5.9 ක මුදලකට විකුණා දැමීම නිසා දුම්වැටි තොගය නැවිගත කරන ලද විදේශීය පුද්ගලික ආයතනය ශ්‍රී ලංකා රේගුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි. ශ්‍රී ලංකා රේගුව දිසා අධිකරණ තීන්දුවෙන් පසු සිවිල් අභියාචනාධිකරණයට හා ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වුවද, ලද තීන්දු සියල්ලන්ගෙන්ම වැරදිකරු වී තිබුණි. ඒ අනුව ශ්‍රී | <u>**නිර්දේශ**</u><br>මේ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් 2023.12.17 දිනට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි හා ශ්‍රී ලංකා රේගුවේ ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ SLC/ESD/01/COPA/2023 හා 2023.12.19 දිනැති ලිපිය මගින් නීතිමය කෘත්‍යයට අදාළ සම්පූර්ණ වාර්තාව එවා ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | ලංකා රේගුවට මෙම වැරදි තීරණය මත ගෙවීමට සිදුවූ මුළු අලාභය රු. මිලියන 69.4 ක් විය. මෙම විමර්ශනයට අදාළ ගොනුව ද අස්ථානගතවී තිබුණු අතර ඊට වගකිවයුතු නිලධාරීන්ට සහ ඉහත වැරදි තීරණයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව මු.රෙ.102 සිට 110 ප්‍රකාරව කිසිදු පියවරක් ගෙන නොතිබුණු බව. | |
| 12 | බන්දිත ගුදම් (Manufacture in Bond - MIB) පහසුකම ලබාගත් යම්කිසි කර්මාන්තයකට අදාළව භාණ්ඩ දේශීය වෙළඳපොළට නිකුත් කිරීමේ දී ආනයන සේ සලකා තීරු බදු ගණන් බැලිය යුතු වුව ද, එවැනි සමාගම් 2 ක් අංක 1448/1 හා 2006 ජුනි 05 දිනැති කර්මාන්ත විෂයභාර අමාත්‍යාවරයා විසින් නිකුත් කරන ලද "දේශීයව සියයට 30 ට නොඅඩු අගයක් සහිත උපාංග යොදා ගනිමින් එකලස් කරන වාහන සඳහා ලබා දෙන සියයට 70 ක බදු සහනය" ලබා ගනිමින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.7,191,949,084 ක නිෂ්පාදන බදු ගෙවීම පැහැර හැරීම. | මෙම MIB Facility ලබා දීමේ ක්‍රියාවලිය පිළිබඳ ගැටලුව නිරාකරණය කර ගැනීමට අවස්ථාවක් ලබා දෙන ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත ශ්‍රී ලංකා රේගුව විසින් ඉල්ලීම් කර ඇති බව මෙහිදී අනාවරණව විය. <br><br> කර්මාන්ත අමාත්‍යාංශය ලබා දෙන සහතිකය පරිදි ලබා දෙන නියෝගය අනුව මෙම බදු සහනය ලබා දීමට කටයුතු කරන ලද බව ග.නි ප්‍රකාශ කළේය. මෙම සිදුවීම පිළිබඳ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රේගුව සමග සාකච්ඡා පැවැත්වූ බව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. <br><br> **නිර්දේශ** <br> මෙම සාකච්ඡා සඳහා කර්මාන්ත අමාත්‍යාංශය ද සහභාගි කරවා ගත යුතු බව සඳහන් කළ කාරක සභාව MIB Facility ලබා දීමේ ක්‍රියාවලිය පිළිබඳව ගත් තීරණය සම්බන්ධයෙන් 2023.12.18 දිනට පෙර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි හා ශ්‍රී ලංකා රේගුවේ ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මෙය ප්‍රතිපත්තිමය තීරණයක් බැවින් ඒ පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ තීරණය ලැබෙන තෙක් ශ්‍රී ලංකා රේගුවට ඒ පිළිබඳ තීරණයක් ලබාදීමට නොහැකි බව හා ඒ පිළිබඳ රේගු නිරීක්ෂණ ඇතුළත්ව රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක. SLC/ESD/01/COPA/2023 හා 2024.01.12 දිනැති මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් අමතන ලද ලිපිය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF06/04/COPA/Customs - Vol-iii හා 2024.01.18 දිනැති ආවරණ ලිපිය මගින් දන්වා ඇත.**<br><br>ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් දැනට වඩා අධීක්ෂණයක් සිදු කළ යුතු බවට කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත උපදෙස් ලබා දුන්නේය. |

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

***(2022 මුදල් වර්ෂය සඳහා වූ විගණන වාර්තාව සහ "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමේ කාර්ය සාධනය ඇගයීම" පිළිබඳ විශේෂ විගණන වාර්තාව)***

**විමර්ශනය කරන ලද දිනය - 2023 නොවැම්බර් 21**

**කැඳවන ලද ආයතන -**

❖ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |

විගණකාධිපතිවරයා විසින් 2022 මුදල් වර්ෂ පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අදාළව නිකුත් කරන ලද විගණන වාර්තාව සහ "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමේ කාර්ය සාධනය ඇගයීම" පිළිබඳ විශේෂ විගණන වාර්තාව පරීක්ෂා කිරීම සඳහා මෙම රැස්වීම කැඳවා තිබුණි.

එසේ වුවද, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීමට හැකියාවක් නොමැති බවට කොමිෂන් සභාව අදහස් කරන බැවින් අද දින කාරක සභා රැස්වීමට සහභාගි නොවීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තීරණය කළ බව දන්වමින් එම කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති අමතන ලද 2023 නොවැම්බර් 21 දිනැති ලිපිය සභාපතිතුමා විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම තීරණය තමා විසින් එම අවස්ථාවේදීම පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා, ගරු සභානායකතුමා සහ ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත දැනුම් දී උපදෙස් ලබා ගත් බව සභාපතිතුමා කාරක සභාවට දැනුම් දුන්නේය. මෙය වැරදි පූර්වාදර්ශයක් විය හැකි බැවින් වහාම කාරක සභාව රැස්වී මේ පිළිබඳව සාකච්ඡා කොට කාරක සභාවේ තීරණය තමා වෙත දැනුම් දෙන ලෙස ගරු කථානායකතුමා විසින් උපදෙස් ලබා දුන් බව ද සභාපතිතුමා දන්වා සිටියේය.

පාර්ලිමේන්තු සතු මූල්‍ය බලය සම්බන්ධයෙන් අභියෝග කිරීමට කිසිවෙකුට නොහැකි බවත්, වැය ශීර්ෂයක් මගින් මුදල් වෙන් කරනු ලබන රාජ්‍ය ආයතනවල ගිණුම් පරීක්ෂා කිරීම තුළින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුව සතු මූල්‍ය බලය ක්‍රියාත්මක කරනු ලබන බවත් කාරක සභාව සඳහන් කළේය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට පැමිණීම ප්‍රතික්ෂේප කිරීම මෙම කාරක සභාවට මෙන්ම පාර්ලිමේන්තුවට ද කරන ලද අවමානයක් බව ප්‍රකාශ කළ කාරක සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හැකි ඉක්මණින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීමට නියෝග කරන මෙන් ගරු කථානායකතුමාගෙන් ලිඛිතව ඉල්ලා සිටීමට ද කාරක සභාව තීරණය කළේය.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
| ***(2022 මුදල් වර්ෂය සඳහා වූ විගණන වාර්තාව සහ "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමේ කාර්ය සාධනය ඇගයීම" පිළිබඳ විශේෂ විගණන වාර්තාව)***<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2023 නොවැම්බර් 27** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | | |
| 01 | **<u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2023.11.21 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමට පැමිණීම ප්‍රතික්ෂේප කිරීම.</u>** | රාජ්‍ය ආයතන සඳහා අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරනු ලබන මුදල් ප්‍රතිපාදන අදාළ ආයතන විසින් පරිහරණය කළ ආකාරය සහ අත්කරගත් කාර්යසාධනය පිළිබඳව විමර්ශනය කිරීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට පැවරී ඇති මූලික කාර්යය වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) මගින් වාර්ෂිකව කරනු ලබන ඇගයීමේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ලබා ගෙන ඇත්තේ ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් බවත්, වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමද ඉතා දුර්වල මට්ටමක පවතින බවත් ගරු සභාපතිතුමා කාරක සභාව හමුවේ සඳහන් කළේය. 2023.11.21 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීමට තීරණය කරන ලද්දේ ඒ අනුව බවත් සභාපතිතුමා සඳහන් කර සිටියේය. එදින රැස්වීමට සහභාගි වීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කිරීම නිසා ගරු කථානායකතුමාගේ උපදෙස් පරිදි එම කොමිෂන් සභාව වෙත නැවත කැඳවීමේ නියෝගයක් නිකුත් කරන ලද බව සභාපතිතුමා ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කැඳවීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට බලයක් තිබේද යන්න සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයින් දීර්ඝ ලෙස සාකච්ඡා කළ බවත්, එකඟතාවයකට පැමිණීමට නොහැකි වූ බැවින් තවදුරටත් සාකච්ඡා කර තීරණයක් ගන්නා තෙක් 2023.11.21 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට නොපැමිණීමට තීරණය කළ බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් සඳහන් කරන ලදී. ඒ සම්බන්ධයෙන් යම් අපහසුතාවයක් සිදුවූයේ නම් ඒ පිළිබඳව කාරක සභාව වෙත සිය කනගාටුව ප්‍රකාශ කර සිටින බව ද හෙතෙම ප්‍රකාශ කළේය. |
| 02 | <u>**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය භාරය**</u> | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් රට වැසියන්ගේ මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධ විමර්ශන සිදුකිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරය වන බව කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් සඳහන් කරන ලදී. මූලික අයිතීන් කඩවීම සම්බන්ධයෙන් ඕනෑම පුරවැසියකුට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි අතර, විමර්ශන නිලධාරියකු විසින් කරනු ලබන මූලික විමර්ශනයකින් අනතුරුව සත්‍ය වශයෙන්ම මූලික අයිතීන් කඩවීමක් සිදු වී ඇති බව බැලූ බැල්මට පෙනී යන්නේ නම් එවැනි පැමිණිලි තම කොමිෂන් සභාව විසින් බාර ගනු ලබන බව ලේකම්වරයා සඳහන් කළේය. අනතුරුව, පැමිණිලිකාර පාර්ශ්වය හා වග උත්තරකාර පාර්ශ්වය කැඳවා පැමිණිල්ල විභාග කිරීමක් සිදු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | කරනු ලබන බවත්, සමථයකට පත් කළ නොහැකි අවස්ථාවලදී විමර්ශන නිලධාරීන් විසින් කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබන බවත්, කොමිෂන් සභාව මගින් එම නිර්දේශ අදාළ ආයතනය වෙත යොමු කරනු ලබන බවත්, එම නිර්දේශ ක්‍රියාත්මක නොකළහොත් ගරු ජනාධිපතිතුමා වෙත වාර්තා කිරීම/ නඩු පැවරීම කරනු ලබන බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගණන්දීමේ නිලධාරි (ග.නි.) සඳහන් කළේය.<br><br>අත් අඩංගුවට පත්වූ පුද්ගලයකු අදාළ පොලිස් ස්ථානය තුළ සිටින බව තහවුරු කර ගැනීම, වද හිංසා වලින් වැළැක්වීම, ඥාතීන් මුණ ගැසීමට අවස්ථාව සලසා දීම, නොපමාව අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගැනීම වැනි කටයුතු සඳහා සක්‍රීය ලෙස මැදිහත්වීම නිසා ජනතාව තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කෙරෙහි විශ්වාසයක් හා ප්‍රසාදයක් ගොඩ නැගී තිබෙන බවද ඔහු ප්‍රකාශ කළේය. |
| 03 | **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ අදාළ ආයතන/ පුද්ගලයින් විසින් ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම් සම්බන්ධ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.** | 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 15 (8) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ අදාළ ආයතන/ පුද්ගලයින් විසින් ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම් සම්බන්ධ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි වාර්තාවක් වසර ගණනකින් ඉදිරිපත් කර නොතිබීම පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කළේය.<br><br>කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි වලට අදාළ සිද්ධීන් සම්බන්ධ අධිකරණ කටයුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | අවසන් නොවීම, පැමිණිලිකාර පාර්ශ්වයෙන් සහ වග උත්තරකාර පාර්ශ්වයෙන් අවශ්‍ය සහයෝගය නොලැබීම, සමථයට පත් වූ සිදුවීම් නැවත ඉස්මතුවීම වැනි විවිධ හේතූන් නිසා විමර්ශන කටයුතු අවසන් කිරීමට කල් ගතවීම නිසා 2011 වර්ෂයෙන් පසුව ජනාධිපතිවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව ලේකම්වරයා ප්‍රකාශ කළේය. |
| 04 | <u>**පුරප්පාඩු පිරවීම**</u> | <u>***නිරීක්ෂණ/ නිර්දේශ***</u> <br> *කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර වසර 5 කට අධික කාලයක් ගතවී තිබුණද, ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාව සිය අවධානය යොමු කළේය. මේ පිළිබඳව නැවත සමාලෝචනය කොට, පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කළ හැකි ආකාරයට බඳවා ගැනීමේ පටිපාටිය (Scheme of Recruitment - SoR) සංශෝධනය කළ යුතු බවට කාරක සභාව නිර්දේශ කළේය.* <br><br> *ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවක පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පවත්නා ප්‍රමාදය කෙරෙහි අවධානය යොමු කළ කාරක සභාව, සංයුතිය අනුව සිටිය යුතු සේවක සංඛ්‍යාව (Cadre) සම්පූර්ණ කර ගැනීම සම්බන්ධයෙන් දින වකවානු ඇතුළත් වාර්තාවක් 2023 දෙසැම්බර් 27 දිනට පෙර කාරක සභාව වෙත ලබා දිය යුතු බවට එහි ගණන්දීමේ නිලධාරි වෙත නිර්දේශ කළේය.* |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | *මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක HRC/DI/AD/72 හා 2023.12.18 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.* |
| 05 | <u>**වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම**</u> | 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 30 වැනි වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් ද, 2017 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම සම්බන්ධයෙන් ද කාරක සභාව ප්‍රශ්න කළේය.<br><br>2016 සිට 2019 දක්වා වාර්ෂික වාර්තා 2022.03.30 දින හා 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2023.01.31 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බව සඳහන් කළ ග.නි. මානව හිමිකම් කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණකවරයකු නොමැතිවීම නිසා විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට නොහැකි වූ බවද සඳහන් කළේය.<br><br><u>**නිර්දේශ**</u><br>අභ්‍යන්තර විගණකවරයකු නොමැතිවීම විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට බාධාවක් නොවන බව පෙන්වා දුන් කාරක සභාව, ගණකාධිකාරී සම්බන්ධ කරගෙන වහාම නිසි පරිදි විධිමත් ආකාරයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගණන්දීමේ නිලධාරි වෙත නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| 06 | <u>දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම</u> | මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්මාණය කරන ලද, පැමිණිලි කළමනාකරණ දත්ත පද්ධතිය සහ UNDP ආයතනය විසින් ප්‍රදානය කරන ලද පරිපූර්ණ වාර්තා ලබා ගත හැකි දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම පිළිබඳව කාරක සභාව විමසා සිටියේය.<br><br>එම දත්ත පද්ධති දෙකෙහි කිසිදු ගැටළුවක් නොමැති බවත්, එහෙත් ඒවා නිසි ක්‍රියාකාරිත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය පරිගණක යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර වැනි උපාංගවල සහ කාර්ය මණ්ඩලයේ ඌනතාවයක් ද තොරතුරු ඇතුළත් කිරීමේ අඩුපාඩුවක් ද පවතින බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>ඉහළම ප්‍රමුඛතාවයක් ලබා දී මෙම දත්ත පද්ධතීන් යාවත්කාලීන කර ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් සති 2 ක් ඇතුළත (2023.12.11 දිනට පෙර) විගණකාධිපතිවරයාට ද පිටපතක් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ගණන්දීමේ නිලධාරි වෙත නිර්දේශ කළේය.<br><br>ඉහත සඳහන් ආකාරයට ප්‍රාදේශීය කාර්යාල, ප්‍රධාන කාර්යාලයේ දත්ත පද්ධතිය සමග නිසි සම්බන්ධීකරණයක් සිදු වන්නේද යන්න නිරීක්ෂණය කරන ලෙස කාරක සභාව විසින් විගණකාධිපතිවරයාට උපදෙස් ලබා දෙන ලදී.<br><br>මානව හිමිකම් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය යටිතල |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | පහසුකම් සංවර්ධනය කර ගැනීම සම්බන්ධව හැකි ඉක්මණින් මහා භාණ්ඩාගාරය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර, මෙම වසරේ ප්‍රාග්ධන වියදම් සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වැය ශීර්ෂය යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන මගින් දත්ත පද්ධතිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පරිගණක යන්ත්‍ර ඇතුළු යටිතල පහසුකම් සපයා ගැනීමට කටයුතු කරන ලෙස කාරක සභාව ගණන්දීමේ නිලධාරි වෙත නිර්දේශ කළේය.<br><br>***මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක HRC/DI/AD/76 හා 2023.12.08 දිනැති ලිපිය මගින් පහත සඳහන් කරුණු වාර්තා කර ඇත.***<br><br>2023 වර්ෂයේ මූල ධන වියදම් වෙන්වී නොමැති හෙයින් මෙම වර්ෂයේ මුදල් ලබා දිය නොහැකි බව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබෙන බැවින් 2024 වර්ෂය සඳහා වෙන් කර ඇති මූල ධන වියදම් වලින් අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා පියවර ගන්නා බව සඳහන් කර ඇත.<br><br>දත්ත පද්ධති යාවත්කාලීන කිරීමේ පියවර<br><br>• ඉහතින් සඳහන් කළ අවශ්‍ය පරිගණක උපාංග ලැබෙනතුරු දැනට තිබෙන සම්පත් භාවිතා කරමින් දත්ත පද්ධතිට හැකි උපරිම අයුරින් දත්ත ඇතුළත් කිරීමට පියවර ගැනීම.<br><br>• පරිගණක මිලදී ගැනීමෙන් පසු ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් වැඩියෙන් යොදවා ඇතුලත් නොවූ තොරතුරු ඇතුලත් කිරීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | හා දත්ත පද්ධතියේ යාවත්කාලීන නොවූ තොරතුරු යාවත්කාලීන කිරීම කඩිනම් කර පරිගණක ලැබීමෙන් පසු මාස 03 ක කාලයක් තුළ සම්පූර්ණ කිරීම. |
| 07 | <u>**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිශතය ඉතා ඉහළ මට්ටමක පැවතීම**</u> | කොමිෂන් සභාව විසින් ලබා දෙන නිර්දේශ අදාළ ආයතන විසින් ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව පසු විපරම් කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්ථාපිත කර ඇති "ක්‍රියාත්මක නොවූ නිර්දේශ අධීක්ෂණය කිරීමේ ඒකකය" තව දුරටත් ශක්තිමත් කළ යුතු බව කාරක සභාව පෙන්වා දුන්නේය. ඊට අමතරව, ක්‍රියාත්මක නොවූ නිර්දේශ සම්බන්ධයෙන් 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තාව කාර්තුවකට වරක් ලබා දීමට කටයුතු කරන ලෙස ද කාරක සභාව ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දෙන ඇතැම් නිර්දේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීමට පහත සඳහන් හේතුන් බලපා ඇති බව විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙනු ලැබිණි:<br><br>1. ඉදිරිපත් කළ නිර්දේශ චක්‍රලේඛවල අඩංගු කරුණු හා නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු ආයතනයේ අභ්‍යන්තර නීති රීති වලට අනුකූල නොවීම.<br>2. අදාළ පාර්ශ්වයන් වෙත විධිමත් පරිදි නිර්දේශ යොමු නොකිරීම. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | 3. එකම සිදුවීම සම්බන්ධයෙන් සමගාමී පරීක්ෂණ සිදුකරන ආයතනවල තීරණ පරස්පර වීම. |
| 08 | **<u>මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය භාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම</u>** | මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය භාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ තව දුරටත් පුළුල් විය යුතු බව කාරක සභාව පෙන්වා දුන්නේය. එකම සිදුවීම සම්බන්ධයෙන් විවිධ ආයතන වෙත පැමිණිලි කිරීමට ජනතාව පෙළඹෙන්නේ දැනුවත් භාවය අඩුවීම නිසා බව කාරක සභාවේ අදහස විය.<br><br>ජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබන බව ප්‍රකාශ කළ ග.නි., ඒ අනුව ජනතාවගෙන් ලිපි, ෆැක්ස් පණිවුඩ, විද්‍යුත් තැපැල් පණිවුඩ, හා අතින් බාර දීම මගින් පැමිණිලි විශාල වශයෙන් ලැබෙන බව ඔහු සඳහන් කළේය. මීට අමතරව, ජන මාධ්‍ය මගින් පෙන්වා දෙනු ලබන මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් පැමිණිල්ලකින් තොරව වුවද විමර්ශන සිදු කිරීමේ බලය (on its own motion) මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වගන්තිය මගින් තම කොමිෂන් සභාවට ලැබී තිබෙන බව ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. වසරකට සාමාන්‍යයෙන් එවැනි විමර්ශන 20 - 25 ක් පමණ සිදු කරන බව ද ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>ළමා නිවාස, වැඩිහිටි නිවාස, මානසික රෝහල්, පොලිස් ස්ථාන සහ බන්ධනාගාර වැනි ආයතනවල ස්ථාන පරීක්ෂාවන් සිදු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ඇති බව ද ග.නි. විසින් සඳහන් කරන ලදී.<br><br>__නිර්දේශ__<br>පසුගිය වසර තුළ අගතියට පත් පාර්ශ්වයන් විසින් කරනු ලබන පැමිණිල්ලකින් තොරව මාධ්‍ය මගින් පෙන්වා දෙන ලද මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලද සිද්ධීන් කවරේද?, සංඛ්‍යාත්මකව ඒ කොපමණද? හා ඒවායේ ප්‍රගතිය හා කොමිෂන් සභාව විසින් කරන ලද ස්ථාන පරීක්ෂාවන් සම්බන්ධ වාර්තාවක් 2024.01.24 දින නැවත කැඳවන අවස්ථාවේ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ගණන්දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය. |
| 09 | __විමර්ශනය නොකළ පැමිණිලි__ | __නිර්දේශ__<br>මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශනයට ලක් නොකළ පැමිණිලි රාශියක් පවතින බව පෙන්වා දුන් කාරක සභාව, එම පැමිණිලි විමර්ශනය කිරීමට ඇති වැඩ පිළිවෙළ පිළිබඳව වාර්තාවක් 2023 දෙසැම්බර් මස 27 වැනි දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගණන්දීමේ නිලධාරි වෙත නියෝග කළේය.<br><br>***මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක HRC/DI/AD/72 හා 2023.12.19 දිනැති ලිපිය මගින් පහත සඳහන් කරුණු වාර්තා කර ඇත.***<br><br>***2023.11.30 දින වන විට විමර්ශනය නොකළ පැමිණිලි සංඛ්‍යාව 9536 කි. ඒවා*** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | *කඩිනමින් විමර්ශනය කිරීම සඳහා පහත සඳහන් සැලසුම් ඉදිරිපත් කර ඇත.*<br>*1. නිලධාරීන් භාරයේ ඇති පැමිණිලි ප්‍රමුඛතාවය අනුව හා විමර්ශනය සඳහා ගතවන කාලය අනුව වර්ග කිරීම*<br>*2. පොදුවේ විභාගයට ගත හැකි ඒවා එකට විභාගයට ගැනීම.*<br>*3. අලුතින් බඳවා ගත් නිලධාරීන්ටද පැමිණිලි ගොනු ලබා දීම.*<br>*4. ජනවාරි මාසයේ බඳවා ගැනීමට නියමිත නීති නිලධාරීන් උපයෝගී කරගෙන විමර්ශන වේගවත් කිරීම.*<br>*5. UNDP ව්‍යාපෘතිය යටතේ බඳවා ගෙන ඇති සහ බඳවා ගැනීමට නියමිත නිලධාරීන්ටද විමර්ශනය නොකළ පැමිණිලි ගොනු බෙදා දී විමර්ශන කඩිනම් කිරීම.* |
| **ආරක්ෂක අමාත්‍යාංශය**<br>***(2020, 2021, 2022 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2023 නොවැම්බර් 28** | | |
| කැඳවන ලද ආයතන<br>❖ ආරක්ෂක අමාත්‍යාංශය | | |
| 01 | **<u>2018 අගෝස්තු මස 10 වැනි දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u>**<br>1996 අංක 22 දරන ගිනි අවි (සංශෝධන) පනත හා පුපුරණ | අදාළ සංශෝධන සිදු කිරීමේ ප්‍රමාද කාලය වසර 10 ඉක්මවීමෙන් බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය නොවීම මත සැලකිය යුතු ආදායමක් රජයට අහිමි වීම පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළේය.<br>2016 වර්ෂයේදී ගිනි අවි පනත සංශෝධනට අදාළව කමිටුවක් පත් කරන |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | ද්‍රව්‍ය (සංශෝධන) පනතේ විධිවිධාන සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය. | ලද බවත් අමාත්‍ය මණ්ඩල වෙනස්වීම මත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් නව අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලද බවත් ඒ අනුව, 2021 දී අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කළ පනත් කෙටුම්පත නීතිපතිවරයා වෙත යැවීමට නියමිත බව ද ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) ප්‍රකාශ කළේය. ගිනි අවි බලපත් ගාස්තු සංශෝධනය කිරීම සඳහා අයවැය යෝජනා ලබා දුන් බව ද එම ගාස්තු සංශෝධනයට සම්පූර්ණ පනතම සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පවතින බව ද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br>1996 අංක 22 දරන ගිනි අවි (සංශෝධන) පනත හා පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත යන පනත් සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා වූ දින වකවානු සහිත වාර්තාවක් 2023.12.28 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මේ පිළිබඳ වර්තමාන තත්වය සඳහන් කර ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) ගේ අංක MOD/PAC/05/COPA/2023 හා 2023.12.28 දිනැතිව ලිපියක් එවා ඇත.**<br><br>**අදාළ පනත් කෙටුම්පත මේ වන විට පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සම්මත වී ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු රෙගුලාසි (regulations) මගින් පුපුරණ ද්‍රව්‍ය බලපත් ගාස්තු 2022 වර්ෂයේදී 60% කින් පමණ ඉහළ දමා ඇති බවද, පුපුරණ ද්‍රව්‍ය පනත හා රසායන ද්‍රව්‍ය පනත අනුව නාවික සැතපුම් 12ක සීමාව ඇතුළත ලංකාව හරහා යන අන්තරායකර භාණ්ඩ ප්‍රවාහන නෞකා සඳහා ද ආරක්ෂක අමාත්‍යාංශයට ගාස්තුවක් ගෙවා අනුමැතිය ලබා ගත යුතු බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය.<br><br>තවද, ශ්‍රී ලංකා මුහුදේදී අනතුරට පත් වූ "එක්ස්ප්‍රස් පර්ල් නෞකාව" ඉහත පරිදි ආරක්ෂක අමාත්‍යාංශ අධීක්ෂණයට ලක් නොවීම කාරක සභාවේ විමසුමට ලක් වූ අතර අන්තර්ජාතික සම්මුතීන්ට අනුව ශ්‍රී ලංකා මුහුදු සීමාවේ ගමන් කරන නෞකා වලින් අදාළ ගාස්තු අයකර ගැනීම සිදු විය යුතු බවද ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ද මැදිහත් වීමක් සිදුවිය යුතු බවද කාරක සභාව පෙන්වා දුන්නේය. මේ සඳහා අදාළ පනත කෙටුම්පත් අදියරේ පවතින බවද, එමගින් ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ ගාස්තු අය කිරීම සඳහා බලය ලබාදෙන බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>ශ්‍රී ලංකා මුහුදු සීමාවේ ගමන් කරන නෞකා වලින් අදාළ ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් යෝජිත පනත් කෙටුම්පතේ වර්තමාන තත්වය පිළිබඳ වාර්තාවක් 2023.12.01 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**අදාළ පනත් කෙටුම්පත මේ වන විට පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සම්මත වී ඇත.** |
| 02 | **<u>2018 අගෝස්තු මස 10 වැනි දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u>**<br><br><u>ත්‍රිවිධ හමුදාව හා පොලීසිය විසින් බාහිර පාර්ශ්වයන් සඳහා සපයන සේවාවන් මගින් උපයන ආදායම්.</u><br><br>ත්‍රිවිධ හමුදා සම්බන්ධයෙන් වන සුබසාධක සංගම්වල වියදම්, ඒකාබද්ධ අරමුදලෙන් දරන බැවින්, එහි ආදායම් ද ඒකාබද්ධ අරමුදලට බැරවිය යුතු බවත්, එහෙත් ඇතැම් සුබසාධක සංගම්වල ආදායම් 100%ක්ම වෙනත් අරමුදල් වලට බැර කරන බවත් විගණකාධිපති විසින් පෙන්වා දෙනු ලැබිණි. ඉහත සේවා සැපයීමෙන් උපයන ආදායම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස ආරක්ෂක ලේකම් විසින් 2014 වර්ෂයේදී ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ට දැනුම් දී මෙ සම්බන්ධව නිසි ක්‍රමවේදයක් සකසා අමාත්‍යාංශයට වාර්තා | ත්‍රිවිධ හමුදාවේ අරමුදල් වල ආදායම් බැර කිරීම පිළිබඳව 2023 නොවැම්බර් මස චක්‍රලේඛයක් නිකුත්කර ඇති බව මෙහිදී අනාවරණය විය. 2023.11.03 දිනැති අභ්‍යන්තර ලිපියෙන් එම ආදායම්වලින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ආදායම් ප්‍රතිශත ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ට දැනුම් දී තිබුණි. අභ්‍යන්තර චක්‍රලේඛ මගින් ආදායම් බෙදා හැරීමේ ප්‍රතිශත තීරණය කළද ඒ සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණ බව මෙහිදී අනාවරණය විය. ප්‍රතිශත තීරණය කිරීමේ අධිකාරි බලය පැහැදිලි නොවන අතර අදාළ ප්‍රතිශත වෙන් වන්නේ පිරිවැටුමෙන් ද ශුද්ධ ලාභයෙන්ද යන්න අපැහැදිලි බව කාරක සභාව නිරීක්ෂණය කළේය. තවද, විගණනයට තොරතුරු ලබා දීමේදී සියලුම ආදායම් ප්‍රභවයන් ඉදිරිපත් කර නොතිබීම, වියදම් දරන්නේ ආදායමින්ද ඒකාබද්ධ අරමුදලින්ද යන්න සනාථ නොවීම, රඳවා ගන්නා මුදල් උපයෝජනය කරන ආකාරය, වියදම් අනාවරණය නොවීම හා ආදායම් හා වියදම් සඳහා රජයේ මානව හා භෞතික සම්පත් යොදා ගැනුණ ද එය රාජ්‍ය විගණනයට ලක් නොවීම ආදී කරුණු කාරක සභාව විසින් වැඩිදුරටත් නිරීක්ෂණය කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | කරන ලෙස දැනුම් දුන්න ද ඒ අනුව කටයුතු සිදු වී නොතිබුණි. | ත්‍රිවිධ හමුදාවන් සතු සුභසාධන අරමුදල් පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය මගින් අධීක්ෂණය කළ යුතු බව ද, ත්‍රිවිධ හමුදා විගණන කමිටුවේ නිරීක්ෂණ මට්ටමින් සහභාගි වන අමාත්‍යාංශ අභ්‍යන්තර විගණකවරයා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ඉහත අවධානයට ලක් වූ ත්‍රිවිධ හමුදාවල අරමුදල් බැර කිරීම් හා එම අරමුදල් ආශ්‍රිත අනෙකුත් කරුණු පිළිබඳව විගණන කමිටුවල සඳහන් කළ යුතු බවද කාරක සභාව අවධාරණය කළේය. තවද, මෙලෙස උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැරකිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ද කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>කඳවුරු මට්ටමින් පවත්වාගෙන යන අරමුදල් සම්බන්ධව වාර්තාවක් හා ත්‍රිවිධ හමුදාවේ කවර ආකාරයක හෝ ආරක්ෂක ගිණුම් හැරෙන්නට විවෘත කර ඇති වෙනත් බැංකු ගිණුම්වලට අදාළව එම බැංකු ශාඛාව, ගිණුමේ නම, විවෘත කළ දිනය, ස්ථාවර/ ඉතිරි කිරීම්/ ජංගම ගිණුමක් ද යන වග, කුමක් උදෙසා විවෘත කළේද?, අත්සන් කිරීමේ අයිතිය තිබෙන්නේ කාටද හා එම ගිණුම්වල වර්තමාන ශේෂයන් යන තොරතුරු ඇතුළත් වාර්තාවක් 2024.01.10 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**ආරක්ෂක ලේකම්ගේ අංක MOD/DEF/HRM/GEN/OTHERS /88/(11)හා 2024.01.10 දිනැති ලිපිය** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | **මගින් ත්‍රිවිධ හමුදාවේම අදාළ ගිණුම්වල තොරතුරු සඳහන් වාර්තාවක් එවා ඇත.** |
| 03 | **<u>2018 අගෝස්තු මස 10 වැනි දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u>**<br><br>ත්‍රිවිධ හමුදාවන් සඳහා ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය. | මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියලුම ආයතන සම්බන්ධ කරමින් තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීමට කාරක සභාව නිර්දේශ කළ අතර සපයනු ලබන ආහාර පිළිබඳව හමුදාවන්ගේ ප්‍රතිචාර ඇගයීමේ දත්ත පද්ධතියක් ද පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව ද පෙන්වා දෙන ලදී. කෙසේවුවද, මුළු සැපයුම් වටිනාකමින් 70% ක් ලබා ගන්නා යුද හමුදාව මෙවැනි පද්ධතියක් භාවිතා නොකිරීමද, වාර්ෂිකව රු. බිලියන 96ක් පමණ වැය කරමින් හමුදා කඳවුරු 30කට අධික සංඛ්‍යාවකට ආහාර අයිතම 600ක් පමණ සැපයීමට කොන්ත්‍රාත්කරුවන් 25ක් තෝරා ගැනීම, කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු වටිනාකම ගණනය අතාත්වික වීම, මිල ගණන් කැඳවීමේදී ලබා දෙන අවම මිල තාත්වික නොවීම හා අවම මිල හා වෙළෙඳපළ මිල අතර විචලනය ඇතැම් අයිතමවල 500% - 1000% ක් පමණ වීම ආදී කරුණු කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>ඉහත කරුණු පිළිබඳව කාරක සභාවේ දැඩි අවධානය යොමු වූ අතර සැපයුම්කරු කුමන මිළක් ඉදිරිපත් කළ ද එය වෙළෙඳ පොලෙහි පවතින මිලට වඩා 5% කට වඩා ඉක්මවිය නොහැකි බව පෙන්වා දෙනු ලැබිණි.<br><br>නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ ආහාර ප්‍රසම්පාදනයට අදාළ දත්ත පද්ධතිය මුළුමනින්ම භාවිතා කරන බව ද යුද හමුදාවේ දත්ත පද්ධතියේ පළමු අදියර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | 2023.12.31 දිනට ක්‍රියාත්මක කරන බව ද 2024 මාර්තු මස වනවිට එම දත්ත පද්ධතිය සම්පූර්ණ කිරීමට ද කටයුතු කරන බව ද යුද හමුදාවේ මේ සම්බන්ධයෙන් ප්‍රමාදයක් පවතින බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. කෙසේවුවද, ත්‍රිවිධ හමුදාව සඳහා දත්ත පද්ධතිය සකස් කර ආරක්ෂක අමාත්‍යාංශයද ඊට සම්බන්ධ කර අමාත්‍යාංශය විසින් අධීක්ෂණ කාර්යය සිදු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. මෙම ආහාර ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී මිල ගණන් කැඳවීමක් සිදු කරන බවද එම ක්‍රියාවලිය තුළදී අදාළ වෙනත් රජයේ ආයතන මගින් උපරිම මිල තීරණය කර මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කරන බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. තවද, යුද හමුදාව සඳහා වන දත්ත පද්ධතිය 2023.12.31 දිනට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව ද හෙතෙම ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>යුද හමුදාවේ දත්ත පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන දින වකවානු සහිත වාර්තාවක් 2023.12.11 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>තවද, ආහාර ප්‍රසම්පාදන ඇස්තමේන්තු නිවැරදිව ගණනය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් ත්‍රිවිධ හමුදාව වෙත නියෝග ලබා දුන් බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. චක්‍රලේඛයක් නිකුත් කිරීම මගින් මෙම නියෝගය විධිමත්ව ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත උපදෙස් ලබා දුන්නේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) ගේ අංක MOD/PAC/05/COPA/2023 හා 2023.12.14 දිනැති ලිපිය මගින් මෙම මෘදුකාංග පද්ධතිය 2024 මැයි මස වන විට අවසන් කිරීමට හැකි බව හා ඒ සම්බන්ධ කාල රාමුව ඉදිරිපත් කර ඇත.** |
| 04 | **<u>එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරි</u>** | එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරි වෙනුවෙන් 2022 වර්ෂය තුළ එක්සත් ජනපද ඩොලර් 19,177,125.83 ක් රැස්කර ඇතත්, එම වර්ෂයේ ආදායම ලෙස එක්සත් ජනපද ඩොලර් 7,506,868.47ක් (රු.2,447,153,974) ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ ආදායමින් එක්සත් ජනපද ඩොලර් 11,670,207.36 ක ආදායමක් ගිණුම් තුළින් නිරූපණය නොවීම කාරක සභාවේ අවධානයට යොමු විය. 1/2015 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය අනුගමනය නොකිරීම හා ඉහත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කළේය.<br><br>රඳවා ගත් මුදල් විදේශ විනිමය අර්බුදය හේතුවෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන රඳවා ගෙන ඇති බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. මුදල් රඳවා තබා ගැනීමට හේතුව තවදුරටත් සාම සාධක හමුදා යැවීමටත් විදේශයන්හි රාජකාරි සඳහා යොදවා ඇති හෙලිකොප්ටර් යානා ආදිය අලුත්වැඩියාව සඳහා බවත් ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. මෙම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස වසර අවසානයේ අදාළ ගිණුම් හිමි බැංකු වලට දැන්වුවද 2022 වර්ෂයේ එහි යම් ප්‍රමාදයක් සිදුවී ඇති බව ද 2023.01.03 දින එම මුදල ඒකාබද්ධ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | අරමුදලට බැර කර ඇති බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. |
| 05 | <u>අනාර්ථික හා අරපිරිමැසුම් රහිත ගනුදෙනු</u><br>ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය | 2022 ජනවාරි 13 දින පවත්වා තිබූ එක් දින සම්මන්ත්‍රණයකට පුද්ගලයන් 400 ක් වෙනුවෙන් රු. 5,197,413 ක් අනාර්ථිකව වැයකර තිබීම සහ චක්‍රලේඛ අනුව, රාජ්‍ය වියදම් පාලනය කළ යුතු වුවද මෙහිදී, වැය විෂයයක් යටතේ වියදම් නොකර සුභසාධන අරමුදලින් වියදම් කර පසුව එම වැය විෂයය සඳහා ප්‍රතිපූර්ණය කිරීමේ සාවද්‍ය ක්‍රමයක් අනුගමනය කර තිබීම කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. කොවිඩ් වසංගතය හේතුවෙන් 2019 වර්ෂයේදී පවත්වන්නට නියමිතව තිබූ මෙම සම්මන්ත්‍රණය 2022 වර්ෂයේදී පවත්වන්නට යෙදුන බවත් නිලධාරීන් 300කට සැලසුම් කරන ලද සම්මන්ත්‍රණය ත්‍රිවිධ හමුදා ඉල්ලීම මත පසුව නිලධාරීන් 400 කට වැඩි වූ බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. |
| 06 | <u>අනාර්ථික හා අරපිරිමැසුම් රහිත ගනුදෙනු</u><br>ජාතික ආරක්ෂක විද්‍යායතනය | පාඨමාලාවට සහභාගිවන නිලධාරීන් 31 ක් සඳහා නවාතැන් පහසුකම් ලබාදීම වෙනුවෙන් මාසික කුලිය රු. 3,000,000 බැගින් ගෙවා වර්ෂ 2ක කාලයක් සඳහා රු.72,000,000 ක බදු කුලී ගිවිසුමක් මත ගෘහ ඒකක 24 කින් යුත් නිවාස සංකීර්ණයක් ලබාගෙන තිබීම හා එම නිවාස සංකීර්ණයේ සිට ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් කුලී පදනම මත බස් රථයක් ද ලබා ගැනීම වෙනුවෙන් රු.1,795,500 ක් ගෙවා තිබීම පිළිබඳව කාරක සභාව විමසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | මෙම පාඨමාලාවේ පළමු අදියරේදී මෙම වියදම් දැරූ බවද, ත්‍රිවිධ හමුදාවේ හා සමාන්තර සිවිල් නිලයන්වල ඉහළම නිලධාරීන් මීට සහභාගිවන බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. මෙහි තුන්වන අදියරේ සිට විදේශ නිලධාරීන් ද සහභාගි වන බවත් එමගින් රටට විදේශ විනිමය ලබා ගත හැකි වන බවත් හෙතෙම ප්‍රකාශ කළේය. විශාල මුදලක් ගෙවා කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම වෙනුවට ඉදිරියේදී ජාතික ආරක්ෂක විද්‍යායතනය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් සලකා බලන ලෙස කාරක සභාව අවධාරණය කළේය. මේ සඳහා අවශ්‍ය මූල්‍යමය සහාය ලබා දීම පිළිබඳව සලකා බලන ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත කාරක සභාව යෝජනා කළේය. |
| 07 | <u>උපාය මාර්ගික සන්නිවේදන ජාල ව්‍යාපෘතිය</u> | 2016 වර්ෂයේ ඉදිකිරීම් අවසන් වීමට යෝජිත වුවද මෙම ව්‍යාපෘතියේ කාල සීමාව වසර 06 කින් දීර්ඝ කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 73% හා 53% විය. මේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 658.68 ක් වැය කර තිබුණ ද එමගින් සන්නද්ධ සේවා අතර අපේක්ෂිත ඒකාබද්ධ උපාය මාර්ගික සන්නිවේදනය පවත්වා ගැනීමේ මූලික අරමුණ කාලීනව ඉටුකරගත නොහැකිව තිබුණි. එසේම, 2016 වර්ෂයේ සන්නිවේදන පද්ධතියේ ප්‍රසම්පාදන පිරිවිතර වර්තමාන සන්නිවේදන තාක්ෂණයට ගැලපේද යන්න ගැටලු සහගත අතර සමස්ත වියදම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | අනාර්ථිකමය වියදමක් බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>ව්‍යාපෘතිය තාවකාලිකව නතර කිරීමට මහා පරිමාණ ඉදිකිරීම් පිළිබඳ කටයුතු කරන විශේෂ ව්‍යාපෘති කමිටුව තීරණය කරන ලද බව හා මීට අදාළ කුළුණු ඉදිකිරීම් කොටසක් සිදු කර ඇති බව ද වැය කර ඇති මුදලට සාපේක්ෂව දේපළ ප්‍රමාණයක් ඉතිරිව ඇති බැවින් එම දේපළ නඩත්තු කරමින් පවතින බවද තාක්ෂණය යාවත්කාලීන කර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කමිටුවක් පත් කර ඇති බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය.<br><br>මේ සම්බන්ධව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRC) සම්බන්ධ කරගත හොත් මෙම කුළුණු වලින් ආදායමක් ලබා ගැනීමේ හැකියාවක් තිබේද යන්න සොයා බලන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත උපදෙස් දුන්නේය. |
| 08 | <u>**ප්‍රසම්පාදනය**</u> | (i) 2018 මාර්තු 16 දින මෝටර් රථ 08 ක් සහ කැබ් රථ 02 ක් මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ ලබා ගැනීම සඳහා ලැබී තිබුණු එකම ලංසුව මත පදනම්ව සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ඒ අනුව, ඉදිරි වර්ෂ 5ක් වෙනුවෙන් සිදු කළ රු. 98,300,940 ක් වූ මෙම ගනුදෙනුව සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අපේක්ෂිත තරඟකාරි මිල ගණන් ලබා ගැනීමකින් තොරව සිදුකර තිබුණි. මේ සඳහා ලංසුකරුවන් නොපැමිණි බැවින් ත්‍රිවිධ හමුදාවේ මෙවැනි ලන්සු සඳහා ඉල්ලුම් කරන ලද ඉල්ලුම්කරුවන් සඳහා මිල |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ගණන් කැඳවා ප්‍රතිචාර දැක්වූ එකම හා අවම මිල සඳහන් කරන ලද සැපයුම්කරු තෝරා ගත් බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. <br><br> (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 (අ) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පොලියෙස්ටර් වූල් රෙදි මීටර් 529,000 ක් මිලදී ගැනීමට ලංසු කැඳවීමේ ලේඛනවල සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව, රෙදි සාම්පලවල ගුණාත්මකභාවය පිළිගත් ආයතන 3කින් ලබා ගන්නා රසායනාගාර තත්ත්ව පරීක්ෂණ වාර්තාවන් මත පදනම්ව ලංසු ඇගයීම සිදු කරනු ලබන බව සඳහන් කර තිබුණද, ලංසු විවෘත කිරීමෙන් අනතුරුව එළැඹි ප්‍රසම්පාදන කමිටු තීරණයක් අනුව එක් ආයතනයකින් පමණක් ලබාගත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් පදනම් කර ගෙන ලංසු ඇගයීම සිදුකර තිබුණ බව අනාවරණය විය. තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාදීමට රසායනාගාර 3 විසින් විශාල කාලයක් ඉල්ලා සිටීම නිසා ලංසු ඇගයීමට සති 6ක් වැනි කාලයක් පැවතීම මත එක් ආයතනයකින් පමණක් තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගත් බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. |
| 09 | <u>**පාරිභෝගික ද්‍රව්‍ය ගබඩාවේ රු.මිලියන 12 අධික ද්‍රව්‍ය සම්බන්ධ ඌනතාවය**</u> | 2021 ඔක්තෝබර් මාසයට අදාළ පාරිභෝගික ද්‍රව්‍ය අධියාචනා පත්‍ර ගොනුව අස්ථානගතවීම, පිරිවැය රු. මිලියන 6කට අදාළව කිසිදු තොග ලේඛනයක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | පවත්වාගෙන ගොස් නොතිබීම, ගබඩා භාරකරුවන්ගේ කාර්යයන් අධීක්ෂණය නොකිරීම හා ගිණුම් පොත්පත්වල හරි වැරදි නොබැලීම පිළිබඳව කාරක සභාවේ අවධානයට ලක් විය. <br><br> මීට අදාළ ගබඩා භාරකරු හා අධීක්ෂණ නිලධාරිවරයා රාජකාරිවලින් ඉවත් කළ බව ද නව කණ්ඩායමක් මේ සඳහා පත් කර තොග ගණනය කර පවත්වා ගෙන යන බවද ගබඩා භාරකරු හා අධීක්ෂණ නිලධාරිවරයා සඳහා මූලික පරීක්ෂණ සිදුකර විනය ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යවා ඇති බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. තවද, විනයානුකූල කටයුතු කරන තෙක් ගබඩා භාරකරු වෙතින් මාසිකව රු. 9,207.00 ක මුදලක් වැටුපෙන් අයකර ගන්නා අතර තවත් රු. 12,173,527ක මුදලක් අයකර ගැනීමට තිබෙන බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ද මේ සම්බන්ධව පැමිණිලි කර ඇති බව ද හෙතෙම ප්‍රකාශ කළේය. <br><br> කෙසේවුවද, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් මෙම තොරතුරු අනාවරණය කර නොගැනීම දුර්වලතාවයක් බව කාරක සභාව මෙහිදී පෙන්වා දුන්නේය. |
| 10 | <u>කාර්ය මණ්ඩල තොරතුරු</u> | ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වන අනෙකුත් අංශවල රාජකාරි සඳහා අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩලයට අතිරේකව ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා සෙසු නිළයන්ට අයත් හමුදා සාමාජිකයන් 700 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ඉක්මවූ සංඛ්‍යාවක් සේවා නියුක්ත කර තිබූ අතර ඒ සඳහා වන පාරිශ්‍රමික අදාළ ත්‍රිවිධ හමුදා විසින් දරා තිබුණි. තවද, සිවිල් අංශයන් විසින් සපුරාලිය යුතු පුරප්පාඩු 122 ක් ආවරණය කර ඇත්තේ ත්‍රිවිධ හමුදාවේ සෙසු නිලයන් මගිනි.<br><br>මේ වන විට මින් නිලධාරීන් කොටසක් ඉවත් කර ඇති බව ද, 2023.12.31 දිනට තවත් කොටසක් ඉවත් කිරීමට කටයුතු කරන බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. පසුගිය සමයේ දිවයින තුළ පැවති අරගල හා කොවිඩ් වසංගත තත්වය මත අමාත්‍යාංශයට අමතරව පැවරුණු විශාල කාර්යභාරය ඉටු කිරීමට හා අලුතින් ඇති කරන ලද ප්‍රත්‍යන්ත අවදානම් ඇගයුම් මධ්‍යස්ථානය (Boarder Risk Assessment Center) වැනි ආයතන සඳහා මෙම අනුයුක්ත කිරීම් සිදු කරන ලද බව ද හෙතෙම ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මෙවැනි නිලධාරී අනුයුක්ත කිරීම් සඳහා අදාළ නීතිමය පසුබිමක් ඇති කර ගැනීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |
| 11 | **<u>"අපි වෙනුවෙන් අපි අරමුදල", ජාතික ආරක්ෂක අරමුදල හා ආරක්ෂක අමාත්‍යාංශය සතු වෙනත් අරමුදල්</u>** | යුද හමුදාවේ අනතුරුවලට ලක් වූ හා මියගිය රණ විරුවන් සඳහා නිවාස සෑදීමට හා රණවිරු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමට මෙම අරමුදල් භාවිත කරන බව ද අරමුදලේ ස්ථාවර තැන්පතු මගින් ලැබෙන පොළිය මේ සඳහා යොදා ගන්නා බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. සන්නිවේදන කුළුණු ආදායම් හා නිවාස සංකීර්ණ යෝජනා ක්‍රම වලින් ලැබෙන ආදායම් "අපි වෙනුවෙන් අපි අරමුදල" වෙත බැර වෙන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | බව ද ආරක්ෂක අරමුදල සඳහා ගෙවල් කුලී ආදායම් ලැබෙන බව ද මෙහිදී අනාවරණය විය. |
| 12 | <u>**ආපදා කළමනාකරණය**</u> | ආපදා පුරෝකථන වැඩපිළිවෙළ පිළිබඳව කාරක සභාව විමසීය.<br><br>අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණයෙන් දිවයිනේ දිස්ත්‍රික්ක 25 වෙනුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන 25ක් හාෂාත්‍රයෙන්ම පැය 24 මුළුල්ලේම ක්‍රියාත්මක වන බව ද ජාතික ආපදාවකදී ත්‍රිවිධ හමුදාව හා පොලීසිය ප්‍රථම ප්‍රතිචාර දක්වන්නන් ලෙස කටයුතු කරන බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. සුනාමි ආපදා පිළිබඳව ජංගම දුරකථන වෙත පණිවුඩ ලබා දීම අරමුණු කර ගෙන දුරකථන ද්වාරයක් (Telephone Portal) 2023.12.26 දින විවෘත කිරීමට සැලසුම් කර ඇති බවත්, ඒ සඳහා අදාළ දිස්ත්‍රික්ක 14 ක් සඳහා සේවා සපයන්නන් දැනටමත් අනුයුක්ත කොට ඇති බවත්, ප්‍ර.ග.නි කාරක සභාව වෙත දැනුම් දුන්නේය. සුනාමි අනතුරු ඇඟවීමේ කුළුණුවල අදාළ චන්ද්‍රිකා තාක්ෂණය මේවන විට අක්‍රීයව පවතින බව ද දුරකථන හරහා ආපදා අනතුරු ඇඟවීමේ ක්‍රියාවලියක් ඒ වෙනුවට හඳුන්වා දීමට බලාපොරොත්තු වන බව ද හෙතෙම ප්‍රකාශ කළේය. උස් ගොඩනැගිලිවල සිදුවිය හැකි ගිනි ආපදාවලදී එම ගිනි නිවීම් සඳහා අවශ්‍ය කෙරෙන උපකරණවල හිඟයක් පවතින බව ද මෙහිදී අනාවරණය විය. |
| | **රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව** | |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
| ***(2022 වර්ෂය සඳහා අතිරික්ත, සීමා ඉක්මවීම්, බලය නොලත් කාරක පාඩු හා 2021 වර්ෂය සඳහා වූ විගණන වාර්තාව)***<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2023 දෙසැම්බර් 05** | | |
| කැඳවන ලද ආයතන<br>❖ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය<br>❖ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>2022 වර්ෂය සඳහා වූ රජයේ කර්මාන්තශාලා දෙපර්තමේන්තුවේ අතිරික්ත, සීමා ඉක්මවීම්, බලය නොලත් කාරක පාඩු</u>** | මුදල් රෙගුලාසි (මු.රෙ) 513 ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට රජයේ කර්මාන්තශාලාවේ කළවැඩ අත්තිකාරම් ගිණුමෙහි (31003) බලය නොලත් කාරක පාඩුව රු. 70,758,133 ක් විය. මේ සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 30 දිනට පිළියෙල කරනු ලැබූ ලාභඅලාභ ගිණුම ප්‍රකාරව ශුද්ධ අලාභය රු.මිලියන 32ක් බවත් 2022 දෙසැම්බර් 31 දිනට අනුමාන කරන ලද අලාභය වෙනුවෙන් රු.මිලියන 150ක ප්‍රතිපාදන 310-2-1-0-1701 වැය විෂයය වෙත සලසා දෙන ලෙසත් 2022 දෙසැම්බර් 16 දිනැති අංක 2C/සීමා සංශෝධන/365/02/(2022 -2025) යන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) ගේ ලිපියෙන් ඉල්ලුම් කර තිබුණි. එහෙත්, 2023 මැයි 19 වන දින දක්වා අදාළ කාරක පාඩු පියවා ගැනීම සඳහා එම ප්‍රතිපාදන සැලසී නොතිබුණු බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>තවද, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ කළ වැඩ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය කාර්ය සාධනය රු.70,758,133 ක කාරක පාඩුවක් ලෙස සටහන් වුවද, විගණනයට පළමුව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ඉදිරිපත් කළ ගිණුම්වල කාරක පාඩුව රු.මිලියන 44 ක් ලෙස සටහන් වී ඇති බව ද පසුව විගණන නිරීක්ෂණ මත ගිණුම්වලින් ඉවත් කර තිබූ වත්කම් නැවත ගැලපීමක් කර සංශෝධිත ගිණුම්වල කාරක පාඩුව රු.මිලියන 70 ක් ලෙස සටහන් කර ඇති බව ද කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>කොවිඩ් සමයේදී සේවකයන් සේවයට වාර්තා කළද නිෂ්පාදනය අඩු වූ බවත් වැටුප් අඛණ්ඩව ගෙවීමට සිදු වූ බවත් ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. රජයේ කර්මාන්තශාලාවේ සාමාන්‍ය පරිපාලනය සඳහා ලබා ගත් වත්කම් හා නිෂ්පාදන සඳහා ලබාගත් වත්කම් වෙන් කර ගලපා සකස් කරන ලද ගිණුම් මගින් රු.මිලියන 44 ක කාරක පාඩුවක් ලෙස පළමුව සටහන් කරන ලද බව ද පසුව විගණකාධිපති නිරීක්ෂණ මත අදාළ ගැලපීම් කිරීමෙන් පසු රු.මිලියන 70 ක කාරක පාඩුව සටහන් කරන ලද බව ද ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. එබැවින්, 2023 වර්ෂය සඳහා නිවැරදි ගිණුම් තැබීම සඳහා කළ වැඩ අත්තිකාරම් ගිණුමට ගැලපිය යුතු වත්කම් හඳුනාගැනීමට කමිටුවක් පත් කර ඇති බව ද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>තවද, කොවිඩ් හා ඉන්ධන අර්බුධය ද දෙපාර්තමේන්තුවේ මූල්‍යමය පාඩු තත්වය සඳහා හේතුකාරක වූ බව මෙහිදී ප්‍රකාශ විය.<br><br>සම්පූර්ණ වැඩ කරන දින 28ක් විශේෂ නිවාඩු මත වැටුප් හා දීමනා ගෙවීම හේතුවෙන් අහිමි වූ මුදල රු. 26,693,689 ක්ද සේවක මහතුන් සේවයට පැමිණුන ද |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | විදුලි කප්පාදුව හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කරවීමට නොහැකි වීමෙන් නිෂ්ක්‍රීය ශ්‍රමය සඳහා රු.319,523 ක් ගෙවීමට සිදුවීම හා වැඩපත් අංක 4215 යටතේ ඇඳන් 1850 ක් සෑදීමේදී 2022 වර්ෂයේ වියදමට සමානුපාතිකව ඉන්වොයිස් ආදායම් වාර්තා නොවූ ප්‍රමාණය රු.5,286,153 ක් හා රු. 38,458,768 ක් වූ ලී බඩු, යන්ත්‍ර හා ක්ෂය සිදු කිරීමත් මෙම රු. 70,758,133 ක් වූ කාරක පාඩු සඳහා හේතු වී තිබූ බව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) ප්‍රකාශ කළේය.<br><br>රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂය සඳහා වූ කළ වැඩ අත්තිකාරම් ගිණුමේ සටහන් වී ඇති රු.70,758,133 ක බලය නොලත් කාරක පාඩුව සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සාධක / කරුණු සලකා බැලීමෙන් අනතුරුව, සිදු වී ඇති කාරක පාඩුව සඳහා එම සාධක / කරුණු හේතු විය හැකි බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br><u>**නිර්දේශ**</u><br>රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට කළ වැඩ අත්තිකාරම් ගිණුමෙහි (31 003) බලය නොලත් කාරක පාඩුව වන රු.70,758,133 ක මුදල සඳහා ආවරණ අනුමැතිය ලබා දියයුතු යැයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත නිර්දේශ කරන ලදී.<br><br>**2023 වර්ෂය සඳහා රජයේ කර්මාන්තශාලාවට වෙන්ව තිබූ මූලා** |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
| | | **ප්‍රතිපාදන තුළින් මු.රෙ.66 ඉල්ලුම් පත්‍රයක් ක් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර කාරක පාඩුව වන රු, 70,758,133/- ක ප්‍රමාණය කපා හැරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ප්‍රමාණය සලසා ගෙන ඇත. ඒ අනුව මෙම බලය නොලත් කාරක පාඩුව 2023 වර්ෂයේ කළ වැඩ අත්තිකාරම් ගිණුමෙන් (31003) කපා හැරීම් සිදුකිරීමට කටයුතු කර ඇති බව ස්ථාවර නියෝග 119 (4) යටතේ අමාත්‍යවරයාගේ පිළිතුර මගින් දක්වා ඇත. (ලිපි අංකය හා දිනය)** |
| 02 | **<u>2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ හා ඒ පිළිබඳ වර්තමාන තත්ත්වය</u>** | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ගොඩනැගිලි තක්සේරු වටිනාකම රු.327,400,000ක් වූ අතර (ACA-6) ආකෘතියෙහි එහි අගය රු.387,000,000 ක් වූ හෙයින් රු.60,000,000ක පමණ විචලතාවයක් පවතින බව කාරක සභාව නිරීක්ෂණ කළේය. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2015 දී ලබා දී ඇති තක්සේරු වාර්තාවේ ගොඩනැගිලි වටිනාකම ලෙස කර්මාන්තශාලාව පිහිටි ඉඩමේ ගොඩනැගිල්ල රු.327,000,000 ක් හා කර්මාන්තශාලා සේවක නිල නිවාස සඳහා රු.60,000,000 ක් ලෙස සඳහන් වී තිබූ බව ද එම වාර්තාවේ කොලොන්නාව ආයතන පරිශ්‍රයේ පිහිටි ඉඩම් ගොඩනැගිලි වටිනාකම දැක්වීමේදී නිල නිවාස ලෙස වැරදීමකින් දක්වා ඇති බව ද පසුව, තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක SAV/MCES/2012/01 හා 2021.04.22 දිනැති ලිපිය මගින් රජයේ කර්මාන්තශාලාව කොලොන්නාව රු. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | 327,400,000 ලෙස නිවැරදි කර ඇති බව ද ප්‍ර.ග.නි/ගණන් දීමේ නිලධාරි (ග.නි) ප්‍රකාශ කළේය. |
| 03 | **<u>2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ හා ඒ පිළිබඳ වර්තමාන තත්ත්වය</u>** | 2021 වර්ෂයේදී කළ වැඩ අත්තිකාරම් ගිණුමට අදාළව රු. 53,161,909 ක් වටිනා ණයගැතියන් කපාහැරීමට අදාළව කිසිදු අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. <br><br> 2009 වර්ෂයේ ලේඛන නොමැති රු. මිලියන 53 ක පමණ වූ ණය ශේෂ සම්බන්ධව කමිටුවක් පත් කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යොමුකර මෙම ණය කපා හැර ඇති බව ග.නි ප්‍රකාශ කළේය. <br><br> **<u>නිර්දේශ</u>** <br> ඉහත දක්වා ඇති ණය ශේෂ කපා හැරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. |
| 04 | **<u>තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කිරීම.</u>** | තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු. 104,412,899 ක් වූ ඇස්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුව එකඟ වී 2018 දෙසැම්බර් 31 දිනට රු.3,795,000ත් ගෙවා තිබුණි. එසේ වුවද අදාළ ඉදිකිරීමට යෝජිත ඉඩමෙහි පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පැවති සාකච්ඡාවේදී තහවුරු වී තිබුණු බැවින් අලුතින් සකස් කරන සැලසුමකට අනුව වෙනත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ස්ථානයක ඉදිකිරීමකට යැයි දක්වා නැවතත් රු,10,710,572ක් 2019 මාර්තු 14 දින හා රු.7,694,000ක් 2020 මාර්තු 06 දින ද ලෙස එකතුව රු.22,199,572 ක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි.<br><br>එසේ වුවද, 2022 දෙසැම්බර් 31 දිනටද ව්‍යාපෘතියේ ප්‍රගතිය 10% ක් පමණක් වීම මත ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබීම කාරක සභාවේ අවධානයට ලක් විය. ඉදි කිරීම සිදු කිරීමට යෝජිත ඉඩම පිළිබඳ ගැටළුවක් මතු වී ඇති බැවින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මේ වන තෙක් මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී නොමැති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 05 | **<u>මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා රු.32,391,346ක් වටිනා විදුලි ලාම්පු කණු 191 ක් සැපයීම.</u>** | මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා රු.32,391,346ක් වටිනා විදුලි ලාම්පු කණු 191 ක් සැපයීම සඳහා 2019 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට රු.2,707,512 ක් වටිනා විදුලි ලාම්පු කණු 17 ක් පමණක් නිමකර තිබූ බැවින් භෞතික ප්‍රගතිය 9% ක් වීම ද ඉතිරි වී ඇති චීනච්චට්ටි පහන් කණු කොටස්, වීදුරු කේස් හා ඇලුමිනියම් කොටස් යනාදී උපාංග වැඩහල අංක 01 සහ වැඩහල අංක 06 හි නිෂ්ක්‍රීයව පවතින බවද කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් මුදල් නොමැති බව පවසා ඉතිරි නිෂ්පාදන භාර නොගත් බව ද, වැඩ අවසන් කර භාරදුන් ලාම්පු කණු 34 ක් සඳහා මුදල් ගෙවා ඇති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | බව ද ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. ඉතිරි නිෂ්පාදන විකිණීමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නිර්දේශ කළේය. දැනටමත් ඉතිරි නිෂ්පාදන විකිණීමට කටයුතු කරමින් පවතින බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 06 | <u>**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඌව කුඩා ඔය ජලාශය සඳහා දිය දොරටු සවි කිරීම.**</u> | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඌව කුඩා ඔය ජලාශය සඳහා දිය දොරටු සවි කිරීම සඳහා වූ රු.12,708,000ක් වූ ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 20% ක් පමණ වීම පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළේය. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර වන දිය දොරටු සාදා නිම කර බාර දී ඇති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 07 | <u>**දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 37 ක් භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතීම.**</u> | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 37 ක් භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතීම ද එම පරිශ්‍රයේම පිහිටි රූඩ් 01 පර්චස් 08.87 ක බිම් ප්‍රමාණය පිහිටි බැරල් මඩුව ද නිෂ්කාර්යව පැවතීම පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කළේය.<br><br>මෙම සංහිඳ නිල නිවාස 120 හි අලුත්වැඩියාවන් පවතින බව ද නාන කාමරවල ජල කාන්දු පවතින බව ද මෙහිදී සඳහන් විය. ඒ අනුව, මෙම නිල නිවාස පදිංචියට යෝග්‍ය නොවන තත්ත්වයක පවතින බව ද නාගරික සංවර්ධන අධිකාරියට අලුත්වැඩියාවන් සිදු කිරීමට ලබා දී එම අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතින බව ද ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| 08 | **<u>රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පිහිටි ඉඩම ද ඇතුළුව දෙපාර්තමේන්තුව සතු එකතුව අක්කර 24 රූඩ් 01 පර්චස් 1.87 ක් වූ ඉඩම් 3ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව ඔප්පු නොමැති වීම.</u>** | රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පිහිටි ඉඩම ද ඇතුළුව දෙපාර්තමේන්තුව සතු එකතුව අක්කර 24 රූඩ් 01 පර්චස් 1.87 ක් වූ ඉඩම් 3ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව ඔප්පු නොමැති බවද මිනින්දෝරු සැලැස්ම පදනම් කරගෙන ප්‍රාදේශීය ලේකම් මගින් අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබීම ද කාරක සභාවේ අවධානයට ලක් විය.<br><br>නාගරික සංවර්ධන අධිකාරිය වෙත නැවත පැවරීම සඳහා කටයුතු කෙරෙන අක්කර 09 ක ඉඩම් කොටස හැර මෙම ඉඩමේ ඉතිරි අක්කර 15 හි මැනුම් කටයුතු සිදුකර ඇති අතර ඊට අදාළ ඔප්පුව ප්‍රාදේශීය ලේකම් හරහා ලැබිය යුතු බව ද ග.නි ප්‍රකාශ කළේය. |
| 09 | **<u>රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රතිව්‍යූහගතකරණ සැලසුම්</u>** | රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 2023 වසර සඳහා රු.මිලියන 226ක පමණ වැඩ සිදු කර ඇති බව ද ඉන් දළ වශයෙන් 50% ක් පමණ දෙපාර්තමේන්තුවේ සිටින ඒකාබද්ධ සේවයේ හා දෙපාර්තමේන්තුගත සේවක වේතන සඳහා වැය වන බව ද ඒ අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවය සතුටුදායක මට්ටමක නොපවතින බවද තත්‍ය කාර්ය මණ්ඩලය, අනුමත කාර්ය මණ්ඩලයෙන් 50% ක් පමණක් වීම ද කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>වර්තමානයේදී මහා භාණ්ඩාගාරයේ ද උපදෙස් පරිදි මෙම දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යූහගතකරණයට සැලසුම් සකස් |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
| | | කරමින් පවතින බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**<br>***(2023.04.25, 2023.05.26 සහ 2023.08.09 දිනයන්හි පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාව පිළිබඳ සමාලෝචනය)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජනවාරි 10** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br>❖ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br>❖ කම්කරු දෙපාර්තමේන්තුව<br>❖ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමේදී අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ ගැටළු පැවතීම.</u>**<br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමේදී අධිකාරිවලින් අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීමේ වර්තමාන තත්ත්වය පිළිබඳව කාරක සභාව විමසා සිටියේය.<br><br>තමා විසින් කලින් ලබාගත් සේවක අර්ථසාධක මුදලින් රජයේ දායකත්වය වන 60% ක මුදල හා ඊට අදාළ පොළිය ආපසු ගෙවීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ලබා දීම යන කොන්දේසිය හේතුවෙන් | මේ වන විට විශ්‍රාම ගිය නිලධාරීන් 1079 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ගොනුවල කටයුතු කළ යුතුව පවතින බවත්, ඒ අතරින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගොනු 246 ක් යොමු කර ඇති බවත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 60% ක පොළිය ආපසු ගෙවා නොතිබීම මත ගොනු 42 ක් ප්‍රතික්ෂේප කර ඇති බවත් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. තවද, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කළ නිලධාරීන් 3,101 දෙනෙකු මේ වන විට විශ්‍රාම ගොස් ඇති බවත්, ඔවුන් අතරින් නිලධාරීන්, 2022 ක් වෙත මාසිකව විශ්‍රාම වැටුප් ගෙවනු ලබන බවත් ප්‍ර.ග.නි./ ග.නි. සඳහන් කළේය.<br><br>තමා විසින් කලින් ලබාගත් සේවක අර්ථසාධක මුදලින් රජයේ දායකත්වය වන 60% ක මුදල හා ඊට අදාළ පොළිය ආපසු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | මෙතෙක් විශ්‍රාම වැටුප් නොලබා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි වර්තමාන තත්ත්වය පිළිබඳව පැහැදිලි කරන ලෙසද කාරක සභාව විමසීය. | ගෙවීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ලබා දීම යන කොන්දේසිය හේතුවෙන් මෙතෙක් විශ්‍රාම වැටුප් නොලබා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් පවතින නඩුවක් 2024 ජනවාරි 08 වනදා විභාග වූ බවත්, එහි තීන්දුව ලබා දීම 2024 අප්‍රේල් 02 දින දක්වා කල් ගොස් ඇති බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>මේ සඳහා පසුබිම් වූ කරුණු පිළිබඳ පැහැදිලි කළ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී, දිවි නැගුම පනතේ 44(ඉ)(ii) වගන්තිය යටතේ අධිකාරිවල මුල් සේවා කාලයත් සමග දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේදී මෙම ගැටළුව මතු වී ඇති බවත්, එම නිලධාරීන්ගේ අධිකාරි සේවා කාලයට අදාළ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයෙන් සේවායෝජක දායකත්වය වන 12% ක ප්‍රමාණය ආපසු රජය වෙත ගෙවිය යුතු බව දැක්වෙන චක්‍රලේඛයක් නිකුත් වූ පසුව ඔවුන් විසින් අංක 252/2015 දරන නඩුව පවරා ඇති බවත් ප්‍රකාශ කළේය. එම නඩුවේ සමථ තීන්දුවෙන් සේවකයින්ගේ පාර්ශ්වය විසින් ඉටු කළ යුතු කාර්යයන් ලෙස විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2008 අනුව හිඟ වැන්දඹු අනත්දරු දායක මුදල් අදාළ පොළියත් සමග ගෙවීම සහ සේවක අර්ථසාධක අරමුදල ඇපයට තබා ණයක් ගෙන තිබේ නම් එම මුදල ආපසු ගෙවීම යන කොන්දේසි දක්වා ඇති බවත්, සේවක අර්ථසාධක අරමුදලේ ඉතිරි සමස්ත ශේෂය එම සේවකයින් වෙත ගෙවන ලෙස නියෝග කර ඇති බවත් සඳහන් කළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී, දෙපාර්තමේන්තුව ස්ථාපනය කළ පසු ඉහත නඩු තීන්දුව අනුව එම සමස්ත ශේෂ මුදල අදාළ සේවකයින් වෙත ගෙවූ බව ද ප්‍රකාශ කළේය. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 48(3) වගන්තිය අනුව රජයේ දායකත්වය ලෙස ගෙවනු ලැබ ඇති මුදල ආපසු රජයට ගෙවිය යුතු බවට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් තීරණයක් ගෙන තිබුණු බවත්, ඊට විරුද්ධව මෙම නිලධාරීන් නැවත අධිකරණය හමුවට ගිය බවත් ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ ග.නි., සේවක අර්ථසාධක අරමුදලේ රජයේ දායකත්වය වන 12% ක ප්‍රමාණය සහ එහි පොළිය ආපසු රජයට ගෙවිය යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය මේ වන විටත් ක්‍රියාත්මකව පවතින බව ද සඳහන් කළේය. මෙම මුදල ගෙවිය යුතු බවට දන්වමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 03/2019 චක්‍රලේඛයට එරෙහිව අදාළ නිලධාරීන් විසින් රිට් අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්, එය මේ වන විට විභාග වෙමින් පවතින බවත් මෙහිදී සඳහන් විය. මෙම නඩුවේ විත්ති පාර්ශ්වය ලෙස සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සහ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය නම්කර ඇති බවත්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සහ කම්කරු කොමසාරිස් ජනරාල් ද පාර්ශ්වකරුවන් ලෙස නම් කර ඇති බවත් නීති නිලධාරී තවදුරටත් ප්‍රකාශ කළේය. <br><br> සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පාදක කරගත් විශ්‍රාම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 48(3) වගන්තියේ දැක්වෙනුයේ අනුමත අර්ථසාධක අරමුදලකට දායකව සිට රාජ්‍ය සේවයට එක් වූ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව වන බවත්, අනුමත අර්ථසාධක අරමුදල, සේවක අර්ථසාධක අරමුදලට සමාන වන බැවින් එම වගන්තිය මෙම නිලධාරීන් සඳහා අදාළ වන බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ මතය වූ බවත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී ප්‍රකාශ කළේය. මෙම කරුණ සම්බන්ධයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විමසීමකට අනුව සේවක අර්ථසාධක අරමුදල, අනුමත අර්ථසාධක අරමුදල් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල යනු එකිනෙකට වෙනස් අරමුදල් බව දන්වා කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලිපියක් නිකුත් කර ඇති බව ද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.<br><br>ශ්‍රේෂ්ඨාධිකරණයේ 252/2015 නඩුවේ සමථ තීන්දුව හා මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් ගත් ප්‍රතිපත්තිමය තීරණය අතර පවතින ගැටළුකාරී තත්ත්වය පිළිබඳව නීතිපතිගෙන් උපදෙස් විමසා ඇතත් මෙතෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැති බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. මෙම ගැටළුව සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හමු වී සාකච්ඡා කළ බවත්, අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවක් සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය ප්‍රකාශ කිරීමක් සිදු නොකිරීම සාමාන්‍ය ක්‍රියාපාටිය වන බැවින් මෙම ප්‍රමාදයට එය බලපෑ හැකි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. නීතිපතිවරයා විසින් පාර්ශ්වකරුවන් වන එක් එක් ආයතනය වෙතින් නඩුවේ සම්ප්‍රකාශන සම්බන්ධයෙන් නිරීක්ෂණ කැඳවන බවත්, මෝසමක් මගින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සහ කම්කරු කොමසාරිස් ජනරාල් මෙම නඩුවට එක් කිරීමෙන් පසුව සංශෝධිත ශීර්ෂය (amended caption) සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් එසේ කැඳවනු ලැබූ නිරීක්ෂණ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. නීතිපතිවරයා විසින් නැවත අධිකරණය වෙත පිළිතුරු ගොනු කර නොමැති බව ද ප්‍ර.ග.නි./ ග.නි. වැඩිදුරටත් සඳහන් කළේය. මෙම නඩුවේ වගඋත්තරකරුවෙකු ලෙස තමන් නම් කර ඇති බවට මෙතෙක් දැනුම් දීමක් කර නොමැති බව මෙහිදී ප්‍රකාශ කළ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධිකරණයෙන් මෙම නඩුවේ පිටපතක් ලබාගෙන ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කරන බව සඳහන් කළේය. මෙම ගැටළුවට අදාළ නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අනුව කටයුතු කිරීම තම නිර්දේශය බවත්, 2023.02.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ නිලධාරීන් වෙතින් අර්ථසාධක අරමුදල් අදාළ පොලියත් සමග ආපසු අය කරගැනීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ යුතු වන බවත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා තවදුරටත් ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>- **කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | **නිරීක්ෂණ/ නිර්දේශ**<br>එක් එක් දෙපාර්තමේන්තු විසින් මේ සඳහා විවිධ අර්ථකථනයන් ලබා දීමත්, නිසි තීරණයක් නොගැනීමත් හේතුවෙන් සේවකයින් අගතියට පත් වන බව කාරක සභාව පෙන්වා දුන්නේය.<br><br>අමාත්‍ය මණ්ඩලය විසින් ගත් ඉහත සඳහන් ප්‍රතිපත්තිමය තීරණය හා ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 252/2015 දරන නඩුවේ සමථ තීන්දුව සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විමසා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් නීතිපතිවරයා වෙත යවන ලද ලිපියේ පිටපතක් 2024.01.11 දින වන විට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලෙසත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මෙම ගැටළුව පැන නැගුණු බැවින් මේ සම්බන්ධයෙන් නිර්දේශයක් කඩිනමින් ලබා දීම සුදුසු බව දන්වා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් නීතිපතිවරයා වෙත ලිපියක් යැවීමට කටයුතු කරන බවද කාරක සභාව ප්‍රකාශ කළේය.<br><br>**උක්ත කරුණ සම්බන්ධව නීතිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇති 2023.12.30 දිනැති ලිපියේ පිටපතක් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 II වෙළුම හා 2024.01.11 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත යොමු කර ඇත. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියමය පරිදි මේ සම්බන්ධයෙන් නිර්දේශ කඩිනමින්** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය වෙත ලබා දීම සුදුසු බවට දන්වා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම්ගේ අංක PAC/9/5/2024 හා 2024.04.17 දිනැති ලිපිය නීතිපතිවරයා වෙත යොමු කර ඇත.**<br><br>අර්ථසාධක අරමුදල් පිළිබඳව අර්ථ විවරණය කර කම්කරු කොමසාරිස් ජනරාල් විසින් එවා ඇති 2023.09.14 දිනැති ලිපියේ පිටපතක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොමැති බව නිරීක්ෂණය කළ කාරක සභාව නිසි සම්බන්ධීකරණයක් පවත්වා නොගැනීම හේතුවෙන් මෙම ගැටළුව විසඳා ගැනීම තවදුරටත් ප්‍රමාද වන බව පෙන්වා දෙමින් ඒ පිළිබඳව සිය අප්‍රසාදය පළ කළේය.<br><br>සේවක අර්ථසාධක අරමුදල, අනුමත අර්ථසාධක අරමුදල් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල පිළිබඳ පැහැදිලි කර ගැනීම යන මැයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවා ඇති අංක PB/පොදු උපදෙස්/1(ii වෙළුම) හා 2023.09.14 දිනැති ලිපියේ පිටපතක් 2024.01.11 දින වන විට නීතිපතිවරයා සහ කාරක සභාව වෙත පිටපත් සහිතව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**උක්ත ලිපියේ පිටපතක් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම්** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 II වෙළුම හා 2024.01.11 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත යොමු කර ඇත.**<br><br>මෙම කරුණ සම්බන්ධයෙන් පවතින නඩුව සඳහා කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන අවස්ථාවේ අධිකාරිවල සිට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් අයත් වූයේ කවර අර්ථසාධක අරමුදලටද යන්න පිළිබඳ පැහැදිලි නිරීක්ෂණයක් 2024.01.20 දිනට පෙර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලෙසත් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත නිර්දේශ කළ කාරක සභාව, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමග සම්බන්ධ වී මේ පිළිබඳව වැඩිදුර තොරතුරු ලබාගැනීමට කටයුතු කරන ලෙස ද උපදෙස් දුන්නේය.<br><br>**කම්කරු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ සඳහන් තොරතුරු අනුව, මෙම නිලධාරීන් හට, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන අර්ථසාධක අරමුදලට දායක මුදල් බැර කිරීම සඳහා ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, සමෘද්ධි සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන ආයතන ලියාපදිංචි වී ඇති බව දන්වා කම්කරු** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **කොමසාරිස් ජනරාල්ගේ අංක PB/පොදු උපදෙස්/1(i වෙළුම) හා 2024.01.19 දිනැති ලිපිය කාරක සභාව වෙත යොමු කර ඇත.** |
| 02 | <u>**අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කිරීම**</u><br>මේ වන විට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නව කාර්ය මණ්ඩල සංශෝධනයක් සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී ඇති බැවින් ඒ අනුව කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පැවති ගැටළු විසඳා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස කාරක සභාව දන්වා සිටියේය.<br>විශේෂයෙන් සමෘද්ධි කළමනාකාර තනතුරේ රාජකාරි ආවරණය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත උසස්වීම් ලබාදීම සඳහා පවතින ගැටළු විසඳීමට ගෙන ඇති පියවර පිළිබඳව ද කාරක සභාව විමසීය. | 2023.11.01 දිනැතිව අනුමත වූ නව කාර්ය මණ්ඩල සංශෝධනයට අනුකූලව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි 06 ක් සංශෝධනය කර අනුමත කරවා ගත යුතුව ඇති බවත්, ඒ අතරින් අනුමැතිය ලබා ගැනීම සඳහා එක් පටිපාටියක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයටද, පටිපාටි 03 ක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවටද මේ වන විට යොමු කර ඇති බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් කිරීමේදී වෘත්තීය සංගම් සමග සාකච්ඡා කර ඔවුන්ගේ ඉල්ලීම් ද ඇතුළත් කිරීම පිළිබඳව එකඟතාවයකට එළඹීම සඳහා යම් කාලයක් ගත වූ බවද හෙතෙම පැහැදිලි කළේය. මේ වන විට සකස් කර අවසන්ව ඇති අනෙක් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි 02 ක්ද 2024.01.12 දින වන විට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යොමු කරන බවත් ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ ග.නි., මෙම කාර්යය සඳහා කාල රාමුවක් සකස් කර ඇති බව ද සඳහන් කළේය. ඒ අනුව, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ සමග රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කළ යුතු වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි 02 ක් සඳහා 2024.01.15 දින වන විට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ ලබා ගැනීමට අපේක්ෂා කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | බවත්, 2024.02.01 දින වන විට මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත හැකි වුවහොත් බඳවා ගැනීම් සඳහා විභාග නිවේදන නිකුත් කර ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>මෙතෙක් සමෘද්ධි කළමනාකාර තනතුර, දරන්නාට පෞද්ගලික වන සේ පැවති බවත්, නව කාර්ය මණ්ඩල සංශෝධනය අනුව නව තනතුරු අනුමත වීම හේතුවෙන් සමෘද්ධි කළමනාකාර තනතුරේ පුරප්පාඩු ඇති වී තිබෙන බවත් ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ ග.නි., මෙතෙක් එම තනතුරේ රාජකාරී ආවරණය කරමින් සිටි සමෘද්ධි කළමනාකරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද බවත්, ඒ අනුව වැඩ බැලීමේ පත්වීම් ලිපි ලබාදීමට දින වකවානු නියම කර ඇති බවත් සඳහන් කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් කර, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට පිටපතක් සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත කඩිනමින් යොමු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කළේය.<br><br>නව කාර්ය මණ්ඩලය අනුමත වීමෙන් පසුව, දැනට පවතින ගැටළු විසඳා ගැනීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ යුතුව ඇති සියලු කාර්යයන් පිළිබඳ විස්තරාත්මක ලේඛනයක් (එම එක් |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | එක් කාර්යය සම්බන්ධව වගකීම දරන නිලධාරියා කවුරුන්ද යන්න, ඒ සඳහා සම්බන්ධ වන ආයතන කවරේද යන්න සහ මෙම කාර්යයන් ඉටු කිරීමට අපේක්ෂිත දින වකවානු පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක්) 2024.01.20 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙසත්, ඉන් පසුව සෑම මසකම 15 වන දිනට එම කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කරන ලෙසත්, ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 II වෙළුම හා 2024.01.22 දිනැති ලිපියෙන් එක් එක් තනතුර සඳහා බඳවා ගැනීම්/ උසස් කිරීම්වලට අදාළව කාල රාමුවක් සහිත වාර්තාවක් කාරක සභාව වෙත යොමු කර ඇති අතර, 2024.02.15, 2024.03.15, 2024.04.15, 2024.05.15 හා 2024.06.15 දිනට එහි ප්‍රගතිය පිළිවෙලින් සමාංක හා 2024.02.19, 2024.03.20, 2024.04.25, 2024.06.05 හා 2024.06.24 දිනැති ලිපි මගින් වාර්තා කර ඇත.** |
| 03 | **<u>සමෘද්ධි බැංකු පරිගණකගත කිරීමේ වැඩපිළිවෙලේ වර්තමාන තත්ත්වය</u>**<br><br>සමෘද්ධි බැංකු පරිගණකගත කිරීමේ වර්තමාන තත්ත්වය පිළිබඳව කාරක සභාව විසින් විමසන ලද අතර විගණන | මේ වන විට මොණරාගල රතුගල බැංකු ශාඛාව හැර ආරම්භයේදී සැලසුම් කළ සමෘද්ධි බැංකු 1089 ම පරිගණකගත කර ඇති බවත්, අලුතින් ආරම්භ කරන ලද බැංකු 05 ක් මෙතෙක් පරිගණකගත කර නොමැති බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී සියලුම ගිණුම් බැර කිරීම්, පොළී |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | කටයුතු අවසන් කර පරිගණක පද්ධතියට එක්කර ඇත්තේ බැංකු 100ක් පමණක් බව ද කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>සමෘද්ධි බැංකු පරිගණකගත කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් කාර්යයන් 2023.12.31 දිනට සම්පූර්ණ කර නොමැති බවත්, පරිගණක පද්ධතිය ඉලක්කගත මට්ටමට සංවර්ධනය කර නොමැති බවත්, හස්තීය (Manual) ක්‍රියාවලියේ ශේෂ පිරික්සුම් තුලනය නොවන අවස්ථා ඇති බවත් නියෝජ්‍ය විගණකාධිපතිවරයා කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. පරිගණක ශිල්ප ක්‍රම භාවිත කරමින් සමෘද්ධි බැංකුවල කටයුතු විගණනය කිරීමේ පහසුකම් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතු වන බවත්, මෙම පරිගණක පද්ධතියේ ඒ සඳහා විගණන මාර්ගයක් (audit trail) තිබෙන බව සඳහන් කර ඇති බවත් සඳහන් කළ නියෝජ්‍ය විගණකාධිපතිවරයා, මෙම පද්ධතිය තවමත් එම ඉලක්කයට (target) ළඟා වී නොමැති බවත් ප්‍රකාශ කළේය. | බැර කිරීම්, අවසාන ගිණුම් පිළියෙල කිරීම් යන කටයුතු පරිගණක මෘදුකාංගය භාවිත කරමින් සිදු කළ බව ද ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>හස්තීය (Manual) ක්‍රියාවලිය නැවැත්වීම සඳහා බැංකු 500 ක් විසින් ඉල්ලුම් කර ඇති නමුත්, ක්‍රියාකාරී සැලැස්ම අනුව පරිගණකගත කිරීමේ කටයුතු සිදු කළද, විගණන කටයුතු සහ හස්තීය (Manual) ක්‍රියාවලියේ වැරදි නිවැරදි කිරීමේ කටයුතු හේතුවෙන් මෙතෙක් ඒ සඳහා අවසර ලබා දිය හැකි වූයේ බැංකු 100 ක් සඳහා පමණක් බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. මෙම කාර්යය සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හරහා අනුමැතිය ලබා දීමට ආරම්භයේදී තීරණය කර තිබුණද, ඒ සඳහා යම් කාලයක් ගත වන බැවින් මෙම කාර්යය වේගවත් කිරීම සඳහා විගණන නිලධාරීන්, තොරතුරු තාක්ෂණ නිලධාරීන් හා බැංකු අධීක්ෂණ නිලධාරීන්ගෙන් සමන්විත දිස්ත්‍රික් කමිටුවක් නම් කර එමගින් අදාළ අවසරය ලබා දීමට යෝජනා කර ඇති බව ද ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>සමෘද්ධි බැංකුවල සමස්ත ක්‍රියාවලිය පරිගණකගතව/ මාර්ගගතව සිදු කිරීම සඳහා මෘදුකාංගයක් මේ වන විටත් සකස් කර ඇති බවත්, Google sheet මගින් බැංකු පරිගණකගත කිරීමේ කාර්යයේ මාසික ප්‍රගතිය යාවත්කාලීන කරන ලෙස දිස්ත්‍රික් මට්ටමින් උපදෙස් ලබා දී ඇති බවත් ප්‍ර.ග.නි./ ග.නි. සඳහන් කළේය. ඇතැම් බැංකුවල ආරම්භයේ සිටම පවතින පුද්ගල ශේෂ පිරික්සුම් සම්බන්ධ ගැටළු මෙම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම සඳහා හෝ බැංකුවේ එදිනෙදා කටයුතු සඳහා බාධාවක් නොවන බවත්, දිවයින පුරා බැංකුවල එය සාර්ථකව ක්‍රියාත්මක වන බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>සියලුම සමෘද්ධි බැංකු හස්තීය (Manual) ක්‍රියාවලියෙන් ඉවත් කර සම්පූර්ණයෙන් පරිගණක පද්ධතිය මඟින්ම ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කළ කාරක සභාව, සමෘද්ධි බැංකු පරිගණකගත කිරීම වේගවත් කිරීම සඳහා කඩිනමින් විගණන නිලධාරීන්, තොරතුරු තාක්ෂණ නිලධාරීන්, බැංකු අධීක්ෂණ නිලධාරීන්ගෙන් සමන්විත දිස්ත්‍රික් කමිටු පත් කර, එක් එක් බැංකුව වෙත විගණනය ඇතුළුව එහි කාර්යයන් සම්පූර්ණයෙන් පරිගණකගත කිරීම සඳහා කාල රාමුවක් ලබා දී ඒ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>ප්‍රායෝගිකව සමෘද්ධි බැංකු කටයුතුවලට අදාළ පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ගැටළු පවතින බව නිරීක්ෂණය වන බැවින් එම ගැටළු කඩිනමින් නිරාකරණය කළ යුතු බවත්, සියලුම සමෘද්ධි බැංකුවල හස්තීය (Manual) ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ඉවත් කර පරිගණක පද්ධතිය ඔස්සේ බැංකු කටයුතු ක්‍රියාත්මක කළ යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය.<br><br>**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 II වෙළුම හා** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **2024.04.30 දිනැති ලිපියෙන් කාරක සභාවේ උපදෙස් පරිදි දිස්ත්‍රික් කමිටු පත් කර ඇති බවත්, සම්පූර්ණ පරිගණකගත කිරීම සම්බන්ධ වාර්තාවක් ඉදිරියේදී ලබා දීමට කටයුතු කරනු ලබන බවත් වාර්තා කර ඇත.** |
| 04 | **<u>පරිගණක 340 ක් ප්‍රසම්පාදනය කිරීමේදී සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට රුපියල් මිලියන 11 ක පමණ පාඩුවක් සිදුවී තිබීම (සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2022-154(6) වාර්තාව 3.4 ඡේදය)</u>**<br>පරිගණක 340 ක් ප්‍රසම්පාදනය කිරීමේදී පළමු ප්‍රසම්පාදනයේදී තෝරා ගත් අඩු වටිනාකමකින් යුත් ලංසුව වෙනුවට නැවත ප්‍රසම්පාදනය කර තෝරාගත් සැපයුම්කරු වෙතින් ඒකකයක් රුපියල් 149,500 ක් බැගින් ඉහළ මිලකට පරිගණක මිල දී ගෙන තිබීම පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව ඒ සඳහා පදනම් වූ කරුණු පිළිබඳව විමසීමක් කළේය. | මෙම මිල ගණන් කැඳවීම 2020 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී සිදු කරන ලද බවත්, ඒ සඳහා ඉදිරිපත් වූ මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් අගයනු ලැබූ බවත් ප්‍ර.ග.නි./ ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. එහිදී මිළ ගණන් ඉදිරිපත් කළ දේශීය සැපයුම්කරුවෙකු විසින් දේශීය කර්මාන්ත දිරි ගැන්වීමේ ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නිකුත් කරන ලද අංක 03/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ඉදිරිපත් කළ බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ ග.නි., එම චක්‍රලේඛය මගින් දේශීය අමුද්‍රව්‍ය භාවිත කරන නිෂ්පාදකයින් සඳහා 30% ක සහනයක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දී තිබීම පදනම් කරගෙන ප්‍රසම්පාදන කමිටුව විසින් එම සැපයුම්කරු තෝරා ගැනීම නිර්දේශ කර තිබූ බවත් ප්‍රකාශ කළේය.<br><br>මිළ ගණන් කැඳවන අවස්ථාවේදී මෙම චක්‍රලේඛය නිකුත් කර නොතිබීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ එක් සාමාජිකයෙකු මෙම තීරණය සඳහා එකඟ වී නොතිබුණු අතර සාමාජිකයින් දෙදෙනෙකු අදාළ නිර්දේශය ලබා දී තිබූ බවත් හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය. ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත නොකළ බවත්, නැවත මිල ගණන් කැඳවා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ප්‍රසම්පාදනය කරන ලෙසට තීරණය කළ බවත්, ඒ අනුව නැවත මිල ගණන් කැඳවා ප්‍රසම්පාදනය කිරීමේදී ඉහත දේශීය නිෂ්පාදකයා තෝරා ගෙන ඇති බවත් ප්‍ර.ග.නි./ ග.නි. තවදුරටත් ප්‍රකාශ කළේය.<br><br>මෙම ප්‍රසම්පාදන කමිටුව වගකීම් විරහිතව කටයුතු කර ඇති බවත්, එමගින් රුපියල් මිලියන 11 ක පමණ පාඩුවක් සිදු වී ඇති බවත් කාරක සභාව පෙන්වා දුන්නේය. තවද, මෙම පරිගණක මිලදී ගැනීමට වසරකට පමණ පෙර ඒවා සඳහා අවශ්‍ය වන උපාංග/ අමතර කොටස් 2021 වර්ෂයේදී මිලදී ගෙන නිෂ්කාර්යව තබා තිබුණු බව ද මෙහිදී හෙළි විය.<br><br>පළමු ප්‍රසම්පාදනයේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 පදනම් කර ගෙන ඉදිරිපත්ව තිබුණු අවම ලංසුවට පසු ලංසුව තෝරා ගෙන තිබුණු බවත්, අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි නැවත ප්‍රසම්පාදනය කිරීමේදී ඉදිරිපත් වූ අවම ලංසුව තෝරා ගෙන ඇති බවත්, එම ලංසුකරු පළමු ප්‍රසම්පාදනයේදී තෝරාගත් පුද්ගලයාම වන බවත් ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ ග.නි., මෙම ප්‍රසම්පාදනයන් කැඳවීම අතර පැවති කාල පරාසය හේතුවෙන් පරිගණකවල මිල ගණන්වල වෙනසක් සිදු වී ඇති බව සඳහන් කළේය.<br><br>මිල ගණන් කැඳවන අවස්ථාවේ නිකුත් කර නොතිබුණු චක්‍රලේඛයක් එම ප්‍රසම්පාදනය සඳහා සැලකිය නොහැකි වන බවත්, ප්‍රසම්පාදනය සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය වන විටක තාක්ෂණික ඇගයීමේ කමිටුව (TEC) විසින් ප්‍රසම්පාදන කමිටුවෙන් හෝ ප්‍රසම්පාදන කොමිෂන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සභාව වෙතින් උපදෙස් විමසිය යුතුව තිබුණු බවත් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් මෙහිදී ප්‍රකාශ කරන ලදී.<br><br>දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජ ආරක්ෂණ විෂයය කටයුතු සඳහා ඉහත මිලදී ගෙන ඇති පරිගණක කිසිදු තාක්ෂණික ගැටළුවකින් තොරව භාවිත කරනු ලබන බව ද ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ඉහත පරිගණක ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනයෙන් හෙළි වූ කරුණු පිළිබඳව කාරක සභාව මෙහිදී විමසීමක් කළ අතර, පළමු ප්‍රසම්පාදනයේදී තාක්ෂණික ඇගයීමේ කමිටුව නිසි පරිදි ඇගයීම සිදු කර ඇති බවත්, ප්‍රසම්පාදන කමිටුව මගින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 අදාළ කර ගැනීම හේතුවෙන් මෙම ගැටළුව උද්ගතව ඇති බවත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මෙම පරිගණක ප්‍රසම්පාදන කටයුත්ත හේතුවෙන් මූල්‍ය පාඩුවක් සිදු වී ඇති බව පෙනී යන බැවින් තවදුරටත් මේ පිළිබඳව සොයා බලා මෙම පරිගණක මිල දී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කළ නිලධාරීන්ගේ නම්, එම කමිටුව විසින් ලබා දුන් නිරීක්ෂණ සහ මෙම කරුණ සම්බන්ධව කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ/ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ද ඇතුළත් වැඩිදුර තොරතුරු සහිත වාර්තාවක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | 2024.02.10 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 II වෙළුම හා 2024.02.09 දිනැති ලිපියෙන් අදාළ ප්‍රසම්පාදනය පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් එවා ඇත.** |
| 05 | **<u>ජීවනෝපාය සඳහා සමෘද්ධිලාභීන් වෙත මාලු දැල් ලබාදීමේදී ”දමන“ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මූල්‍ය අක්‍රමිකතාවයන් සිදු වී ඇති බවට වාර්තා වීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම.</u>**<br>මෙම සිදුවීම පසුගිය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී ද දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය වූ බව පෙන්වා දුන් කාරක සභාව එම අක්‍රමිකතාවයන් සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව විමසීමක් කළේය. | මෙ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ විගණන අංශය මගින් සිදු කරන ලද විශේෂ පරීක්ෂණයක් මගින් 2021 වර්ෂයේදී ජීවනෝපාය සංවර්ධනය සඳහා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අරමුදල් ලබා දී ඇති බවත්, ප්‍රාදේශීය ලේකම් විසින් ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමෙන් තොරව ප්‍රසම්පාදන කමිටුවක් පමණක් පත් කර ඇති බවත් අනාවරණය වූ බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. මෙම සිදුවීමට සම්බන්ධ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන් වන ව්‍යාපෘති කළමනාකරු හා මූලස්ථාන කළමනාකරු විසින් ධීවර ජනතාව තෝරා ගෙන මාලු දැල් බෙදා දීම සිදු කර ඇති බවත්, ඒ අනුව අදාළ ලේඛන පවත්වා නොගැනීම සම්බන්ධයෙන් එම නිලධාරීන්ගෙන් නිදහසට කරුණු විමසා විනය දඬුවම් ලෙස ස්ථාන මාරුවීම් ලබා දී ඇති බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>මෙහිදී අදාළ නිලධාරීන් වෙත ලබා දී ඇති විනය දඬුවම් වන්නේ දිනක වැටුප |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | අත්හිටුවීම සහ අවවාද කිරීම බව කාරක සභාව නිරීක්ෂණය කළේය. මින් පෙර අවස්ථාවල රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී මෙම කරුණ සාකච්ඡා වීමෙන් අනතුරුවද, මෙම මාළු දැල් බෙදා දීමේ කටයුත්ත නිසි පරිදි සිදු කර නොතිබීම සහ මිල දී ගෙන තිබුණු මාළු දැල් නිසි පිරිවිතර සපුරා නොමැති වීම වැනි ගැටළු පවතින බව ද මෙහිදී අනාවරණය විය.<br><br>මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම අදාළ ප්‍රාදේශීය ලේකම් සතු වන බැවින් ඒ පිළිබඳව කටයුතු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන්ගේ විෂමාචාර ක්‍රියාවන් සඳහා ගෙන ඇති පියවර සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි බව අවධාරණය කළ කාරක සභාව, මෙම සිදුවීම සම්බන්ධයෙන් අදාළ සමෘද්ධි කළමනාකරු අරමුණු සහගතව වගකීමට බැඳෙන බවත්, භාණ්ඩ ලැබීමෙන් වසර 02 ක් පමණ යනතුරු ඒවා බෙදා නොතිබීම, භාණ්ඩ සඳහා නිසි පිරිවිතර ලබා නොදීම, ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව පසු විපරම් සිදු නොකිරීම යනාදිය ලඝු කාර්යයන් ලෙස විනය බලධරයා විසින් සලකා තිබෙන බවත් පෙන්වා දුන්නේය. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධව අක්‍රමිකතා සිදුවීම් 163 ක් පමණ වාර්තා වන බවත්, ඒවා සඳහා පවත්වන ලද පරීක්ෂණ පක්ෂග්‍රාහී ලෙස සිදු කර ඇති බවත්, බරපතල විෂමාචාර සඳහා සුළු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | දඬුවම් ලබා දී ඇති බවත් මෙහිදී අනාවරණය විය. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ කාරක සභාව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අක්‍රමිකතා පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණ සම්බන්ධයෙන් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු කළ යුතු බව අවධාරණය කළේය.<br><br>දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභීන් වෙත මාලු දැල් ලබා දීමේදී සිදුවූයේ යැයි සඳහන් ප්‍රශ්නගත සිදුවීම සම්බන්ධයෙන් කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය මට්ටමෙන් නැවත පරීක්ෂණයක් සිදු කරන ලෙසත්, මෙම ප්‍රශ්නගත මාළු දැල් මිල දී ගැනීමේ ක්‍රියාදාමය ආරම්භයේ සිට එක් එක් පියවරයන්/ කාර්යයන් සහ ඒ සම්බන්ධයෙන් වගකීම් පැවරී තිබුණු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් පිළිබඳව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට යොමු කළ හැකි පරිදි තොරතුරු ඇතුළත් වාර්තාවක් අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ ද සමග 2024.01.16 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය. මේ සම්බන්ධව කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙතොත් ධීවර අමාත්‍යාංශය සමග ඒ සඳහා සම්බන්ධ වන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 II වෙළුම හා 2024.01.16 දිනැති ලිපියෙන් ඉහත තොරතුරු වාර්තාව එවා ඇති අතර, අමාත්‍යාංශ මට්ටමින් මූලික විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. මෙම කරුණ සම්බන්ධව වැඩිදුර කටයුතු සඳහා එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ පරිදි 2024.01.26 දිනැතිව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද අතර, එම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HAF/INV/22/2023-11(09) හා 2024.03.08 දිනැති ලිපියෙන් මෙම කරුණට අදාළව ප්‍රසම්පාදන කමිටු තීරණ ගැනීමේදී සිදු වී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ නිලධාරීන් වෙත ලඝු විනය පටිපාටිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව දන්වා ඇත.<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 I වෙළුම හා 2024.08.20 දිනැති ලිපියෙන් එම අමාත්‍යාංශය මට්ටමින් මෙම සිදුවීම පිළිබඳ පවත්වන ලද මූලික විමර්ශනයේ වාර්තාව අනුව සිද්ධියට අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ පළමු උපලේඛනගතව චෝදනා පත්‍ර නිකුත් කිරීමට තරම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **ප්‍රමාණවත් හේතු නිරීක්ෂණය නොවන බවත්, එම නිලධාරීන් කෙරෙහි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවරයන් සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි බවත් වාර්තා කර ඇත.** |
| 06 | **<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුදල් විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් නොවීම.</u>**<br>දිවිනැගුම පනතේ 45 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තු අරමුදල් සඳහා වාර්ෂික අයවැය ලේඛන සකස් කර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සිදු නොකරන බව කාරක සභාවේදී අනාවරණය විය. ජීවනෝපාය සංවර්ධන අරමුදල මේ දක්වා විගණනයට ඉදිරිපත් කර නොමැති බවත්, ඊට අමතරව නිසි අනුමැතියක් ලබා ගෙන නොමැති අරමුදල් 15 ක් පවතින බවත්, ඒ අතුරින් අරමුදල් 09 ක් ක්‍රියාත්මක නොවන බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය. භාණ්ඩාගාරය විසින් ලබා දුන් මුදල් සහ සාමාජිකයන්ගේ අනිවාර්ය තැන්පතුවලින් ගොඩනගන ලද මෙම අරමුදල් මෙතෙක් භාණ්ඩාගාරයේ පාලනයට හෝ විගණකාධිපතිවරයාගේ විගණනයට හෝ යටත් වී නොමැති බවත්, බිලියන 48 ක් පමණ වටිනාකමක් ඇති මෙම | මෙම අරමුදල් සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කරන ලෙස දන්වා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් වරින් වර සිහිකැඳවීම් ලිපි යොමු කරනු ලබන නමුත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් යම් තාක් දුරකට හෝ ප්‍රතිචාර දක්වනු ලබන්නේ දෙපාර්තමේන්තු අරමුදල් දෙකක් සඳහා පමණක් බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව ප්‍රකාශ කළ අතර, නව අරමුදල් දෙකක් පිහිටුවීම සඳහා අනුමැතිය ඉල්ලා ඇති බව ද සඳහන් කළේය.<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුදල් අතුරින් රුපියල් බිලියන 14.5 ක වටිනාකමක් පවතින සමාජ ආරක්ෂණ භාර අරමුදලේ අවසන් ගිණුම් නිසි කලට සකස් කර රජයේ විගණනය සඳහා ඉදිරිපත් කරන බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. ජීවනෝපාය සංවර්ධන චක්‍රීය අරමුදල 2007 – 2013 කාලසීමාව තුළ භාණ්ඩාගාරය විසින් ප්‍රතිලාභීන් වෙත ලබා දුන් ණයවලින් 50% ක් එකතු කිරීමෙන් ආරම්භ කරන ලද බවත්, එය අරමුදලක් ලෙස නම් කිරීමේ ගැටළුවක් පවතින බවත් ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ ග.නි., සෑම සමෘද්ධි බැංකු ශාඛාවකම එහි ගිණුමක් ඇති බවත්, එහි මුදල්, සමෘද්ධිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ණය ලබාදීමට භාවිත කරන බවත්, එය දෙපාර්තමේන්තුවේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | අරමුදල් මූල්‍ය පාලනයෙන් බැහැරව ඇති බවත් අනාවරණය විය. මෙම අරමුදල් නීත්‍යානුකූල ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමග සාකච්ඡාවන් පවත්වන ලද බව නියෝජ්‍ය විගණකාධිපතිවරයා සඳහන් කළේය. | අභ්‍යන්තර විගණනයට යටත් වන බවත් සඳහන් කළේය.<br><br>දෙපාර්තමේන්තු අරමුදල් 07 ට අමතරව පවතින බවට සඳහන් කෙරුණු අරමුදල් 15 දැනට අරමුදල් ලෙස ක්‍රියාත්මක නොවන බවත්, ඒවා බැංකු කළමනාකරණ මණ්ඩලය මගින් පාලනය වන බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>මෙම අරමුදල් පිළිබඳව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට කටයුතු කරන ලෙසට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දුන් කාරක සභාව, සමෘද්ධි බැංකු හරහා ජීවනෝපාය නගා සිටුවීම සඳහා ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට මෙම අරමුදල් භාවිත කළ යුතු වන බව ප්‍රකාශ කළේය.<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු අරමුදල්වල වටිනාකම වන රුපියල් බිලියන 48 න් රුපියල් බිලියන 43 ක් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් බවත්, ගිණුම් හිමියන්ගේ අවශ්‍යතාවය පරිදි එම මුදල් නිදහස් කළ යුතු වන බවත්, ඒ අනුව තත්‍ය වශයෙන් රුපියල් බිලියන 5 ත් 6 ත් අතර ප්‍රමාණයක් අනෙකුත් අරමුදල් ලෙස පවතින බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. සමෘද්ධි බැංකු පද්ධතියේ ද්‍රවශීලතාවය හීන වූ බැංකු දැනට නොමැති බව ද ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි., අනිවාර්ය ඉතිරි කිරීම් ආපසු ලබා ගැනීමේ වයස් සීමාව අවුරුදු 70 සිට අවුරුදු 60 දක්වා අඩු කිරීම නිසා සමෘද්ධි බැංකුවලින් මුදල් ලබා ගැනීමේ වැඩිවීමක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සිදු වී තිබෙන බව සඳහන් කළේය. ඒ අනුව, රුපියල් මිලියන 600 ක් පමණ ලබා දෙන ලෙස සමෘද්ධි බැංකුවලින් ඉල්ලීම් ලැබී ඇති බවත්, එම මුදල් ප්‍රතිලාභීන් වෙත අවශ්‍ය පරිදි ලබා දීම සඳහා එම බැංකු වෙත යැවීමට කටයුතු කරන බවත් සඳහන් කළේය. <br><br> අනිවාර්ය ඉතිරි කිරීම්වලින් සේවක නිවාස ණය සඳහා රුපියල් මිලියන 476 ක් ලබා දී ඇති බව කාරක සභාව පෙන්වා දුන්නේය. අනිවාර්ය ඉතිරි කිරීම්වලින් නිලධාරීන් වෙත ණය ලබාදීමක් සිදු නොකරන බවත්, මෙම ණය මුදල් සමෘද්ධි බැංකු සමිති මඟින් ඒවායේ අරමුදල්වලින් ලබා දුන් "නිලදරු ණය" බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. මෙම අරමුදල් සමෘද්ධිලාභීන්ගේ මූල්‍ය අවශ්‍යතා සඳහා ඵලදායී ලෙස යොදා ගත යුතු බවත්, ඉතා දිළිඳු ප්‍රජාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සඳහා ද මෙම අරමුදල් ඵලදායී ලෙස උපයෝගී කර ගත යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය. <br><br> ඒ සඳහා 2024 වර්ෂයේදී නව ණය යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දෙනු ලබන බවත්, ඉදිරියේදී වැඩි ණය ප්‍රමාණයක් ලබා දීමට අපේක්ෂා කරන බවත්, බැංකු ණය ලබා ගැනීමට නොහැකි සමෘද්ධිලාභීන් සඳහා ප්‍රජා මූල සංවිධාන හරහා "අරුණළු" ණය වැඩසටහන ක්‍රියාත්මක වන බවත් ප්‍ර.ග.නි./ ග.නි. මෙහිදී ප්‍රකාශ කළේය <br><br> <u>**නිර්දේශ**</u> <br> මෙම අරමුදල් සම්බන්ධයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ජනරාල්වරයා විසින් වගකීම භාර ගත යුතු බව අවධාරණය කළ කාරක සභාව, ඵලදායී නොවන අරමුදල් භාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස ද උපදෙස් දුන්නේය.<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති සියලුම අරමුදල් සම්බන්ධව අරමුදලේ නම, අරමුදල ආරම්භ කළ දිනය, අරමුදල ඇති කිරීමේ අරමුණ, අරමුදලේ බැංකු ගිණුම් පිළිබඳ විස්තර, අරමුදලේ වර්තමාන ශේෂය, අරමුදලේ වගකීම දරන්නේ කවරෙක්ද යන්න, චෙක්පත් අත්සන් කිරීමේ බලය පැවරී ඇත්තේ කාහට ද යන්න, අරමුදල පිහිටුවා ඇති නීතිමය පසුබිම, අරමුදල සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග යන තොරතුරු ඇතුළත් වාර්තාවක් 2024.02.10 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 II වෙළුම හා 2024.02.09 දිනැති ලිපියෙන් ඉහත වාර්තාව එවා ඇත.** |
| 07 | **<u>"අස්වැසුම" වැඩසටහනට අයත් නොවන සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම.</u>** | සමස්ත සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වන 1,638,000 අතරින් "අස්වැසුම" ප්‍රතිලාභ දීමනා හිමි නොවන සංඛ්‍යාව දළ වශයෙන් ලක්ෂ 8 ක් පමණ වන බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>"අස්වැසුම" වැඩසටහන යටතේ දිළිඳු හා අන්ත දිළිඳු යන කාණ්ඩවලට වර්ගීකරණය කරනු ලැබ ඇති ප්‍රතිලාභීන්ගෙන් සමෘද්ධි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ වැඩසටහනට ඇතුළත් වීම සඳහා එකඟතාවය ලබා ගැනීම සඳහා චක්‍රලේඛ නිකුත් කිරීම, මේ සඳහා සම්බන්ධ වන වාණිජ බැංකු සමග සාකච්ඡා කිරීම හා සමාජ ආරක්ෂණ වැඩසටහනට දායක වීමට කැමැත්ත ප්‍රකාශ කරන "අස්වැසුම" ප්‍රතිලාභ හිමියන්ගේ තොරතුරු එක් රැස් කිරීම යන කාර්යයන් මේ වන විට සිදු කෙරෙමින් පවතින බවත්, 2024 ජනවාරි මස අවසානයේදී එම කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. දිළිඳු පවුල් ලක්ෂ 8 ක් හා අන්ත දිළිඳු පවුල් ලක්ෂ 4 ක් වශයෙන් පවුල් ලක්ෂ 12ක් සවිබලගැන්වීමේ වැඩසටහනක් සකස් කිරීම අමාත්‍ය මණ්ඩලය තීරණයක් අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබෙන බවත්, ඒ සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙතින් නිර්දේශ ලබා ගෙන සකස් කරන ලද සැලැස්ම අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා කඩිනමින් යොමු කරනු ලබන බවත් ප්‍ර.ග.නි./ ග.නි. තවදුරටත් ප්‍රකාශ කළේය. <br><br> පසුගිය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී ද මෙම වැඩසටහන් පිළිබඳව අවධානය යොමු කළ බව පෙන්වා දුන් කාරක සභාව "අස්වැසුම" ප්‍රතිලාභ දීමනා හිමි නොවන සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම සඳහාද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රමුඛතාවයක් දී කටයුතු කළ යුතු බව නැවතත් අවධාරණය කළේය. <br><br> **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | "අස්වැසුම" ප්‍රතිලාභ හිමි නොවන සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම සඳහා නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බව කාරක සභාව මෙහිදී අවධාරණය කළේය.<br>"අස්වැසුම" ප්‍රතිලාභ හිමි නොවන සමෘද්ධිලාභීන් ග්‍රාම නිලධාරී වසම් අනුව විවිධ මට්ටම් යටතට වර්ගීකරණය කර, ඒ අනුව එම එක් එක් කාණ්ඩ සඳහා සුදුසු පරිදි වැඩසටහන් සකස් කරන ලෙසට ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSE/ACC/01/44 II වෙළුම හා 2024.04.30 දිනැති ලිපියෙන් ඉහත වාර්තාව එවා ඇත.** |
| **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**<br><br>***(2019, 2020 සහ 2021 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව)***<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජනවාරි 11** | | |
| **කැඳවන ලද ආයතන-**<br>❖ කෘෂිකර්ම අමාත්‍යාංශය<br>❖ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| 01 | <u>**ආනයනික ගව ශුක්‍ර පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව තුළ නොතිබීම**</u> | <u>**නිර්දේශ**</u><br>රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් ආනයනය කරන ගව ශුක්‍ර ප්‍රමාණය, ප්‍රමිතිය, තොග පවත්වා ගැනීම, එය ජාතික සංඛ්‍යාලේඛන වලට එකතු කිරීමේ වැඩපිළිවෙලක් හා ඒවායේ සාර්ථකභාවය පිළිබඳව පසුවිපරමක් සිදුකිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස්කර ඒ පිළිබඳ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | වාර්තාවක් 2023 අගෝස්තු 07 දින වනවිට කාරක සභාවට යොමුකරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය. <br><br> කාරක සභාවේදී අනාවරණය වූ කරුණු අනුව පශු වෛද්‍ය කාර්යාල මඟින් සෘජුවම මධ්‍යගත පද්ධතියට තොරතුරු ඇතුළත් කරන බව හා එම තොරතුරු සම්බන්ධයෙන් පළාත් අධ්‍යක්ෂවරුන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ ද දැනුවත්භාවය වැදගත් වන බැවින් මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව උපදෙස් ලබා දුන්නේය. |
| 02 | <u>**අලුතෙන් ලියාපදිංචි කරනු ලබන සත්ත්ව ගොවිපළ හා වැසී යන සත්ත්ව ගොවිපළ පිළිබඳ තොරතුරු පළාත් කාර්යාලවල නොතිබීම**</u> | අලුතෙන් ලියාපදිංචි කරනු ලබන සත්ත්ව ගොවිපළ හා වැසී යන සත්ත්ව ගොවිපළ පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් මාර්ගගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් (Online Information System) කඩිනමින් සකස් කරන ලෙසත් එය සකස් කොට ක්‍රියාත්මක කිරීම දක්වා දින වකවානු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් 2024 පෙබරවාරි මස 12 වැනි දිනට පෙර කාරක සභාව වෙත එවන ලෙසත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා / ගණන් දීමේ නිලධාරියා (ප්‍ර.ග.නි./ග.නි.) වෙත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි. <br> **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DAPH/FD/01/04/14/ වෙළුම iii හා 2024.03.27 දිනැති ලිපිය මඟින් වාර්තාවක් එවා ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| 03 | <u>උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව භාවිත කරනු ලබන ආකාරයේ තොරතුරු හා දත්ත පද්ධතිය (Database & Information System) අනෙකුත් පළාත් සඳහා ද හඳුන්වා දීම.</u> | මේ සඳහා ඉහළම ප්‍රමුඛතාව ලබාදී උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව භාවිතාකරනු ලබන ආකාරයේ විධිමත් තොරතුරු හා දත්ත පද්ධතියක් අනෙකුත් පළාත් සඳහා ද හඳුන්වා දීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. වෙත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DAPH/FD/01/04/14/ වෙළුම iii හා 2024.03.27 දිනැති ලිපිය මගින් පිළිතුරු එවා ඇත.** |
| 04 | <u>පළාත් පාලන කොට්ඨාස මට්ටමින් පශු සම්පත් සමිති පිහිටුවීම</u>. | උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සත්ව පාලන සමිති ආදර්ශයට ගෙන, පළාත් පාලන කොට්ඨාස මට්ටමින් දිවයිනේ සියලුම පළාත් තුළ පශු සම්පත් සමිති පිහිටුවීම සඳහා කටයුතු කරන ලෙසත්, එම සමිතිවල කාර්යභාරයන් නිශ්චිතව ඇතුළත් උපදෙස් පත්‍රිකාවක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අදාළ චක්‍රලේඛ/ ගැසට් නිකුත් කර එම සමිතිවලට අදාළ නෛතික පසුබිම සකස් කරන ලෙසත්, (සියලු පළාත් සමඟ Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡා කර ඔවුන්ගේ ද අදහස් ලබාගෙන) මෙම සමිති පිහිටුවීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් 2024.02.12 දින වනවිට කාරක සභාවට යොමු කරන ලෙසත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DAPH/FD/01/04/14/ වෙළුම iii හා 2024.03.27 දිනැති ලිපිය මගින් පිළිතුරක් එවා ඇත.** |
| 05 | **<u>කෘෂිකර්ම අමාත්‍යාංශය ඊට සම්බන්ධිත පළාත් දෙපාර්තමේන්තු සමග රැස්වීම් පැවැත්වීම පිළිබඳව වර්තමාන තත්ත්වය කාරක සභාව විමසා සිටියේය.</u>** | පශු සම්පත් ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම පිළිබඳ මූලික වගකීම අමාත්‍යාංශ ලේකම් වෙත පැවරෙන බැවින් අදාළ චක්‍රලේඛ නිකුත් කිරීමට ප්‍රථමයෙන් පළාත් 9 හි ම කෘෂිකර්ම දෙපාර්තමේන්තු සමග zoom තාක්ෂණය ඔස්සේ හෝ මාසයකට වරක් සම්බන්ධ වී අදහස් හා යෝජනා ලබා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී. |
| 06 | **<u>කෘෂිකර්ම අමාත්‍යාංශයේ හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව තුළ අනුමත කාර්යය මණ්ඩලය විසිරී ඇති ආකාරය පිළිබඳව සහ පළාත් මට්ටමින් අනුමත කාර්යය මණ්ඩලය පිළිබඳව කාරක සභාව කරුණු විමසීය.</u>** | රට පුරා ඇති පශු විමර්ශන කාර්යාල, සියලු පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් ඉටු කරනු ලබන කාර්යය ප්‍රමාණයට අනුලෝමව අනුමත කාර්යය මණ්ඩලය අනුයුක්ත කිරීම සඳහා සුදුසු ආකෘතියකින් සකස් කළ චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස කාරක සභාව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිළධාරීන් වෙත උපදෙස් ලබා දුන්නේය. |
| 07 | **<u>රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් කෘත්‍රිම සිංචන සිදු කිරීමේ ගාස්තු නිර්ණය කිරීම.</u>** | පළාත් 9 හිම කෘත්‍රිම සිංචන කටයුතු සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සේවා ගාස්තු අය කිරීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක ඇතුළත් ක්‍රමවේදයක් සකස් කර ඒ පිළිබඳ වාර්තාවක් 2024.02.12 දින වනවිට කාරක සභාවට වෙත යොමු කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DAPH/FD/01/04/14/ වෙළුම iii හා 2024.03.27 දිනැති ලිපිය මගින් වාර්තාවක් එවා ඇත.** |
| 08 | **කුර හා මුඛ රෝග සඳහා එන්නත් වඩි 100,000 ක් මිළදී ගැනීමේ දී වෙළඳපොළ මිලට වඩා වැඩි මිලක් ගෙවීම හේතුවෙන් රු. මිලියන 3.9 ක් පමණ වැඩිපුර ගෙවා තිබීම.** | මේ සම්බන්ධයෙන් සොයාබලා නිරීක්ෂණ සහිත පූර්ණ වාර්තාවක් කාරක සභාව වෙත යොමු කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>**කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අංක DAPH/FD/01/04/14/ වෙළුම iii හා 2024.03.27 දිනැති ලිපිය මගින් වාර්තාවක් එවා ඇත.** |
| 09 | **රජය සතු ඉඹුලන්දණ්ඩ සහ තෙලහැර අභිජනන මධ්‍යස්ථානවල සිටින ආනයනික එළුවන් නිරෝධායන කාලසීමාව තුළදී හා ඉන්පසු කාලය තුළ දී රෝගවලට භාජනය වීම, මියයාම හා ඔවුන් බිහිකළ පැටවුන් බොහෝමයක් මියයාම.** | මීට අදාළව අමාත්‍යාංශය විසින් සිදුකරන ලද පරීක්ෂණයෙහි නිර්දේශ ඇතුළත් කරන ලද පූර්ණ වාර්තාවක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DAPH/FD/01/04/14/ වෙළුම iii හා 2024.03.27 දිනැති ලිපිය මගින් වාර්තාවක් එවා ඇත.** |
| 10 | **පසුගිය වර්ෂ 3 හි සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා ඖෂධ සඳහා වැයකළ මුළු මුදල හා සුරතල් සතුන්ට ප්‍රතිකාර කිරීමේ දී ඖෂධ සඳහා වැය කළ මුදල ගණනය කිරීම.** | මේ කරුණ සම්බන්ධයෙන් පළාත් 9 හිම වෙන් වෙන් වශයෙන් ඖෂධ සඳහා වැයකළ මුදල හා සුරතල් සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා වැයකළ මුදල් පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් 2024.02.12 දින වනවිට කාරක සභාව වෙත යොමු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. <br><br> **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DAPH/FD/01/04/14/ වෙළුම iii හා 2024.03.27 දිනැති ලිපිය මගින් වාර්තාවක් එවා ඇත.** |
| 11 | <u>කරදගොල්ල හා සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයන්හි වර්තමාන තත්ත්වය</u> | ප්‍රමාණවත් පුළුල් ප්‍රචාරණයක් ලබාදී යම් අය කිරීමක් සහිතව පාඨමාලා සඳහා බඳවා ගැනීමට කටයුතු කිරීම තුළින් පාඨමාලා අතරතුර ශිෂ්‍යයන් පාඨමාලා හැරයාම අවම කරගත හැකි බවත්, කරදගොල්ල හා සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාල 2 පිළිබඳව විශේෂ අවධානය යොමුකර එහි කටයුතු සාර්ථකව පවත්වා ගෙනයාමට කටයුතු කරන ලෙසත් කාරක සභාව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදී. |
| **ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව** <br><br> ***(2021, 2022 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව)*** <br><br> **විමර්ශනය කරන ලද දිනය - 2024 ජනවාරි 23** | | |
| **කැඳවන ලද ආයතන-** <br> ❖ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය <br> ❖ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | | |
| 01 | <u>**1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් 11**</u> | එම ප්‍රධාන කාර්යයන් තුළ ඇතුළත් වූ “ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය වෙළඳාම දියුණු කිරීම සඳහා වන ලෝක වෙළඳ සංගමයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම ” යන කාර්යයට අදාළව ආනයන හා අපනයන පාලන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | <u>පිළිබඳව කාරක සභාවේ දී සාකච්ඡාවට ලක් විය</u> | දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කළේය. "මොන්ට්‍රියල් සම්මුතියට අනුව ඕසෝන් වියනට හානි කරන වායුන් ආනයනය පාලනය කිරීම" යන කාර්යය තුළ දී, ඕසෝන් වියනට හානි කරන වායුන් අඩංගු උපකරණ ආනයනය කිරීමට අදාළව යම් තහනම් සීමා පනවා ඇති බවත්, පරිසරයට බලපෑම් සහිත භාණ්ඩ ආනයනයට අදාළ බලපත්‍ර නිකුත් කිරීමේ දී පරිසර අමාත්‍යාංශයෙන් ඊට අදාළ නිර්දේශ ලබා ගන්නා බවත් ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>අපනයන ක්‍රියාවලියේ දී, රජය අපේක්ෂා කරන විනිමය ආදායම රජයට නොලැබෙන බව නිරීක්ෂණය කළ කාරක සභාව, අපනයන ක්‍රියාවලියේ දී ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය පිළිබඳව කාරක සභාව විමසා සිටියේය.<br><br>ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින්, අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීමක් සිදු වන බවත්, විනිමය පාලන කටයුතු මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදු නොවන බවත් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරී (ග.නි.) ප්‍රකාශ කළේය.<br><br>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සිය වගකීම් ඉටු කිරීමේදී බලපත්‍ර නිකුත් කිරීම තුළින් ආනයන හා අපනයන පාලනය සිදු කරනු ලබන බවත්, භාණ්ඩ ආනයනයට අදාළව රෙගුලාසි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | නිකුත් කරන බවත් මෙහිදී අනාවරණය විය. භාණ්ඩ ආනයනයේ දී, රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍ය හා පරිසර සංරක්ෂණය ආදි කරුණු පිළිබඳව ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වෙමින් ආනයන බලපත්‍ර නිකුත් කිරීම, ආනයන හා අපනයන පාලන පනත අනුව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට පැවරී ඇති මූලිකම කාර්යය බව ග.නි. ප්‍රකාශ කළේය. |
| 02 | <u>ආනයන බලපත්‍ර නිකුත් කිරීම සඳහා, නිර්දේශ ලබා දෙන ආයතන **(Recommending Authorities)** 36ක් පවතින බව කාරක සභාවේ දී අනාවරණය වීම</u> | එම ආයතන විසින් නිකුත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව ආනයන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බවත්, භාණ්ඩ ආනයනය කිරීමෙන් පසු ශ්‍රී ලංකා රේගුව හා නිර්දේශ ලබා දී ඇති ආයතන විසින් ආනයනය කරන ලද භාණ්ඩ බලපත්‍ර කොන්දේසිවලට අනුකූල දැයි පරීක්ෂා කරනු ලබන බවත් ග.නි ප්‍රකාශ කළේය. ප්‍රමිතියෙන් තොරව හා බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් ආනයනය කර ඇති භාණ්ඩ ප්‍රති අපනයනයට (Re-Export) නිර්දේශ කරනු ලබන බවත් මෙහිදී සඳහන් විය.<br><br>**<u>නිර්දේශ</u>**<br>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ආනයන බලපත්‍ර නිකුත් කර ඇති ආයතන සම්බන්ධයෙන් පහත දක්වා ඇති තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ( ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරී (ග.නි.) වෙත නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | • මේ වන විට ආනයන බලපත්‍ර ලබා දී ඇති ආයතන / ආනයනකරුවන් සංඛ්‍යාව කොපමණද? <br> • ආනයන බලපත්‍රයේ ඇතුළත් කොන්දේසි කඩ කර ඇති ආයතන / ආනයනකරුවන් සංඛ්‍යාව කොපමණද? <br> • පසුගිය වසර 02 තුළ ප්‍රමිතියෙන් තොරව ආනයනය කර ඇති භාණ්ඩ වර්ග හා ප්‍රමාණයන් කොපමණද? <br> • පසුගිය වසර 02 තුළ ප්‍රති අපනයනය (Re-Export) කර ඇති භාණ්ඩ වර්ග හා ප්‍රමාණයන් කොපමණද? |
| 03 | **<u>ආනයන, අපනයන බලපත්‍ර නිකුත් කිරීමට අදාළව, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත මෘදුකාංග පද්ධතිය</u>** | මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කරන තෙක්, ආනයන බලපත්‍ර නිකුත් කිරීමට නිර්දේශ ලබා දෙනු ලබන ආයතනවලින් නිර්දේශ ලබා ගැනීම සඳහා පොදු ආකෘති පත්‍රයක් හඳුන්වා දී ඇති බවත් භාණ්ඩ ආනයනයට අදාළ නිර්දේශ විද්‍යුත් තැපැල මාර්ගයෙන් ලබා ගන්නා අතර ඒවායේ දෘඩ පිටපත් ද ගෙන්වා ගන්නා බවත් ග.නි ප්‍රකාශ කළේය. <br><br> එම මෘදුකාංග පද්ධතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණ බවත්, ඇමරිකානු තානාපති කාර්යාලය විසින් ලබා දෙන ආධාර යටතේ, විදේශීය මෘදුකාංග සංවර්ධන සමාගමක් විසින් මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කරනු ලබන බවත් කාරක සභාවේ දී සඳහන් විය. පද්ධතිය සඳහා තොරතුරු තාක්ෂණ පාලක තනතුරක් ද ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කළ බවත් පද්ධතියේ සංවර්ධන කටයුතු 2024 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | මාර්තු මාසයේ දී අවසන් කිරීමට නියමිතව ඇති බවත් ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. <br><br> <u>**නිර්දේශ**</u> <br> ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව තුළ එම මෘදුකාංග පද්ධතිය ස්ථාපනය කිරීමේ දී, මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කරනු ලබන විදේශ මෘදුකාංග ආයතනය සමඟ විධිමත් ගිවිසුමකට එළඹෙන ලෙසත්, එම මෘදුකාංග පද්ධතිය හරහා හුවමාරු වන දත්ත වල ආරක්ෂාව පිළිබඳව හා මෘදුකාංග පද්ධතියේ නඩත්තු කටයුතු පිළිබඳව ද සැලකිලිමත් වන ලෙසත්, එකඟතාවය පරිදි අවුරුදු 02 අවසන් වූ වහාම එම පද්ධතිය දෙපාර්තමේන්තුව වෙත භාර ගෙන නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කළ යුතු බවත් කාරක සභාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) හා ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරී (ග.නි.) වෙත නිර්දේශ කළේය. |
| 04 | <u>**ආනයනකරුවන් විසින්, ආනයන බලපත්‍රවල ඇතුළත් කොන්දේසි කඩ කිරීමට අදාළව දඬුවම් ලබා දීම සඳහා වූ නීති සංශෝධනය කිරීම හා ඒ සම්බන්ධ ක්‍රමවේදයක් සැකසීම**</u> | ආනයන බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් ආනයනය කර ඇති භාණ්ඩ, ප්‍රති අපනයනය (Re-Export) කිරීමට හා කොන්දේසි උල්ලංඝනය කරනු ලබන ආනයනකරුවන්ගේ නම් ප්‍රසිද්ධ කිරීමට (Publish) කටයුතු කර ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් ලබා දුන් නිර්දේශය අනුව, බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරන ආනයනකරුවන් ප්‍රසිද්ධ කිරීමට අමතරව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ඔවුන්ගේ ලියාපදිංචිය තහනම් කළ හැකි දැයි යන්න විමසා නීතිපති උපදෙස් ලබා ගත් බවත් ග.නි ප්‍රකාශ කළේය. ආනයන හා අපනයන පාලන පනතේ පවතින බලතල ප්‍රකාරව එම ආනයනකරුවන් ප්‍රසිද්ධ කිරීම පමණක් කළ හැකි බව නීතිපතිවරයා විසින් දැනුම් දී ඇති බවත්, එම සියලු කරුණු ආවරණය කරමින් ආනයන හා අපනයන පාලන පනත සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක (Legal Draftsman) වෙත යොමු කිරීමට නියමිත බවත් ග.නි ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>ආනයන බලපත්‍රවල ඇතුළත් කොන්දේසි කඩ කරනු ලබන, ආනයනකරුවන් ප්‍රසිද්ධ කිරීමට (Publish) අමතරව, ඔවුන්ට දඬුවම් ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බව කාරක සභාවේ දී යෝජනා විය. එලෙස දඬුවම් ලබාදීමට අදාළ නීති සංශෝධනය කිරීම හා ඒ සම්බන්ධ ක්‍රමවේදයක් සකස් කිරීම සම්බන්ධව දින වකවානු ඇතුළත් වාර්තාවක් සතියක් තුළ (2024.01.31 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**ආනයන හා අපනයන පාලක ජනරාල්ගේ අංක IECD/07/01/40 දරන 2024.02.06 දිනැති ලිපිය මගින්, පහත කරුණු ඇතුළත් පිළිතුරක් ඉදිරිපත් කර ඇත.**<br><br>- **අංක 1953/28 දරණ 2016.02.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ආනයන පාලන බලපත්‍රවල ඇතුළත් කොන්දේසි කඩකරන** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ආනයනකරුවන්ට අතිරේක ගාස්තු අයකිරීමට රෙගුලාසි පනවා ඇති බව;<br>- ආනයන හා අපනයන පාලන පනතේ 11E වගන්තිය අනුව අදාළ භාණ්ඩවලට විශේෂිත ප්‍රමිතීන්ට එකඟ නොවන භාණ්ඩ ආනයනය සිදු කරන ආනයනකරුවන් ප්‍රසිද්ධ කිරීමට ක්‍රමවේදයක් සැකසීම සඳහාවන රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීමේ ගැසට් නිවේදනයේ කෙටුම්පත, සංශෝධන සහිතව නීති කෙටුම්පත් සම්පාදක වෙත 2023.12.22 දින ඉදිරිපත් කර ඇත;<br>- 2024.01.16 දින එම සංශෝධන ඇතුළත් ගැසට්පත්‍ර කෙටුම්පත නැවත පරීක්ෂාව සඳහා 2024.01.16 දින දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත;<br>- එම කෙටුම්පත අවශ්‍ය සංශෝධන ඇත්නම් එම සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙත දන්වා යැවීමට කටයුතු කරන බවත් ඉන්පසු නීතිපතිවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදන බව දන්වා ඇත.<br>ඒ සඳහා සකස් කළ කරන ලද කාල රාමුව<br>(i) නීති කෙටුම්පත් සම්පාදක වෙතින් ලබා ගැනීම - 2024.02.15<br>(ii) ගරු නීතිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම - 2024.03.15 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **(iii) ගැසට්පත්‍රය ප්‍රසිද්ධියට පත්කිරීම- 2024.04.01**<br><br>**(iv) ගැසට්පත්‍රය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ ගැසට්පත්‍රය පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම - 2024.05.30**<br><br>**මීට අමතරව, තවදුරටත් නීති සංශෝධනය සඳහා ආනයන හ අපනයන පාලන පනත සංශෝධනය කිරීම අවශ්‍ය බැවින්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාත්මක වන බවද වාර්තාකර ඇත.**<br><br><u>නිර්දේශ</u><br>අනෙකුත් රටවල ආනයනකරුවන් විසින් ආනයන බලපත්‍ර ලබාගෙන, ප්‍රමිතියෙන් තොර භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන්, ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව එම රටවල් විසින් අනුගමනය කරනු ලබන නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බලා මාස 01ක් ඇතුළත (2024.02.23 දිනට පෙර) වාර්තා කරන ලෙසට වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය (Ministry of Trade , Commerce and Food Security ) වෙත කඩිනමින් ලිපියක් යොමු කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>එම වාර්තාව ලද පසු, විගණකාධිපතිට ද පිටපතක් සහිතව එහි පිටපතක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **ආනයන හා අපනයන පාලක ජනරාල්ගේ අංක IECD/06/07/05/2024 දරන 2024.02.07 දිනැති ලිපිය මඟින්, අදාළ තොරතුරු වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා ඇත.** |
| 05 | <u>**ආනයන හා අපනයන පාලනයට යටත් වන හා යටත් විය යුතු භාණ්ඩ හා එම භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංක ( HS Codes )**</u> | ආනයන පාලනයට යටත්වන සියලු භාණ්ඩ, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන බව ග.නි ප්‍රකාශ කළේය. ආනයන පාලනයට යටත් වන භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ (HS Codes) 1076 ක් ඇති බවත්, HS Codes 504ක් බලපත්‍ර අත් හිටවූ කාණ්ඩයට (Suspended License Category) අයිති බවත්, HS Codes 304ක් තාවකාලික තහනමකට ලක්ව ඇති බවත්, තහනම් කළ HS Codes 51ක් ඇති බවත් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. <br><br> තවද, විදේශීය රටවල භාවිත කර ඉවත් කළ පොල් තෙල් ආනයනය කර පිරිපහදු කර විකිණීම සිදු කරන බවත් මෙම පොල් තෙල් පිළිකාකාරක බවත් මෙහිදී අනාවරණය විය. එසේම ළදරු ක්‍රීඩා භාණ්ඩ වැනි ඇතැම් භාණ්ඩ ආනයනය සඳහා HS Codes හඳුන්වා දී නොමැති බවද සඳහන් විය. තවද, ආනයන බලපත්‍ර යටතේ ගෙන්වනු ලබන භාණ්ඩ පිළිබඳව ද නිසි අධීක්ෂණයක් කරන ලෙස කාරක සභාව අවධාරණය කළේය. <br><br> <u>**නිර්දේශ**</u> <br> ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලනට යටත් වන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංක (HS Codes) යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ අධීක්ෂණය (Supervision) සඳහා විධිමත් වැඩපිළිවෙලක් කඩිනමින් සකස් කරන ලෙසත්, ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණය වෙමින් ආනයන පාලනයට යටත් විය යුතු අනෙකුත් භාණ්ඩ සම්බන්ධයෙන් ද සොයා බලා සුදුසු භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංක යටතේ ආනයන පාලනයකට යටත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය. |
| 06 | **විගණකාධිපතිවරයාගේ විගණන සටහන 1. (5.1)**<br>(i) නිර්දේශිත කාලය ඉක්ම වූ වාහන කොටස් කර ගෙන්වනු ලබන වාහන සහ මත්පැන් නිෂ්පාදනය සඳහා වන ස්ප්‍රීතු ආදිය සඳහා බලපත්‍ර ලබා දීමේ ප්‍රතිපත්තිය | ඖෂධ සහ වෙනත් නිෂ්පාදන අවශ්‍යතා සඳහා ස්ප්‍රීතු ආනයනය කිරීමේ දී, සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන ස්ප්‍රීතු ප්‍රමාණයන්ට (Quantity), අනුකූලව ආනයන බලපත්‍රය නිකුත් කරනු ලබන බව ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. මේ වන විට මත්පැන් නිෂ්පාදනය සඳහා වන ස්ප්‍රීතු ආනයනය නතර කර ඇති බවත්, එලෙස මත්පැන් නිෂ්පාදනය සඳහා ස්ප්‍රීතු ආනයනය කිරීමට අවශ්‍ය නම් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ විශේෂ අනුමැතිය ලබා ගත යුතු බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ඖෂධ නිෂ්පාදනය සඳහා ස්ප්‍රීතු ආනයනය සිදු කරන විට, ඒ සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිර්දේශවලට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හෝ අදාළ අංශවලින් ද අවශ්‍ය ප්‍රමාණය දන්වා නිර්දේශ ලබා ගත යුතු බවත්, 2020 වර්ෂයේ මත්පැන් නිෂ්පාදනය සඳහා බලපත්‍ර ලබා දීම නතර කළ දින සිට මේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | දක්වා ස්ප්‍රීතු ආනයනය සඳහා ආනයන බලපත්‍ර 06ක් පමණ නිකුත් කර ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ස්ප්‍රීතු ආනයනය සඳහා බලපත්‍ර ලබා දීමේ දී ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මෙතෙක් සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br><u>නිර්දේශ</u><br>සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන මත්පැන් / ස්ප්‍රීතු ප්‍රමාණය (Quantity) අනුව ආනයන බලපත්‍ර ලබා දීම සිදු වන බැවින් , එලෙස නිර්දේශ කරනු ලබන මත්පැන් / ස්ප්‍රීතු ප්‍රමාණය සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වන මෙන් කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිර්දේශ කරනු ලබන මත්පැන්/ස්ප්‍රීතු ප්‍රමාණය සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගෙන එම ප්‍රතිපත්තිය ඉදිරිපත් කරන ලෙස දන්වමින්, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් අංක IECD/03/01/03 දරන 2024.02.06 දිනැති ලිපිය මඟින් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වා යවා ඇත.**<br><br>**මීට අදාළව, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් අංක IECD/03/01/03 දරන 2024.04.01 දිනැති සිහි කැඳවීමේ** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **ලිපියක් ද සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත යවා ඇත.** |
| 07 | (ii) වාහන ආනයනය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. | වාහන ආනයනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පත් කළ කමිටුව මඟින් වාර්තාව සකස් කිරීම අවසන් අදියරේ පවතින බව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.<br><br>ආනයනය කරනු ලබන වාහන සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ දී, එම ප්‍රතිපත්තිය තුළ පැරණි වාහන ආනයනය කිරීමට අදාළ ප්‍රතිපත්තියක් පැවතිය යුතු බවත්, පැරණි වාහන ආනයනය කිරීමේ දී වැයවන ඉන්ධන ප්‍රමාණය හා වාහන අමතර කොටස් සඳහා වැය වන මුදල් ප්‍රමාණය කොපමණ ද යන්න පිළිබඳව මෙන්ම අලුත් වාහන ආනයනය කිරීමට අදාළ ප්‍රතිපත්තියක් ද පැවතිය යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය. මෙහිදී ආර්ථිකය, පරිසරයට සිදු වන බලපෑම, රිය අනතුරුවලින් ආරක්ෂා වීම ආදි කරුණු පිළිබඳව සලකා එම ජාතික ප්‍රතිපත්තිය සකස් කළ යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය.<br><br>වාහන ආනයනය කිරීමේ දී එම වාහන ආනයනයට අදාළ ප්‍රමිතීන් / රෙගුලාසි ඇතුළත් ගැසට් පත්‍රයක් නිකුත් කර ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. භාවිත කළ වාහන ආනයනයේ දී, බලපත්‍ර නිකුත් කිරීම පාලනයකට යටත් කර ඇති බවත්, නව වාහන ආනයනය බලපත්‍ර පාලනට යටත් කර නොමැති වුවද, එම වාහන ආනයනය |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | වායු විමෝචන ප්‍රමිතීන්ට (Emission Standard) සහ ආරක්ෂක ප්‍රමිතීන්ට (Safety Standard) අනුගත විය යුතු බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>වාහන ආනයනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පත් කළ කමිටුව විසින් සකස් කරනු ලබන වාර්තාව ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. /ග.නි. වෙත නිර්දේශ කළේය. |
| 08 | **<u>විගණකාධිපතිවරයාගේ විගණන සටහන 1. (5.4)</u>**<br><br>ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන පසුව විවිධ පාර්ශ්ව වෙත පැවරීම | ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන සඳහා ආනයන බලපත්‍ර නිකුත් කළ පසු නියමිත බදු ගෙවීමෙන් තොරව එම වාහනයේ අයිතිය වෙනත් පාර්ශ්වයකට පැවරිය නොහැකි බව ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව වාහනවල අයිතිය මාරු කර තිබේද යන්න හා මෙහිදී යම් අක්‍රමිකතාවයක් සිදුව තිබේද යන්න මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් යුක්තව පරීක්ෂා කරන ලෙසත්, එලෙස අයිතිය මාරු කළ නොහැකි බවට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දන්වන ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි. /ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන වෙනත් පාර්ශ්වයක්** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | වෙත පැවරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගෙන් ඉල්ලීමක් කළොත් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් පූර්ව විමසීමකින් තොරව අදාළ පැවරීම් සඳහා ලියාපදිංචිය සිදු නොකරන ලෙස දන්වමින්, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් අංක IECD/02/2023/004 දරන 2024.02.07 දිනැති ලිපිය මඟින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වා ඇත.<br><br>2014 වර්ෂයේ සිට වර්තමානය දක්වා ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනය සඳහා ආනයන බලපත්‍ර නිකුත් කර ඇති වාහන වල වර්තමාන තොරතුරු ඉල්ලා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත යොමු කළ අංක IECD/02/2023/004 දරන 2024.04.09 දිනැති ලිපියේ පිටපතක් ඉදිරිපත් කර ඇත. |
| 09 | <u>විගණකාධිපතිවරයාගේ විගණන සටහන 1. (6.1)</u><br>1978 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන සහ අපනයන පාලන පනතේ 11 ඊ වගන්තිය ප්‍රකාරව ප්‍රමිතියට පටහැනිව ආනයනය සිදු කරන ආනයනකරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සම්මත කිරීමට මාස 03ක් තුළ කටයුතු කර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2022.06.08 දින පැවති රජයේ | ප්‍රමිතියට පටහැනි ආනයනයන් අඛණ්ඩව සිදුවන බැවින් එවැනි ආනයනකරුවන් අසාධුලේඛනගත කර ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කිරීමට ආනයන හා අපනයන පාලන පනතේ විධි විධාන පැවතිය ද, මෙතෙක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ අවසාන තීන්දුවක් ගෙන නොමැති බව විගණනය විසින් කාරක සභාවේ දී අනාවරණය කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබීම. | |
| 10 | **<u>විගණකාධිපතිවරයාගේ විගණන සටහන 1. (6.2)</u>**<br>පාවිච්චි කළ වාහන සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම. | පාවිච්චි කළ වාහන ආනයනය තහනම් කර තිබූ අවස්ථාවේ දී, පාවිච්චි කළ වාහන 33ක් ආනයනය කිරීමෙන් බදු වංචාවක් සිදු වී ඇති බව කාරක සභාවේ දී අනාවරණය විය. පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නිර්දේශය අනුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ආරම්භ කර තිබූ පරීක්ෂණයේ ප්‍රගතිය විමසා තිබූ බවත්, මෙතෙක් එම පරීක්ෂණ කටයුතු අවසන්ව නොමැති බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය. |
| 11 | **<u>විගණකාධිපතිවරයාගේ විගණන සටහන 1. (6.4)</u>**<br>ඖෂධ ආනයනය සඳහා ලබා දී තිබූ ලියාපදිංචි සහතිකය භාවිත කර වලංගු කාලය ඉක්මවූ ඖෂධ ආනයනය කිරීම | ඖෂධ ආනයනය කරන අවස්ථාවේ දී, අදාළ ඖෂධ රට තුළට ගෙන එන විට එම ඖෂධවල මුළු ආයු කාලයෙන් 75% ක් වත් ඉදිරියට පැවතිය යුතු බවට ඖෂධ ආනයන බලපත්‍රය තුළ ඇතුළත්ව ඇති කොන්දේසිය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) සහ ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ සියලු ආයතනවල එකඟත්වයෙන් එලෙස ආනයනය කරනු ලබන ඖෂධවල ආයු කාලය 75% ක් වත් ඉදිරියට පැවතිය යුතු බවට තීරණය කර ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | රේගුවෙන් ඖෂධ නිශ්කාෂනය කිරීමට අවසරය ලබා දෙන්නේ ආනයනය කරන අවස්ථාවේ දී ඖෂධවල මුළු ආයු කාලයෙන් 75% ක් හෝ ඉතිරිව තිබේ නම් බව සඳහන් විය. ආනයනය කරන ඖෂධවල අයු කාලය 74%-65% ත් අතර නම් එම ඖෂධවල ගුණත්වය හා එම ඖෂධ වෙළෙඳපලට නිකුත් කිරීමේ හැකියාව පිළිබඳ ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) විසින් සහතික කළ යුතු බවත්, අදාළ ආනයනකරුට දඩයක් පනවා එවැනි ඖෂධ රේගුවෙන් නිදහස් කිරීමට අවසර ලබා දෙන බවත් ග.නි. ප්‍රකාශ කළේය. තවද, 65%ට වඩා අඩු ආයු කාලයක් සහිත ඖෂධ රේගුවෙන් නිදහස් කිරීමට නම් ආනයනකරු විසින් එම ඖෂධ පිළිබඳ විශේෂ සාධාරණීකරණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවත් ග.නි වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>කෙටි ආයු කාලයක් සහිත ඖෂධ ආනයනය කර පළාත් රෝහල් වෙත බෙදා හැරීමේ දී සැලකිය යුතු කාලයක් ගත වන බැවින් එම ඖෂධ කල් ඉකුත් වීමේ ප්‍රවණතාව (Expire) ඉහළ බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර, ගුණාත්මක ඖෂධ ආනයනය කර මහජනතාව වෙත ලබා දීම වඩාත් වැදගත් බව කාරක සභාව අවධාරණය කළේය.<br><br>තවද, 2018-2020 කාලය තුළ, 75% ට අඩු ආයු කාලයක් සහිත ඖෂධ ආනයනය කර ඇති අවස්ථා ඉහළ බව නිරීක්ෂණය කළ කාරක සභාව, ඖෂධ ආනයනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් පැවතිය යුතු බව ද අවධාරණය කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **<u>නිර්දේශ</u>**<br>සෞඛ්‍ය අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) ඇතුළු අදාළ සියලු ආයතන සමඟ සාකච්ඡා කර, යම් ඖෂධයක් ආනයනය කරන අවස්ථාවේදී අදාළ ඖෂධයේ මුළු ආයු කාලයෙන් අවම වශයෙන් 75% ක් ඉදිරියට පවත්වා ගැනීම සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය. |
| 12 | **<u>විගණකාධිපතිවරයාගේ විගණන සටහන 2. (2.1)</u>** | සීමා කළ යුතු හා තහනම් කළ යුතු භාණ්ඩ ආනයනයන් වළැක්වීම සඳහා වූ විධිවිධාන ඇතුළත් අංක 2044/40 හා 2017 නොවැම්බර් 09 දිනැති ගැසට් පත්‍රය සහ පැරණි වාහන රට තුළට ඒම සීමා කිරීම සඳහා වූ 1971/10 හා 2016 ජූනි 14 දිනැති ගැසට් පත්‍රය මගින් නීති විරෝධී ආනයනයන් රට තුළට ඇතුළු වීම වළක්වා තිබුණ ද, ශ්‍රී ලංකා රේගුවේ සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධති අතර අන්තර් සම්බන්ධතාවල දුර්වලතාවය හේතුවෙන් ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පසු විපරම් ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව තුළ නොමැති බව විගණකාධිපතිවරයා කාරක සභාව හමුවේ පෙන්වා දුන්නේය. |
| 13 | **<u>විගණකාධිපතිවරයාගේ විගණන සටහන 2. (2.2- ii)</u>**<br>සීනි ආනයනය සඳහා වන බලපත්‍ර ක්‍රමය 2020.10.30 දින සිට ක්‍රියාත්මක වුවද බලපත්‍ර නිකුත් කිරීම 2020.11.18 දින | සීනි කිලෝග්‍රෑම් 01 ක් සඳහා පනවා තිබූ විශේෂ භාණ්ඩ බදු අඩු කළ අවස්ථාවේ දී සීනි ආනයනය බලපත්‍ර පාලනයට යටත් කිරීම ප්‍රමාද වූ බවත්, බදු අඩු කරනු ලැබූ මුල් අවස්ථාවේ දී ආනයන බලපත්‍ර නිකුත් කර නොමැති බවත්, එම අවස්ථාවේ දී |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | දක්වා ප්‍රමාද වී තිබීමෙන් එම කාල පරිච්ඡේදය තුළ බලපත්‍ර නොමැතිව සීනි ආනයනය කිරීමට ආනයනකරුවන් 18ක් කටයුතු කර තිබීම. 2016.02.11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව මි.ර.ගැ. වටිනාකමින් 5 %ක අතිරේක ගාස්තුවක් අය කළ යුතු වුවද බලපත්‍ර නොමැතිව ආනයනය කර තිබූ සීනි තොගවල මි.ර.ගැ.වටිනාකමින් 2% ක් පමණක් අය කිරීම | ආනයන බලපත්‍ර නිකුත් කිරීමට නිර්ණායකයක් නොතිබූ බවත් ග.නි. ප්‍රකාශ කළේය. එම කාලය තුළ ආනයනකරුවන් විසින් බලපත්‍ර රහිතව සීනි ආනයනය කර ඇති බවත්, එලෙස බලපත්‍ර රහිතව ආනයනය කිරීමේ දී ඒ මත දඩ මුදලක් පනවා භාණ්ඩ නිදහස් කිරීමට අනුමැතිය ලබා දීමටත්, සාධාරණ කරුණු මත දඩ මුදලින් යම් ප්‍රමාණයක් අඩු කිරීමටත් පාලක ජනරාල්වරයාට බලතල ඇති බවත් ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. ආනයනකරුවන් විසින් ආනයන බලපත්‍ර ඉල්ලුම් කළ ද බලපත්‍ර ලබා දී නොතිබුණ බවත් ඒ අනුව සීනි ආනයනය කළ බව ආනයනකරුවන් විසින් දැනුම් දී ඇති බවත්, උක්ත විගණන විමසුමේ සඳහන් 5% ලෙස අයකළ දඩ මුදලින් යම් ප්‍රමාණයක් අඩු කර, දඩ මුදල පනවා ඇති බවද ග.නි. ප්‍රකාශ කළේය. |
| 14 | <u>**විගණකාධිපතිවරයාගේ විගණන සටහන 2. (2.2 - iii)**</u><br>සීනි කිලෝග්‍රෑම් 01ක් සඳහා පනවා තිබූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු රු.50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට නොලැබීමේ සිදුවීමට අදාළ විගණන විමසුම. | සීනි සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන්, බදු අඩු කිරීමෙන් පසු විශාල වශයෙන් සීනි ආනයනය පාලනය කිරීම අපේක්ෂා කළ ද බලපත්‍ර නිකුත් කිරීමට පෙර පැවති සාමාන්‍ය මාසික ආනයනික සීනි ප්‍රමාණය, බලපත්‍ර හඳුන්වා දීමෙන් පසු ඉහළ ගොස් ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදි. |
| 15 | <u>**විගණකාධිපතිවරයාගේ විගණන සටහන 2. (2.4)**</u><br>සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ මත්සායින් ගබඩා | අදාළ මාළු බහාළුම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ළඟා වූ පසු, එම මාළු බහාළුම් පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා රේගුව විසින් කමිටුවක් පත් කර ඇති බවත්, එම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | කළ බහාළුම් රැගත් නෞකාවක් කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේදී කාර්මික දෝෂයකට ලක් වී විදුලි සැපයුම නතර වීම හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ළඟා වී තිබුණ අතර විදේශීය නෞකාවේ දේශීය නියෝජිතයා මඟින් සොයා ගත් දේශීය පෞද්ගලික ආයතනයක් වෙත කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මෙම මාළු බහාළුම් 2022.03.09 දින විකුණා තිබීමට අදාළ විගණන විමසුම | කමිටුව විසින් මෙම ඉවතලන මාළු කොටස් පරිභෝජනයට නොව කාබනික පොහොර සෑදීම සඳහා අවශ්‍ය මාළු කොටස් (Fish Waste ) ලෙස වාර්තා කර ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුව, ඉවතලන මාළු කොටස් ආනයනය සඳහා අදාළ බලපත්‍රය නිකුත් කර ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. එම ඉවතලන මාළු බහාළුම් නිශ්කාෂණය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිර්දේශ ලබා දී ඇති බවත්, එම මාළු බහාළුම් ශ්‍රී ලංකා රේගුවේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණය යටතේ නිශ්කාෂණය කර ඇති බවත් කාරක සභාවේ දී අනාවරණය වූ අතර මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණය යටතේ කාබනික පොහොර සකස් කරන බවද මෙහිදී සඳහන් විය.<br><br>එම ඉවතලන මාළු භාවිත කර කාබනික පොහොර සෑදීමේ ක්‍රියාවලිය පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියෙන් පසුව විමසීම් කළ බවත්, ඉවතලන මාළු කොටස් ඇතුළත් බහාළුම් (කන්ටේනර්) 98 න් 43 ක් පමණ කාබනික පොහොර සෑදීම සඳහා භාවිත කර ඇති බවත්, ඉතිරි බහාළුම් 55න් බහාළුම් 40ක් ප්‍රති අපනයනය (Re-export) කර ඇති බවත් එහි ඉතිරි බහාළුම් 15 ශ්‍රී ලංකා රේගුව සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරීක්ෂා කර එම ආයතනවල අධීක්ෂණය යටතේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට යොදා ගැනීමට කටයුතු කර ඇති බවට ලිඛිතව වාර්තා කර ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>එම ඉවතලන මාළු බහාළුම් මිලදී ගත් දේශීය පෞද්ගලික ආයතනය මඟින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සැමන් නිෂ්පාදනය කරනු ලබන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන බවත්, එම මාළු බහාළුම් රට තුළට ගැනීමෙන් පරිසරයට හානි සිදු වූ බවත්, ඉවතලන මාළු බහාළුම් අතරින් ඇතැම් බහාළුම් ප්‍රති අපනයනය කිරීම හේතුවෙන් එම මාළු බහාළුම් රට තුළට ගැනීමේ තීරණය වැරදි සහිත බව තහවුරු වන බවද විගණනය විසින් කරුණු අනාවරණය කරන ලදි. නැව තුළ මාළු බහාළුම් 98ක් නොව, 102 ක් පැවති බවත් ඉන් බහාළුම් 04ක් පිළිබඳ තොරතුරු නොමැති බවද විගණනය විසින් තව දුරටත් අනාවරණය කරන ලදි. ආනයනකරු විසින් අදාළ ආනයන බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුව විසින් බලපත්‍රය සඳහා ඉල්ලීම සිදු කර තිබීම ගැටළු සහගත බවද, අදාළ ආනයනකරු විසින් ව්‍යාජ ඉන්වොයිසියක් මේ සඳහා ඉදිරිපත් කර ඇති බවට කරුණු අනාවරණය වී ඇති බවද විගණනය විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදි.<br><br>ශ්‍රී ලංකා රේගුව විසින් මෙම ඉවතලන මාළු බහාළුම් රට තුළට ගැනීම සඳහා නිර්දේශය ඉදිරිපත් කර තිබූ බවත්, Eco N Rich Organic Fertilizer ආයතනය විසින් ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති අයදුම්පත මගින් ආනයන බලපත්‍රය ලබාගැනීම සඳහා ඉල්ලීම් කර තිබූ බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>I. එම මාළු බහාලුම්, ඉවතලන මාළු කොටස් (Fish Waste) ලෙස |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | හඳුනාගෙන ඒ සඳහා අදාළ භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංකය (HS Code) ලබා දීමට අදාළව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට වාර්තාව ලබා දීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් පත් කළ කමිටුවෙහි නිලධාරීන් පිළිබඳ තොරතුරු; සහ <br> II. මධ්‍යම පරිසර අධිකාරිය විසින් මීට අදාළව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් වාර්තාව සකස් කළ නිලධාරීන් පිළිබඳ තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස, <br><br> කාරක සභාව විසින් ප්‍ර.ග.නි. /ග.නි. වෙත නිර්දේශ කළේය. <br><br> **අදාළ වාර්තාව සැකසීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් පත්කළ කමිටුවෙහි නිලධාරීන් පිළිබඳ තොරතුරු සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් වාර්තාව සකස් කළ නිලධාරීන් පිළිබඳ තොරතුරු මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ලේකම්ගේ MF06/10/ Import & Export/COPA/2024 හා 2024.03.07 දිනැති ලිපිය මඟින් ඉදිරිපත්කර ඇත.** <br><br> එසේම, <br><br> I. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගත්තේ යැයි පවසනු ලබන අප-මාළු (Fish Waste) අඩංගු බහාළුම් 15 පිළිබඳව සොයා බලා අපහරණය සඳහා නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්; |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ලේකම්ගේ අංක MF 06/ 10/ Import & Export/ COPA/ 2024 දරන 2024.03.18 දිනැති ලිපිය මඟින්, නරක් වූ මසුන් අඩංගු කන්ටේනර් 15 කාබනික පොහොර නිෂ්පාදනය සඳහා පැලියගොඩ පිහිටි M/C Agri Star Compost Pvt Ltd වෙත ලබා දීමට M/S Eco Rich Organic Fertilizer සමාගමේ එකඟතාවය මත මුදා හැරීමට ශ්‍රී ලංකා රේගුව කටයුතු කර ඇති බව රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක CDD/ DES/ MISC/ 2023/ 65 හා 2024.02.26 දිනැති ලිපියෙන් දැනුම් දුන් බව වාර්තාකර ඇත. එසේ වුවද සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබෙන තෙක් එම බහාලුම් 15 මුදාහැරීමේ කටයුතු ආරම්භකර නොමැති බවද එම ලිපියෙන් දැනුම් දුන් බවද වාර්තා කර ඇත.**<br><br>II. මෙම විගණන විමසුමට අදාළව ඉවතලන මාළු කොටස් යොදා ගෙන පොහොර නිෂ්පාදනය කිරීම සිදු කරනු ලබන අදාළ කර්මාන්තශාලා විසින් මේ වන විට කොපමණ ප්‍රමාණයක පොහොර නිෂ්පාදනය කර තිබේද යන්න පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලෙසත්; සහ<br><br>III. එම ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පත් කරන කමිටුවට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නිලධාරියකු ද ඇතුළත් කරන ලෙසත්; |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | කාරක සභාව විසින් ප්‍ර.ග.නි. /ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**අදාළ ක්ෂේත්‍ර පරීක්ෂණ කමිටුව පත් කර ඇති අතර මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ලේකම්ගේ අංක MF06/10/Import & Export/ COPA/2024 දරන 2024.06.11 දිනැති ලිපිය මඟින් එම කමිටුව විසින් 2024.03.25, 2024.04.29 හා 2024.04.30 යන දිනයන්හිදී ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදුකර ඇති බවත් ඒ අනුව සකස් කළ අවසන් වාර්තාව ද ඉදිරිපත් කර ඇත.**<br><br>මෙම සිදුවීමට සම්බන්ධ රාජ්‍ය ආයතන වන ශ්‍රී ලංකා රේගුව, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා පොලිසිය මීළඟ කාරක සභා රැස්වීම සඳහා 2024.03.05 දින කැඳවන බවත්, ශ්‍රී ලංකා රේගුව සහ මධ්‍යම පරිසර අධිකාරියේ මෙම සිදුවීමට සම්බන්ධ අදාළ කමිටු නිලධාරීන්ද එදින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවන බවත් එහිදී කාරක සභාව තීරණය කළේය. |
| 16 | **<u>විගණකාධිපතිවරයාගේ විගණන සටහන 2. (2.5)</u>**<br>විදේශ විනිමය අර්බුදයක් රට තුළ පවතින අවස්ථාවක සහ එතනෝල් ආනයනය සීමා කර තිබියදී ඩොලර් 1,960,000ක වටිනාකමකට ලංකා සීනි සමාගමට එතනෝල් නිෂ්පාදනයට අවශ්‍ය මොලැසස් ආනයනය සඳහා ආනයන බලපත්‍රයක් 2022.01.21 දින | උක්ත විගණන විමසුමේ සඳහන් අවස්ථාවේ දී සුරාබදු දෙපාර්තමේන්තුව විසින් එතනෝල් නිෂ්පාදනයට අවශ්‍ය මොලැසස් ආනයනයට නිර්දේශ ලබා දුන් බවත්, එම නිර්දේශය මත පදනම්ව ආනයන බලපත්‍ර නිකුත් කළද මේ වන විට එම බලපත්‍රය අවලංගු කර ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>එතනෝල් නිෂ්පාදනයට අවශ්‍ය මොලැසස් ආනයන බලපත්‍රය අහෝසි කර ඇති බව |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබීම | තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවෙන්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට සහ විගණකාධිපතිවරයාට ද පිටපතක් සහිතව වාර්තාවක් ගෙන්වා ගන්නා ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>ආනයන බලපත්‍ර නිකුත් කිරීමට අදාළව නිර්දේශ ඉදිරිපත් කරනු ලබන ආයතන 36 සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුක්තව හා පසු විපරම් ක්‍රියාවලියක් සහිතව කටයුතු කරන ලෙස කාරක සභාව ග.නි. වෙත උපදෙස් දුන්නේය.<br><br>**සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම වෙත මොලැසස් මෙට්‍රික් ටොන් 5000ක් ආනයනය කිරීමට නිකුත් කළ 2022.01.21 දිනැති 1M-3-540-2022-000199 අංක දරන ආනයන බලපත්‍රය භාවිතා කොට ආනයනයක් 2022.01.01 දින සිට මේ දක්වා සිදු කර නොමැති බව, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක IECD/03/01/03 දරන 2024.02.15 දිනැති ලිපිය මඟින් දන්වා ඇති බව මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ලේකම්ගේ අංක MF06/10/Import & Export/COPA/2024 දරන 2024.03.18 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇත.** |
| 17 | <u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට අදාළ වෙනත් කටයුතු</u> | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ 2024.01.24 දින පැවැත්වීමට නියමිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම සඳහා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව, ජාතික ආර්ථික හා භෞතික සැළසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සහ ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යන කාරක සභාවල සභාපතිවරුන්ට ද ආරාධනා කළ යුතු බවට කාරක සභාවේ දී තීරණය විය. |

**මුදල් අමාත්‍යාංශය**

***(මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට අදාළ 2021 සහ 2022, මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා, එම අමාත්‍යාංශයේ වත්මන් කාර්ය සාධනය සහ ශ්‍රී ලංකා රේගුවේ 2023 නොවැම්බර් 17 දින පැවති රැස්වීමේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 නොවැම්බර් 15 දින පැවති රැස්වීමේ හා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2023 ඔක්තෝබර් 05 දින පැවති රැස්වීමේ වර්තමාන තත්වය)***

**විමර්ශනය කරන ලද දිනය - 2024 ජනවාරි 24**

**කැඳවන ලද ආයතන-**

- ❖ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
- ❖ බදු අභියාචනා කොමිෂන් සභාව
- ❖ ශ්‍රී ලංකා රේගුව
- ❖ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- ❖ සුරාබදු දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| 01 | **<u>රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ මැදිහත් වීම</u>** | රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට සැබෑ අවශ්‍යතාවයක් තිබේ ද යන්න කාරක සභාව විසින් විමසන ලදී.<br><br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු ආදායම් නිසි ලෙස එකතු කර ගැනීමට නොහැකි වීමට විගණන සමාගම්වල ක්‍රියාකාරිත්වය හේතුවන බව නිරීක්ෂණය කළ කාරක සභාව විගණන සමාගම් නිසි ලෙස නියාමනය කළ යුතු අතර ආදායම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | වර්ධනය කර ගැනීමේ අරමුණු වෙනුවෙන් දේශීය ආදායම් පනත සංශෝධනය කළ යුතු බව පෙන්වා දුන්නේය. ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා 2024 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය නිශ්චිත ආර්ථික සැලැස්මක් ඇතිව කටයුතු කළ යුතු බව පෙන්වා දුන් කාරක සභාව අමාත්‍යාංශයේ දුර්වලතා නිරීක්ෂණය වන බව ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන තුන සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව, ජාතික ආර්ථික හා භෞතික සැළසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සහ ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පසුගිය අවුරුද්දක කාලය (2023.01.01-2024.1.26) තුළ ලබා දුන් නියෝග/නිර්දේශ/යෝජනා ඇතුළත් සාකච්ඡා සටහන් අධ්‍යයනය කර ඉහත කී රාජ්‍ය ආයතන තුනෙහි ආදායම වර්ධනය කර ගැනීමට අවශ්‍ය යෝජනාවලියක් සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් 2024.02.26 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙසත්, සහ මේ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය වඩාත් කාර්යක්ෂමව සිදු කරන ලෙසත් කාරක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත නිර්දේශ කරන ලදි.<br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF6/ 4/ COPA/ General/ 2023 දරන 2024.03.05 දිනැති ලිපිය මඟින් සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළව ආදායම් වර්ධනය කර ගැනීම සඳහා යෝනාවලියක් සහ ක්‍රියාකාරී සැලැස්මක් ද, ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව ආදායම වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය යෝජනාවලියක් ද ඉදිරිපත් කර ඇත.** |
| 02 | <u>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා අදාළ ආයතන අතර සම්බන්ධීකරණයේ දුර්වලතා**</u> | කැසිනෝ නියාමකයකු පත් කිරීමේ අවශ්‍යතාවය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් පෙන්වා දී තිබූ අතර එය 2023.09.30 දින වන විට අවසන් කරන බවට මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ප්‍රකාශ කළ ද මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබීම පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විසින් කාරක සභාවේ අවධානය යොමු කරන ලදී. ඒ සඳහා හේතු වී ඇත්තේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අතර නිසි සම්බන්ධීකරණයක් නොමැති වීම බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.<br><br>එසේම, විදේශීය සමාගම් විසින් මෘදුකාංග පද්ධති ශ්‍රී ලංකාවේ අලෙවි කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | අවස්ථාවේ දී එම සමාගම් සඳහා ද එකතු කළ අගය මත බදු (VAT) අය කර ගැනීමට අපොහොසත් වී ඇත්තේ මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතර ඇති සම්බන්ධීකරණයේ දුර්වලතාවයන් හේතුවෙන් බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදි. |
| 03 | **<u>ශ්‍රී ලංකා රේගු සංශෝධන පනත් කෙටුම්පත</u>** | ශ්‍රී ලංකා රේගු ආඥා පනත සංශෝධනය කරමින් පවතින බවත්, අදාළ සංශෝධන අනුව ත්‍යාග අරමුදල වෙත වෙන් කරන මුදල් ප්‍රතිශතවල ද සංශෝධනයක් සිදු කරන බවත් 2024 ජුනි මස එය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>රේගු ආඥා පනතට ගෙන එනු ලබන නව සංශෝධන අනුව රේගු දණ්ඩන හෝ වෙනත් එවැනි අයකිරීම් වලින් ශ්‍රී ලංකා රේගුවේ ත්‍යාග හා සුබසාධක අරමුදල වෙත ප්‍රතිශතාත්මක බෙදී යෑම පිළිබඳව කාරක සභාව විමසීය.<br><br>මෙහිදී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කර සිටියේ වරදකාරී පාර්ශවයෙන් අයකරනු ලබන දඩ මුදල්වලින් 50% ක් ඒකාබද්ධ අරමුදලට බැර වෙන බවත්, ඉතිරි 50% න් 5% ක් සුබසාධක අරමුදලට බැර වෙන බවත්, ඉතිරි 45% ත්‍යාග අරමුදල සඳහා වෙන් කිරීමටත් යෝජිත සංශෝධනවල ඇතුළත් කර ඇති බවත් ය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | ත්‍යාග අරමුදලට බැරවෙන ප්‍රතිශතය ඉතා අධික බවත් එම ප්‍රතිශතය තවදුරටත් අඩු විය යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය.<br><br>__නිර්දේශ__<br>ශ්‍රී ලංකා රේගු ආඥා පනතේ යෝජිත සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පතෙහි පිටපතක් සතියක් තුළ කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>තවද, රේගු ආඥා පනත සංශෝධනයේ දී පහත සඳහන් කරුණු පිළිබඳව ද අවධානය යොමු කරමින් අදාළ සංශෝධන සිදු කරන ලෙස කාරක සභාව විසින් වැඩිදුරටත් නිර්දේශ කරන ලදි.<br><br>i. ආනයන හා අපනයන පාලනය සම්බන්ධ අණ පනත්, රෙගුලාසි හා රේගු ආඥා පනත් ආදී නීතිමය තත්වයන් යටතේ ආනයන/අපනයන කටයුතු වලදී වරදකාරී පාර්ශවයන්ගෙන් දණ්ඩන වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් ශ්‍රී ලංකා රේගුව මගින් අයකර ගනු ලබන මුදල්වලින් සාමාන්‍ය තත්ත්ව යටතේ දී රජයට අය විය යුතුව පැවැති පූර්ණ බදු මුදල් ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදලින් යම් ප්‍රතිශතාත්මක මුදලක් ශ්‍රී ලංකා රේගුවේ ත්‍යාග අරමුදල හා සුබ සාධක අරමුදල සඳහා වෙන් කිරීම යෝග්‍ය බව පෙන්වා දුන් කාරක සභාව එම කරුණ සැලකිල්ලට ගෙන රේගු ආඥා පනත |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු බව, සහ<br><br>ii. ශ්‍රී ලංකා රේගුවේ සේවය කරන වාප්පු ලිපිකරුවන්ගේ (wharf clerk) ඇතැම් වංචනික ක්‍රියා නිසා රජයට බදු මුදල් අහිමි වන බව පෙන්වා දුන් කාරක සභාව එම තත්වය වළක්වා ගැනීම සඳහා පවතින නෛතික ප්‍රතිපාදන සංශෝධනය කිරීම කළ යුතු බව<br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF6/4/COPA/General/2023 දරන 2024.03.05 දිනැති ලිපිය මඟින් පනත් කෙටුම්පත ඉදිරිපත් කර ඇත.** |
| 04 | <u>අවම විකල්ප බදු ප්‍රතිපත්තිය</u> | රටවල් කිහිපයක් හැර ලෝකයේ සියලුම රටවල් අයකර ගනු ලබන අවම විකල්ප බදු ප්‍රතිපත්තිය (minimum alternate tax) ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක නොකර සිටීම නිසා රජයට විශාල බදු මුදලක් අහිමි වන බව ප්‍රකාශ කළ කාරක සභාව ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් විසින් ප්‍රතිපත්තිමය තීරණ නොගැනීම සම්බන්ධයෙන් සිය අප්‍රසාදය ප්‍රකාශ කළේය. |
| 05 | <u>තාවකාලික එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචිය</u> | තාවකාලික වැට් (VAT) ලියාපදිංචිය මගින් රජයට විශාල බදු ආදායමක් අහිමි වන බව නිරීක්ෂණය කළ කාරක සභාව ස්ථිර VAT ලියාපදිංචියට හිමිකම් නොමැති ආයතන වෙත තාවකාලික VAT අංක ලබා දෙන බවත් පෙන්වා දුන්නේය.<br><br><u>නිර්දේශ</u> |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | ඒ පිළිබඳව අධ්‍යයනය කර සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කරන ලෙසත්, තාවකාලික VAT අංක ලියාපදිංචිය අත්හිටුවීමට ඇති හැකියාව සොයා බලා එය නැවැත්වීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලෙසත්, එසේ ලියාපදිංචිය නැවැත්වීමට හැකියාවක් නොමැති නම් ඒ පිළිබඳව හේතු ඇතුළත් වාර්තාවක් 2024.02.22 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF5/ PA/ 04/ 2024/ Tax දරන 2024.03.11 දිනැති ලිපිය මඟින් තාවකාලික වැට් ලියාපදංචිය ලබා දීම මගින් විශාල ආදායමක් අහිමි වීම සම්බන්ධයෙන් අධ්‍යනය කර සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමට පත් කර ඇති කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 06 | **<u>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS දත්ත පද්ධතිය (Revenue Administration Management Information System)</u>** | බදු සම්බන්ධ අණ පනත් වල ව්‍යූහාත්මක සංශෝධනයන් සිදු කළ හොත් ඒ සඳහා වෙනස් කිරීමේ ඉල්ලීම් (Change Request) සිදු කළ යුතු වුවද බදු ප්‍රතිශත වල සිදුවන වෙනස්කම් දත්ත පද්ධතියට අදාළ කර ගත හැකි බව මෙහි දී ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. එසේම RAMIS මෘදුකාංගයේ ගැටළු සහගත තත්වයන්ට වඩා සන්නිවේදනයේ දූර්වලතා ඇති බවත් මෙහි දී අනාවරණය විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | එසේම, මෙම දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාළව නිලධාරීන් දක්වන මැලිකම සහ, රුපියල් බිලියන 4 කින් අවසන් කිරීමට අපේක්ෂිත RAMIS දත්ත පද්ධතිය සඳහා මේ වන විට රුපියල් බිලියන 16 කට ආසන්න මුදලක් වැය කර තිබුණ ද, මේ වන විටත් එය නිසි ලෙස ක්‍රියාත්මක කළ නොහැකි වීම පිළිබඳව මෙන්ම මෙම දත්ත පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා වූ ගිවිසුම විගණකාධිපතිවරයා වෙත හෝ පරීක්ෂා කර බැලීමේ ප්‍රවේශය ලබා නොදීම පිළිබඳව කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය.<br><br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරිය ප්‍රකාශ කළේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් මත RAMIS දත්ත පද්ධතියේ අඩුපාඩු හඳුනාගැනීමට සහ ඒ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා විවිධ මට්ටම්වල නිලධාරින්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කර ඇති බවත් එම යෝජනා ඉදිරිපත් කළ පසු අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බවත්ය.<br><br>**<u>නිර්දේශ</u>**<br>RAMIS දත්ත පද්ධතිය සම්බන්ධයෙන් 2023.01.24 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පත් කළ තාක්ෂණික කමිටු 1 විසින් පිළියෙළ කළ වාර්තාවේ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා එම කමිටුව නැවත කැඳවා අවශ්‍ය කරුණු සාකච්ඡා කොට එහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් 2024.02.22 ට පෙර කාරක |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | සභාව වෙත ලබා දෙන ලෙසත්; සහ RAMIS දත්ත පද්ධතිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් ලබා දුන් වාර්තාවේ පිටපතක් කාරක සභාව වෙත ලබා දෙන ලෙසත්;<br><br>කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/04/COPA General 2023 දරන 2024.05.08 දිනැති ලිපිය මඟින් RAMIS දත්ත පද්ධතිය සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ තාක්ෂණික කමිටු 1 වාර්තාවේ අඩංගු ක්‍රියාකාරී අයිතමයන්ට අදාළව ප්‍රගතිය හා කාලරාමුව ද මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF6/4/COPA/ General/2023 දරන 2024.03.05 දරන ලිපිය මගින් RAMIS දත්ත පද්ධතිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් ලබා දුන් වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කර ඇත.** |
| 07 | <u>බදු පරිපාලනය විධිමත් කිරීම</u> | බදු පරිපාලනය ඵලදායි ලෙස සිදු කිරීම හරහා ආර්ථික අර්බුදයට විසඳුම් ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. ඒ සඳහා ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව ආදායම් වැඩි කර ගැනීම සඳහා වෙනම ඒකකයක් මුදල්, |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ පරිපාලනය යටතේ පිහිටුවීමටත් කාරක සභාව විසින් යෝජනා කරන ලදි. |
| 08 | <u>ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කිරීම</u> | <u>නිර්දේශ</u><br>ශ්‍රී ලංකා රේගුවේ සියලුම නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍ර අනිවාර්යෙන් භාවිත කළ යුතු බවත්, යම් වැටලීම් අවස්ථාවක් හෝ එවැනි යම් රාජකාරී කටයුත්තක් සඳහා සහභාගි වීමට අවශ්‍ය විටෙක එසේ භාවිත කිරීම අපහසු වන්නේ නම් ඒ පිළිබඳව අදාළ බලධාරීන් විධිමත් පරිදි දැනුවත් කර සුදුසු පරිදි කටයුතු කළ යුතු බවත් කාරක සභාව විසින් ශ්‍රී ලංකා රේගුව වෙත නිර්දේශ කරන ලදි.<br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF6/4/COPA/ General/2023 දරන 2024.03.05 දරන ලිපිය මගින් ශ්‍රී ලංකා රේගුවේ වෘත්තීය සන්ධානය විසින් ඔවුන්ගේ වෘත්තීය ගැටළු සම්බන්ධයෙන් සිදු කළ වෘත්තීය ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ කරුණු සලකා බලා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය පිළිබඳ සාකච්ඡා කර ප්‍රායෝගික විසඳුම් පිළිබඳ තීරණය කළ යුතු බව දක්වා ඇත.** |
| 09 | <u>මත්පැන් බෝතල් සඳහා ව්‍යාජ ස්ටිකර් භාවිතය</u> | මත්පැන් බෝතල්වල ව්‍යාජ ස්ටිකර් භාවිත කිරීමේ සිදුවීම සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව මට්ටමින් පරීක්ෂණ පැවැත්වෙන බව කාරක සභාව හමුවේ අනාවරණය විය. එසේම මේ සම්බන්ධයෙන් පරීක්ෂණ සඳහා රජයේ රස |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | පරීක්ෂක දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ ආයතනයේ සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගන්නා බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. ඒ අනුව ඉදිරි මාස 6 තුළ ස්ටිකර්වල සම්පූර්ණ වෙනස් කිරීමක් සිදු කිරීමට අපේක්ෂා කරන බව ද මෙහි දී ප්‍රකාශ විය.<br><br>ස්ටිකර් ලබා දුන් පසු අදාළ බදු අය කළ නිෂ්පාදන තොග ප්‍රමාණය සම්බන්ධයෙන් ස්ටිකර් සක්‍රීය කිරීමේ (Activation) වගකීම එම බලපත්‍රලාභි ආයතනයේ සිටින සුරාබදු නිලධාරියාගේ සහ එම මත්පැන් නිෂ්පාදකයාගේ වගකීම බවත් ඔවුන් එසේ නොකිරීම බරපතල වංචාවක් සිදු කිරීමක් බවත්, ඔවුන් ඒ සම්බන්ධයෙන් නිසි දඬුවමකට යටත් කළ යුතු බවත් කාරක සභාව පෙන්වා දුන්නේය. එසේම, ව්‍යාජ ස්ටිකර් භාවිතා කළ මත්පැන් නිෂ්පාදන ආයතන වෙතින් විශාල දඩ මුදලක් අයකර ගෙන ඇති බවත් පරීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතින බවත් ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br>මත් පැන් බෝතල් සඳහා ව්‍යාජ ස්ටිකර් භාවිතය වැළැක්වීම සඳහා අදාළ මත්පැන් නිෂ්පාදනාගාර තුළ CCTV කැමරා පද්ධති ස්ථාපනය කර එය දුරස්ථව අධීක්ෂණය කිරීම සඳහා සම්බන්ධතාව සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලෙස අදාළ නිෂ්පාදනාගාර අයත් සමාගම් වෙත දන්වන ලෙසත්, ඒ අනුව CCTV කැමරා පද්ධතියක් මගින් සියලු මත්පැන් නිෂ්පාදනාගාර අධීක්ෂණය කිරීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව විසින් සුරාබදු |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කරන ලදි.<br><br>**සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ 2024.05.07 දිනැති අංක ED/11/2/COPA -2024 ලිපිය මගින් CCTV කැමරා පද්ධතිය සවි කිරීමේ ව්‍යාපෘති යෝජනාවේ කෙටුම්පත ඉදිරිපත් කර ඇත.**<br><br>ව්‍යාජ ස්ටිකර් භාවිත කිරීමේ වංචාව සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් සුරාබදු කොමසාරිස් වෙත දන්වා යවන ලිපියකින් ව්‍යාජ ස්ටිකර් භාවිතා කළ ආයතනවල බලපත්‍ර අහෝසි කිරීම, සුරාබදු නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීම, මත් පැන් නිෂ්පාදන ආයතන CCTV කැමරා පද්ධති හා සම්බන්ධ කිරීම,මත් පැන් බෝතල් සඳහා යොදා ගනු ලබන ස්ටිකර් සක්‍රීය කිරීම (Activation), එම ස්ටිකර් වල අඩංගු ආරක්ෂිත ලකුණු කිහිපයක් හෝ මහජනයා වෙත ප්‍රකාශ කිරීම වැනි නිර්දේශ දන්වා යැවූ බව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

***(2021 හා 2022 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පරීක්ෂාව)***

**විමර්ශනය කරන ලද දිනය - 2024 ජනවාරි 24**

**කැඳවන ලද ආයතන-**

- ❖ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| 01 | **<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2021 සහ 2022 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා</u>** | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2021 සහ 2022 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණද 2020 වර්ෂයෙන් පසු වාර්ෂික වාර්තා කොමිෂන් සභා නිල වෙබ් අඩවියට ඇතුළත් කර නොතිබීම පිළිබඳව කාරක සභාව නිරීක්ෂණය කළේය. ඉහත වාර්ෂික වාර්තා කොමිෂන් සභා නිල වෙබ් අඩවියට ඇතුළත් කිරීමට අතපසුවීමක් වී ඇති බවත් ඒවා උඩුගත කිරීමට කටයුතු කරන බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) ප්‍රකාශ කළාය. |
| 02 | **<u>2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාවෙන් කොමිෂන් සභාවේ කාර්යසාධනය මැනීමට ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොතිබීම.</u>** | (i) කොමිෂන් සභාවේ ආයතන අංශය, විනය අංශය, පත්කිරීම් අංශය හා උසස් කිරීම් අංශය විසින් 2021 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් සංඛ්‍යාව පමණක් කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ අංශයට ලැබුණු පැමිණිලි (කාර්යයන්) සංඛ්‍යාව, එම පැමිණිලි තුළින් නිම කළ ප්‍රමාණය සහ තවදුරටත් ඉතිරිව පවතින ප්‍රමාණය යන තොරතුරු ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව, අදාළ වාර්තාව තුළ 2021 වර්ෂයේ කාර්යසාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කර නොතිබුණ බව සඳහන් විය. 2022 කාර්යසාධන වාර්තාවේ ද මෙලෙසම දක්වා ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.<br>2023 වර්ෂයේ සැප්තැම්බර් මස සිට ඉදිරිපත් කරනු ලබන කාර්යසාධන වාර්තාවල කටයුතු අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව හා කටයුතු කරමින් පවතින |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු වෙන් වෙන්ව ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතින බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය.<br>(ii) සමාලෝචිත වර්ෂයේ අභියාචන අංශයට ලැබුණු අභියාචනා ප්‍රමාණය ප්‍රමාණාත්මකව දක්වා තිබුණද, නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවූ අභියාචනා ගණන සහ කටයුතු නිම කළ අභියාචනා ප්‍රමාණය ඉදිරිපත් කිරීමේදී එය සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයන්හි අභියාචනා ප්‍රමාණද ඇතුළත්ව ඉදිරිපත් කර තිබුණු බව (කාල විශ්ලේෂණයක් නොමැතිව) මෙහිදී සඳහන් විය. එම හේතුවෙන් එම අංශයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන මට්ටම නිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණ බවත් 2022 කාර්යසාධන වාර්තාවේද මෙලෙසම දක්වා ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.<br>පෙර වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හිදී ලැබෙන පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාසයන්හිදී සිදු කරන බැවින් හා අභියාචනා සඳහා වාර්තා කැඳවන ආයතන විසින් ඊට අදාළ නිසි ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීම තුළ මෙවැනි ගැටළු උද්ගත වන බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | ආයතන විසින් පැමිණිලි සඳහා ප්‍රතිචාර නොදැක්වීම/ ප්‍රතිචාර දැක්වීමේ මන්දගාමී ස්වභාවය පිළිබඳව ජනාධිපති ලේකම්වරයා වෙත ලිඛිතව දැනුම් දී ඇති බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. ආයතන විසින් පැමිණිලි සඳහා නිසි කාලය තුළ ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් අදාළ පැමිණිල්ල සිදු කරන පාර්ශ්වයන් අගතියට පත් වන බව නිරීක්ෂණය කළ කාරක සභාව ඒ පිළිබඳ කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම කාරක සභාව අවධාරණය කළේය.<br><br><u>**නිර්දේශ**</u><br>මේ අනුව, වර්තමානය වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිලි පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කොමිෂන් සභාව මගින් කැඳවා ඇති වාර්තා සැපයීමට ප්‍රමාද වී ඇති ආයතන (අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ආදී අනෙකුත් ආයතන/ පුද්ගලයන්) ලැයිස්තුවක් ප්‍රමාද වී ඇති කාල වකවානු සහිතව 2024.02.22 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නියෝග කළේය.<br><br>**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ACC/R01/AUDIT/03/202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ලබා දී ඇත.** |
| 03 | <u>අභ්‍යන්තර විගණනය</u> | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සුදුසු විගණකවරයකු පත් කළ යුතු වුවද |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක තනතුර 2023 ඔක්තෝබර් 03 දින සිට පුරප්පාඩුව පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළේය. කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණකවරයකු ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. |
| 04 | <u>කාර්ය මණ්ඩල තොරතුරු</u> | කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 238 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 219 ක් වූයෙන් ජ්‍යෝෂ්ඨ මට්ටමේ 7ක් ද, තෘතීක මට්ටමේ 4ක් ද, ද්විතීය මට්ටමේ 2 ක් ද හා ප්‍රාථමික මට්ටමේ 6 ක් ද ලෙස පුරප්පාඩු 19 ක් පැවතුණි. තවද, සේවා අවශ්‍යතාවය සලකා බලා අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>ජාතික පොලිස් කොමිෂන් සභාව ස්ථාපිත කිරීමෙන් පසු 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර අනුමත කර ගන්නා ලද බව ද බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇති බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. |
| 05 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XI පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව පූර්ණ කාලීන සේවයක් | 2023 මැයි 24 දින පරිපාලන නිලධාරි තනතුර සඳහා ස්ථිර පත්වීමක් සිදුකර තිබුණු අතර 2023 අගෝස්තු 02 දින |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | අවශ්‍ය වන තනතුරකට නිත්‍ය පත්වීමක් සිදුකළ යුතු වීම සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළකර තිබූ කාර්ය පටිපාටික රීති 139 වගන්තිය අනුව වැඩ බැලීමේ හෝ රාජකාරි ඉටුකිරීමේ පත්කිරීමක් වසරක උපරිම කාලයකට සීමාවිය යුතු බව දක්වා තිබුණද 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාව අනුව එම නීති රීති වලට පටහැනිව කටයුතු කර තිබීම.<br><br>ඒ අනුව, 2019 මාර්තු 01 දින සිට පුරප්පාඩුව පැවති කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරි තනතුර සඳහා විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින දක්වා එනම් වසර 4 ක කාලයක සිට වැඩ බැලීමේ පදනම මතද, 2021 දෙසැම්බර් 09 දින සිට පුරප්පාඩුව පැවති ලේකම් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත හා වැඩ බැලීමේ පදනම මතද නිලධාරීන් පත්කර තිබුණි. | ලේකම් තනතුර සඳහා ස්ථිර පත්වීමක් සිදුකර තිබුණි.<br><br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (4) ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලේකම්වරයෙකු පත්කර ගැනීම සඳහා කොමිෂන් සභාවට බලතල ඇති බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය.<br><br>කාර්ය පටිපාටික රීති අනුව නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් වසර 5ක් තුළ සිදු කළ යුතු වුවද රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඊට පටහැනිව කටයුතු කර ඇති බව ද කාරක සභාව නිරීක්ෂණය කළේය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් නොවන බවත්, යම් නිලධාරියෙකු විසින් ඉල්ලීමක් සිදු කළහොත් කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථානමාරු විය හැකි බවත් ප්‍ර.ග.නි සඳහන් කළාය. ස්වාධීන කොමිෂන් සභා ස්ථානමාරු පටිපාටිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා නිලධාරීන් සඳහා කොමිෂන් සභාවේ අභිමතය පරිදි ස්ථානමාරු ක්‍රියාත්මක නොකර සිටිය හැකි බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. |
| 06 | ***<u>2016 ජූලි 08 වැනි දින පැවති පූර්ව ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම.</u>***<br>**<u>නියෝග අංක 07</u>**<br><br>2010, 2011 හා 2012 වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කර නොමැති අතර 2016 වර්ෂයේ | 2020 අගෝස්තු 28 දින නිකුත් කර තිබුණු අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව වාර්ෂිකව ක්‍රියාකාරී සැලැසුම් සකස්කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය දැක්වෙන ප්‍රගති වාර්තා පිළියෙල කර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇති බව කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රකාශ කර තිබූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට අනුව ප්‍රගති සමාලෝචනය හා ප්‍රගති වාර්තා කිරීම් සිදුවිය යුතු බව. | ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සෑම වසරකම සැප්තැම්බර් මස 30 වනදාට සකස් කරන බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. කෙසේ වුවද, අමාත්‍යාංශ වලින් ලැබෙන පැමිණිලි විසඳීමේ ප්‍රගතිය, අදාළ ආයතන විසින් ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමාණය මත තීරණය වන බැවින්, නිශ්චිතව දැක්විය නොහැකි බවත් ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටු කරන ලද කාර්ය ප්‍රමාණය දළ වශයෙන් ප්‍රතිශතාත්මකව දක්වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළාය. |
| 07 | <u>**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු**</u> | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරීන් පමණක් බඳවා නොගෙන ඒ සඳහා අනෙකුත් දීපව්‍යාප්ත සේවාවලින්ද නියෝජනයක් වන පරිදි නිලධාරීන් බඳවා ගත යුතු බවට කාරක සභාව නිර්දේශ කළේය. එවිට රාජ්‍ය සේවයේ විවිධ සේවාවන්/ ක්ෂේත්‍රයන් හි නිලධාරීන් නියෝජනය වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය සැකසීම තුළින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විවිධ ක්ෂේත්‍රයන්හි නිලධාරීන් විසින් යොමු කරනු ලබන පත්වීම් ලබාදීම හා උසස් කිරීම ආදී විවිධ ගැටළු සඳහා ප්‍රායෝගිකව සාර්ථක විසඳුම් ලබා දීමට හැකි වන බව ද කාරක සභාව පෙන්වා දුන්නේය. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ පවතින ආයතනික ව්‍යුහය වෙනස් කළ යුතු බවද කාරක සභාව වැඩිදුරටත් යෝජනා කළේය.<br><br><u>**නිර්දේශ**</u><br>පසුගිය වර්ෂ 5හි රාජ්‍ය සේවයේ සියලුම සේවාවලින් ලැබෙන පැමිණිලි පිළිබඳව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | විශ්ලේෂණය කර/ වර්ගීකරණය කර ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන සහිත වාර්තාවක් 2024.02.22 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ACC/R01/AUDIT/03/202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් ඒක් ඒක් වර්ෂ සඳහා අදාළ වාර්තා ලබා දී ඇත.**<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබා දෙන තීන්දු/ තීරණ වඩා සාධාරණ හා ඵලදායී කිරීම සඳහා දීපව්‍යාප්ත සේවා හා අනෙකුත් අදාළ සේවා වලින් නිලධාරී නියෝජනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාවට (Cadre) ඇතුළත් කර ගන්නා ලෙසත්, එසේ කළ නොහැකි නම් උපදේශක මට්ටමින් හෝ සියලු සේවාවන්ගේ නියෝජනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් ඒ සඳහා අවශ්‍ය තනතුරු සංඛ්‍යාව පිළිබඳ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඊට අදාළ යෝජනා පිළිබඳ 2024.01.31 දිනට පෙර කාරක සභාව වෙත වාර්තාවක් ලබාදෙන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ACC/R01/AUDIT/03/202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් මෙම කරුණ සම්බන්ධව රාජ්‍ය සේවා** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | **කොමිෂන් සභාවේ පිළිතුරු දැක්වීම ලබා දී ඇත.** |
| 08 | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව තිරසර සංවර්ධන අරමුණු, ජාතික සංවර්ධන උපායමාර්ග සමග එක්ව පෙළ ගැස්වීම සිදු කළ යුතු වුවත් 2021 හා 2022 වර්ෂවලට අදාළව පිළියෙල කර තිබුණු කාර්යසාධන වාර්තාවල තිරසර සංවර්ධන අරමුණු අදාළ නොවන බව දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන වාර්තා සඳහා පිළිතුරු ලෙස කොමිෂන් සභාවට තිරසර සංවර්ධන අරමුණු අදාළ නොවන බව අවස්ථා කිහිපයකදීම දන්වා තිබුණ ද අදාළ චක්‍රලේඛය නිකුත් කර වසර 07 ක් ගත වීමෙන් පසු තිරසර සංවර්ධන අරමුණු 05 ක් 2024 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු බවත්, 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ සඳහන් අරමුණු කරා ළඟාවීමට මේ වන විට කටයුතු ආරම්භ කළ යුතු වුවද, එවැනි සැලසුමක් හා සූදානමක් තිබේද යන්න විගණනයට නිශ්චය කළ නොහැකි වී ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම, සංවර්ධන වැඩසටහන් සහ දැනුවත් කිරීම් හා මහජන සේවාවන් පිළිබඳව ක්‍රියා කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කළ යුතු බව ද ඒ සඳහා ආයතනය තුළ අංශයක් ස්ථාපිත කර මෙම තිරසර සංවර්ධන අරමුණු සමාලෝචනය කර ආයතනයට අදාළ අරමුණු හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු බව ද කාරක සභාව අවධාරණය කළේය.<br><br><br>**<u>නිර්දේශ</u>**<br>i. සේවා ව්‍යවස්ථා අනුමත කිරීම හා බඳවා ගැනීමේ මාර්ගෝපදේශ සකස් කිරීමේදී කාලීනව සිදු කළ යුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් පුරෝකථනය කර ඒ අනුව එම පටිපාටි සකස් කිරීමට හා ඒ සම්බන්ධ අධීක්ෂණයක් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පියවර ගත යුතු බව මෙහිදී කාරක සභාව නිර්දේශ කළේය.<br><br>ii. එක් එක් ආයතන වලින් පසුගිය වසර 5 තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි විශ්ලේෂණය කර, රාජ්‍ය සේවය තුළ හඳුනා ගත් ප්‍රමුඛ ප්‍රශ්න පිළිබඳ වාර්තාවක් 2024.02.22 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ ACC/ R01/ AUDIT/ 03/ 202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර ඇත.**<br><br>iii. එක් එක් ආයතනවල බඳවා ගැනීම් අත්හිටුවමින් අධිකරණයෙන් ලබා දී ඇති තීන්දු (Stay Orders) පිළිබඳ වාර්තාවක් 2024.02.22 දිනට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ACC/R01/ AUDIT/03/202 හා 2024 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ලබා දී ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| 09 | **<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අභියාචන.</u>**<br>2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි 237 වැනි වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව වෙත යොමු කළ අභියාචනයක් කොමිෂන් සභාව වෙත ලැබී, ස්ථාන මාරු සම්බන්ධයෙන් දින 15 ක් හා උසස් කිරීම් සම්බන්ධයෙන් දින 45 ක් ඇතුළත කොමිෂන් සභාව විසින් තීරණයක් ගනු ලැබිය යුතු වේ. එසේ වුවත් පරීක්ෂා කරන ලද අභියාචන ලිපිගොනු 21 න් ස්ථාන මාරු අභියාචනා 07 ක් සඳහා තීරණ ලබා දීමට දින 45 සිට දින 1,504 දක්වා කාලයක් ගත කර තිබුණු අතර එක් උසස් කිරීමේ අභියාචනයක් ලැබී වසර 2 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද විගණිත දිනය වූ 2023 පෙබරවාරි 20 දින වන විටත් ඒ සඳහා තීරණයක් ලබා දී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවට ලක් කරන ලද අභියාචනා ලිපිගොනු 10 කින් ලිපිගොනු 04 කට අදාළ තීරණ 2024 ජනවාරි 22 දින වන විටත් ලබා දී නොතිබුණු අතර තීරණ ලබා දී තිබූ ලිපිගොනු 06 ක් සඳහා තීරණ ලබා දීමට අවුරුදු 02 සිට අවුරුදු 08 ක කාලයක් ගත කර තිබුණි.<br><br>ඉහත කාර්ය පටිපාටික රීති අවලංගු කර 2022 දෙසැම්බර් 14 දිනැතිව නිකුත් කර ඇති අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීතීන්හි උසස් කිරීම් සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සඳහා තීරණ ලබා දීමේ කාලසීමාවක් දක්වා නොතිබුණි.<br><br>2022 දෙසැම්බර් 14 දිනැතිව නිකුත් කර ඇති අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීතීන් සංශෝධනය කිරීමට වර්තමානයේ කොමිෂන් සභාව තීරණය කර ඇති බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. |
| 10 | **<u>විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වූ නිලධාරීන්.</u>** | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වූ නිලධාරීන් කොපමණද යන්න කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය මගින් ලබා ගැනීමේ |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|
| | | පහසුකමක් නොතිබුණි. පරීක්ෂණයට භාජනය කළ ලිපිගොනු වලින් විනය පරීක්ෂණ ක්‍රියාමාර්ගවලට අදාල කටයුතු අවසන් කිරීමට වැඩි කාලයක් ගතවීම හේතුවෙන් ඇතැම් චූදිත නිලධාරීන්ට විශ්‍රාම වැටුප් හා අනෙකුත් විශ්‍රාම ප්‍රතිලාභ ලැබීම විනය පරීක්ෂණ කටයුතු අවසන් වී විනය නියෝග ලබා දෙන තෙක් වසර ගණනක් ප්‍රමාදවී තිබුණු අවස්ථාවන්ද කාරක සභාව විසින් නිරීක්ෂණය කළේය.<br><br>ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව මෙම විනය පරීක්ෂණ මණ්ඩලය පත් කර ඇති බව ද මෙම නිලධාරීන්ට විනය පරීක්ෂණ කටයුතු භාරදී නොමැත්තේ මේ වන තෙක් එවැනි අවස්ථා උදා නොවුණු නිසා බව ද ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය.<br><br>නිලධාරීන් සම්බන්ධ විනය ගැටළු පිළිබඳ කටයුතු කිරීමේ දී කොමිෂන් සභාව විසින් වෙනත් රජයේ ආයතන වෙතින් විටින් විට තොරතුරු කැඳවනු ලබන අතර, මෙලෙස කැඳවන තොරතුරු එම ආයතන විසින් ලබාදීමට ප්‍රමාද වන අවස්ථාවලදී සිහි කැඳවීම් ලිපි ද යවා තිබූ බවත්, එහෙත් මෙම සිහිකැඳවීම් යැවීම සියලුම ලිපිගොනුවලට පොදු වූ නිශ්චිත කාල සීමාවන් අනුව සිදු කර නොතිබුණු බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>විනය ක්‍රියාමාර්ග ගැනීමේදී එහි එක් එක් පියවරයන් සඳහා ගතවන කාල සීමා එකිනෙකට වෙනස් වන බැවින් මෙලෙස සිහි කැඳවීමේ ලිපි යොමු කිරීමේ වෙනස් කාලසීමාවන් පවතින බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| | | සිහිකැඳවීම් ලිපි යොමු කිරීම සියලුම ලිපිගොනුවලට පොදු වූ නිශ්චිත කාල සීමාවන් අනුව සිදු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති තුළට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. |
| 11 | **<u>යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා පරිගණක ජාලගත ලේඛන කළමනාකරණ පද්ධතිය යොදා ගැනීම.</u>** | කොමිෂන් සභාව විසින් නිර්මාණය කර තිබූ මෙම පද්ධතිය මගින් කාර්යාලය වෙත ලැබෙන ලිපියක / වර්තමාන තත්ත්වය (Present status) එනම් එය කුමන අංශයේ පවතින්නේද යන්න පරීක්ෂා කළ හැකිව තිබුණ නමුත් එකම ලිපිගොනුවකට අදාළව අවස්ථාවන් කිහිපයකදී ලැබෙන ලිපි සඳහා මෙම පද්ධතිය මගින් වෙන වෙනම අංකයන් ලබා දීම නිසා එම ලිපිගොනු වල ප්‍රගතිය මේ මගින් පරීක්ෂා කළ නොහැකි වන බව කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දිනපතා ලැබෙන 200කට ආසන්න ලිපි කළමනාකරණය සඳහා 2012 වර්ෂයේදී සකස් කරන ලද මෙම පරිගණක ජාලගත ලේඛන කළමනාකරණ පද්ධතිය මගින් අදාළ ලිපි ඒ ඒ දිනට කුමන අංශයේ පවතීද යන්න බලා ගැනීමට හැකි බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. කෙසේවුවද, මෙම ජාලගත ලේඛන කළමනාකරණ තොරතුරු පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කර වාර්තා ලබා ගැනීමට හැකි වන ලෙස සකස් කරන ලෙස කාරක සභාව මෙහිදී යෝජනා කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|
| 12 | **<u>2023 නොවැම්බර් 30 දිනට විගණනයට ලබා දුන් එක් එක් අංශයේ නිම කිරීමට පවතින ලිපිගොනුවල කාල විශ්ලේෂණය.</u>** | 2023 නොවැම්බර් 30 දිනට විගණනයට ලබා දුන් එක් එක් අංශයේ නිම කිරීමට පවතින ලිපිගොනුවල කාල විශ්ලේෂණය සහ විගණනය වෙත 2024 ජනවාරි 12 දින ලබාදුන් කොමිෂන් සභාවේ කටයුතු කරමින් පවතින ලිපිගොනු ලේඛනය අනුව පැවති ලිපිගොනු ආරම්භ කළ වර්ෂයන් පරීක්ෂා කිරීමේදී ඉහත ලබාදුන් කාල විශ්ලේෂණය නිවැරදි නොවන බව කාරක සභාව නිරීක්ෂණය කළේය. <br><br> තවද, 2023 නොවැම්බර් 30 දිනට ලබා දුන් තොරතුරුවලට අනුව අභියාචනා අංශය, විනය අංශය හා උසස් කිරීම් අංශ සතුව කටයුතු කරගෙන යනු ලබන ගොනු සංඛ්‍යාව පිළිවෙලින් 292 ක්, 180 ක් හා 168 ක් වූ අතර එම සියලුම ගොනු වර්ෂයකට වඩා අඩු කාලයකට අදාළව වන බවත්, 2024 ජනවාරි 12 දින ලබාදුන් තොරතුරු අනුව අභියාචනා අංශය, විනය අංශය හා උසස් කිරීම් අංශවල කටයුතු කරමින් පවතින ගොනු පිළිවෙලින් 247 ක්, 131 ක් හා 178 ක්වූ බව ද කාල විශ්ලේෂණය අනුව එම ගොනු වර්ෂ 1ට අඩු කාලයක සිට වර්ෂ 04ට වැඩි කාලයක් දක්වා පවතින බව ද කරක සභාව නිරීක්ෂණය කළේය. <br><br> අභියාචනා අංශයේ හා විනය අංශයේ ගොනු එක් එක් කාරණාව අනුව පවත්වාගෙන යන බැවින් කාල විශ්ලේෂණය වර්ෂ 4කට වැඩි විය හැකි වුවද උසස් වීමේ අංශයේ ආයතන වශයෙන් ගොනු වෙන් කර ඇති බැවින් ඉහත කාල විශ්ලේෂණයන් නිවැරදි නොවන බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළාය. |

## සූචිය

ආ

**ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**
**ආරක්ෂක අමාත්‍යාංශය**

ජ

**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

දේ

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

මු

**මුදල් අමාත්‍යාංශය**

ර

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**ශ්‍රී ලංකා රේගුව**

ස

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

## විශේෂ විමර්ශන

රාජ්‍ය ආයතනයන්හි මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ ක්‍රියාවලියෙහි වර්තමාන තත්වය සහ ඒ සම්බන්ධව පවතින ගැටළු පරීක්ෂා කිරීම

ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (NEMIS) වර්තමාන කාර්යසාධනය, ගැටළු සහ වැඩිදියුණු කිරීම් පිළිබඳ නැවත පරීක්ෂා කිරීම